

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකාවේ සමරු ශාක

BDS
BIODIVERSITY
SECRETARIAT

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

# ශ්‍රී ලංකාවේ සමරු ශාක

ටී.එම්. අනුරුද්ධ තෙන්නකෝන්
කේ. අජිත් අයි. ඩී. සිල්වා

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

දෙසැම්බර් 2016

ප්‍රථම මුද්‍රණය 2008
දෙවන මුද්‍රණය 2016

**සම්පාදනය**
ටී. එම්. අනුරුද්ධ තෙන්නකෝන්
කේ. අජිත් අයි. ඩී. සිල්වා

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල,

**ISBN 978- 955-9120-76 - 6**

**උපදෙස් හා මගපෙන්වීම**
ගාමිණී ගමගේ මහතා - අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව)
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

**කවරය සහ පරිගණක පිටු සැකසුම**
අජිත් ගුණවර්ධන - මධ්‍යම පරිසර අධිකාරිය

**කවරයේ ඡායාරූපය**
උඩුවර මහ ගස - සරත් ධර්මසිරි

**පරිගණක යතුරු ලියනය**
එල්. එච්. ටී. ඕෂරංෂ

**ඡායාරූප**
සරත් ධර්මසිරි - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
අජිත් සිල්වා සහ ටී. එම්. අනුරුද්ධ තෙන්නකෝන් - ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
මර්ල් ප්‍රනාන්දු (බැඹිබාබ් ගස)
ජගත් ගුණවර්ධන (පිලවල සියඹලාව / ඩේවිගේ බෝධිය)

**මුද්‍රණය**

EPA ADVERTISING

අංක 835/A, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

# ගරු ඇමතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සමරු ශාක ග්‍රන්ථයට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා භාග්‍යයක් ලෙස සලකමි.

ලිඛිත ඉතිහාසයක් සහිත ලොව ඉපැරණිම වෘක්ෂය පවතින රට වශයෙන් අපි ජගත් කරලියේ ඉදිරියෙන්ම සිටින්නෙමු. එසේම අප සංස්කෘතිය පුරාම පරිසරයත් එහි ගහ කොළත්, සතාසීපාවාත් නිරන්තරයෙන් බද්ධ වී පැවතීම සුවිශේෂීය ලක්ෂණයකි. ජෛව විවිධත්වයේත් ඒ හා සම්බන්ධිත සංස්කෘතික විවිධත්වයේත් තවත් පැතිකඩක් ලෙස අප සතු සමරු ශාක හැඳින්විය හැක.

සුභ මොහොතක් සනිටුහන් කිරීමේ අරමුණෙන් පැළයක් රෝපණය කිරීමේ අප ජාතිය සතු හැදියාව අද ලොව හමුවේ සාඩම්බරයෙන් කියාපෑමට මෙය කදිම උදාහරණයකැයි මා ප්‍රකාශ කරන අතර, කාලයේ වැලිතලාවට වැසීයන ඓතිහාසික කරුණු රැසක් නිහඬව කියාපාන මෙම සමරු ශාක සංරක්ෂණය කිරීම මගින් ප්‍රෞඪ ජාතියක අභිමානය ඉදිරි පරම්පරාවන්ට පහසුවෙන් සම්ප්‍රේෂණය කළහැකි මාධ්‍යයක් ලෙසද හඳුන්වනු කැමැත්තෙමි.

අතීතයේ පටන් අප රට සතුව පැවති රාජතාන්ත්‍රික සබඳතා, ආගන්තුක සත්කාර, මුහුණ දුන් ආක්‍රමණ මෙන්ම ඇදහිලි විශ්වාස ආදියෙන් අපගේ සංස්කෘතියට දායාද වූ මෙම සජීවී ස්මාරකයන් පිළිබඳ මතකය අවදිකිරීමට ගත් මේ උත්සාහය අපගේ සංස්කෘතික උරුමයන් සුරැකීමටත් ඒ පිළිබඳව දැනුවත් වීමටත් නව ආරක ප්‍රවේශයක් වන බව සතුටින් ප්‍රකාශ කරමි.

**පාඨලී චම්පික රණවක**
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය.

# ලේකම්තුමාගේ පණිවිඩය

ජෛව විවිධත්වයෙන් අප ලොව ඉදිරියෙන් සිටින රටක් වශයෙන් ප්‍රචලිතය. ජෛව විවිධත්වයේ විද්‍යාත්මක හැඩතලයන් ඓතිහාසික හා සංස්කෘතිකමය ස්වරූපයකින් ඔපමට්ටම් කළ අවස්ථාවක් ලෙස ශ්‍රී ලංකාවේ සමරු ශාක ග්‍රන්ථය දකිමි.

පරිසරයත් එහි වැදගත්කමත් අපට බොහෝ මානයන්ගෙන් විමසුමට ලක් කළ හැක. මෙම වෑයම එහි තවත් එක් ආනන්දනීය අවස්ථාවක් වන අතර පරිසරයෙන් උකහා ගත හැකි සංස්කෘතිකමය පසුබිම මත ඉතිහාසය අනාගත පරපුරට විදහා දැක්වීමේ වෙහෙසකර එහෙත් ප්‍රශංසනීය උත්සාහයක් ලෙස ශ්‍රී ලංකාවේ සමරු ශාක ග්‍රන්ථය හඳුන්වනු කැමැත්තෙමි.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය වශයෙන් අප පරිසරය සුරැකීම හා සම්බන්ධ නීති රීති රාශියක් ක්‍රියාත්මක කරයි. එහෙත් පරිසරය පිළිබඳව ගරුත්වයක් ජනිත කිරීමට එය පමණක් ප්‍රමාණවත් නොවන බව අප වටහාගෙන බොහෝ කල් ය. පරිසරයට ගරුකිරීමටත් එයින් අපට සෘජුව ලැබෙන ලාභ ප්‍රයෝජනවලට අමතරව සමාජ සාරධර්මයන් ගොඩනැගිමටත් වැඩිපුර ඇස නොගැටෙන, වැඩිපුර නොඇසෙන අපගේ යටගියාව නැවත සමාජගතකරන්නටත් ලැබෙන දායකත්වය මෙම ග්‍රන්ථයෙන් අපුරුවට විද්‍යාමාන කරයි.

ඉතිහාසය සහ අපගේ සංස්කෘතික උරුමයන් සමජයෙන් තුරන්වීමේ අවදානමේ සිටින මෙවන් අවධියක ශ්‍රී ලංකාවේ සමරු ශාක ආශ්‍රයෙන් ඒ යටගියාව සොයා යන ගමන සැබැවින්ම ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමේ යුග මෙහෙවරකි.

මෙම කාර්යයට උරදුන් සැමට මාගේ ප්‍රණාමය පුදකරමි.

**එම්. ඒ. ආර්. ඩී. ජයතිලක**
ලේකම් - පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

# පෙරවදන

ශ්‍රී ලංකාවේ ජනතාව අතීතයේ පටන් ශාක කෙරේ ලැදියාවක් හා ගෞරවයකින් සැලකූ අතර මෙය විශාල වෘක්ෂයන් කෙරේ විශේෂයෙන්ම අදාළ විය. වෘක්ෂයන්ට හානි නොකිරීම මෙන්ම ඒවා ආරක්ෂා කිරීමට කටයුතු කිරීමද මෙම චින්තනයේ ම කොටසක් විය. පැරණි වෘක්ෂ විශාල සංඛ්‍යාවක් තවමත් ශ්‍රී ලංකාව පුරාම සුරැකිව තිබෙන්නේ මෙම ආකල්පය නිසාවෙනි. ලොව පුරා ඇති වෘක්ෂයන් අතරින් දීර්ඝතම හා අඛණ්ඩම ලිඛිත ඉතිහාසයක් සහිත හෙවත් ලොව ප්‍රථම සමරු වෘක්ෂය වන ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ශ්‍රී ලංකාවේ වීම සමරු වෘක්ෂ අතරින් ඉතා වැදගත් තැනක් හිමිකර දී ඇත. ශ්‍රී මහා බෝධීන් වහන්සේ බවට වර්ධනය වූ බෝධි අංකුරය සංඝමිත්තා මෙහෙණින් වහන්සේ මෙරටට වැඩමකරලීමේ සිට මේ දක්වා අඛණ්ඩ ලිඛිත තොරතුරු මෙරට ඉතිහාසයේ සඳහන්ය. ශ්‍රී මහා බෝධියෙන් පැනනැගි අංකුර අටක් රෝපණය කිරීමෙන් ඇතිවූ අෂ්ඨ ඵල බෝධීන් වහන්සේලා මීළඟට දීර්ඝතම ඉතිහාසයකට උරුම කියන වෘක්ෂයන් වේ.

සමරු ශාකයන් හෝ සමරු වෘක්ෂයන් ගැන සඳහන් කළ පමණින් බොහෝ දෙනාගේ සිතට නැගෙනුයේ කිසියම් විශේෂිත අවස්ථාවක් හෝ කටයුත්තක් ආරම්භයේදී රෝපණය කරන ලද වෘක්ෂයන් වේ. එහෙත් මේවා සමරු වෘක්ෂයන්ගේ එක් කොටසක් පමණකි. කිසියම් ආගමික සංස්කෘතික හෝ සමාජමය වැදගත්කමක් සහිත මෙන්ම කිසියම් පුද්ගලයකුට අදාළ සිද්ධියක් හෝ පුද්ගලයකු රෝපණය කළ, සිහිවීමට රෝපණය කළ මෙන්ම කිසියම් විශේෂ සිද්ධියක් හෝ අවස්ථාවක් සමඟ බැඳුනු ඕනෑම වෘක්ෂයක් සමරු වෘක්ෂයක් ලෙස සැලකේ. ඒ අනුව සෑම සමරු ශාකයක්ම පාහේ යම් කරුණක් සිහිගන්වන සජීවී ස්මාරකයක් ලෙසද සැලකිය හැකිය. තවද සමරු වෘක්ෂයක වැදගත්කම අත්‍යවශ්‍යයෙන්ම රැඳී තිබෙන්නේ ඊට අදාළ හේතු සාධකය මත මිස එය අයත්වන ශාක විශේෂය මත නොවේ. මේ නිසා සමරු ශාකයක අගය රඳා තිබෙන්නේ ඊට බැඳුණු කරුණු මත පදනම්ව මිස ශාක විශේෂය, ශාකයේ ප්‍රමාණය හෝ ආර්ථික වටිනාකම සලකා බලා නොවීම වැදගත් ය. එහෙත් ඇතැම් සමරු ශාකවල වයස හෝ ශාක විශේෂය ද ඊට යම් වටිනාකමක් එක් කිරීමට සමත්ව ඇත.

ශ්‍රී ලංකාවේ දැනට දක්නට තිබෙන කරුණු කීපයක් විද්‍යාමාන වේ. ඇතැම් සමරු වෘක්ෂ ඉතා ප්‍රසිද්ධ හා රටපුරා ජනයා අතර ප්‍රචලිත ද වේ. මේ අතින් ද ප්‍රසිද්ධම හා අතිශය ගෞරවාදරයට පත් වෘක්ෂය ලෙස ලොව පුරා

ප්‍රචලිතව සිටින්නේ ද ශ්‍රී මහා බෝධීන් වහන්සේ ම වේ. තවත් සමරු වෘක්ෂ පිළිබඳව එම ප්‍රදේශයේ විශාල ප්‍රසිද්ධියක් තිබුන ද සමස්ත රට සැලකීමේදී වැඩි දැනුමක් නොමැත. පරකඩුවේ පිහිටි ඓතිහාසික නා වෘක්ෂය සහ පිලවල සියඹලා ගස මෙයට නිදසුන් වේ. තවත් බොහොමයක් සමරු වෘක්ෂ පිළිබඳව දන්නේ සුළු පිරිසක් පමණකි. මෙවැනි වැඩි ප්‍රසිද්ධියක් නොමැති ඇතැම් සමරු ශාක ආරක්ෂා කිරීමේදී හඳුනාගැනීමේ ගැටළු ඇතිකර තිබේ. දැනට නීතියෙන් රැකවරණය ලැබී ඇති එහෙත් නිශ්චිතවම හඳුනා නොගත් ගිං ගඟ අසල ඇති නුග රුක මෙයට හොඳම නිදසුනකි.

අතීතයේ පටන් මේ වනතුරුත් බොහෝ සමරු වෘක්ෂ ආරක්ෂාකාරී ව රැකබලා ගැනීමට ජනතාව පෙලඹවීමට ප්‍රධානතම හේතුව වූයේ එම ශාකයේ විශාලත්වය වැනි හේතු මත රුක ගැනීම මෙන්ම ඒ හා බැඳුනු සිද්ධිය හෝ එහි ආගමික, සංස්කෘතික හෝ සමාජමය වටිනාකම මත එය තම උරුමයේ කොටසක් ලෙස ජනතාවගේ සැලකිලි ලැබීම ය. එහෙත් මෑත කාලයේදී ඇතැම් නිලධාරීන් විසින් මෙවැනි කරුණු ගැන කිසිදු තැකීමක් නොකොට සමරු වෘක්ෂ විනාශ කළ අවස්ථා ද ඇත. මුළු මහත් ශ්‍රී ලංකාව පුරාම ප්‍රසිද්ධ දෙනිපිටියේ නුග ගස 2001 අග භාගයේ දී කපා දැමීම මෙයට ඇති මෑත කාලීන නිදසුනකි. ප්‍රසිද්ධිය හෝ ජනතාවගේ දැනුම හෝ සැලකිල්ල පමණක් සමරු ශාකවල ආරක්ෂාවට ප්‍රමාණවත් නොවන බැව් පෙන්වන නිදසුනක් ලෙසට ද දෙනිපිටියේ නුග රුක සැලකිය හැකිය.

ඇතැම් අවස්ථාවලදී සමරු වෘක්ෂයක ඇති ප්‍රසිද්ධිය හා වටිනාකම එහි විනාශයට ද ප්‍රධාන සාධකයක් වීමට ඉඩ තිබේ. උග්ගල් කල්තොට තිබී දැනට විනාශ වී ඇති මල් මදාර වෘක්ෂය මෙයට නිදසුනකි. එම ගසේ සියළුම කොටස්වල ඇති ඖෂධීය වටිනාකම නිසා එහි පොතු ගසා ගැනීම හා අතු කපා ගැනීම නිසා නීතියෙන් ද ආරක්ෂිතව තිබු මෙම ඓතිහාසික වෘක්ෂය 1960 දශකයේ දී විනාශයට පත් වූ බවට තොරතුරු තිබේ. මෙම ප්‍රදේශයට නුදුරින් පිහිටි හම්බෙගමුවේ ඓතිහාසික මදාරා ගසින් ද පොතු කපා ගැනීම හා අතු කැබලි ලබාගැනීම නිසා දැනට අනතුරට ලක්ව ඇත. ඖෂධ සඳහා පොතු ලබාගැනීම යෝධ පුස්වැල් මුහුණ දෙන ප්‍රධානතම තර්ජනයකි.

මේ නිසා සමරු ශාකවල වටිනාකම හා එමගින් ඒවා මතු පරපුර වෙනුවෙන් රැක ගැනීමේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම කඩිනම් හා අත්‍යවශ්‍ය කරුණක් ව තිබේ. යම් ගසක ඓතිහාසික පසුබිම ගැන ඇති දැනුවත් භාවය ඒ අවස්ථාවල සමරු වෘක්ෂ රැකගැනීමට ජනතාව ඉදිරිපත්

වී තිබේ. පරකඩුවේ ඇති නා වෘක්ෂය වෙනුවෙන් ජනතාව ඉදිරිපත් වීම මෙයට ඇති මෑතම නිදසුනයි.

කොළඹ අධිකරණ භූමියේ පිහිටි නුග වෘක්ෂය රැක ගැනීමට නීතීඥවරුන් ඉදිරිපත් වීම මෙවැනි තවත් මෑත නිදසුනක් වේ. ශ්‍රී ලංකාවේ සමරු ශාක පිළිබඳව ප්‍රථම ප්‍රකාශනය වන මෙම ග්‍රන්ථය ද මේ සඳහා ඉතා වැදගත් හා සුවිශේෂි කාර්යභාරයක් ඉටුකරනු ඇත.

ඉහත දැක්වූ පරිදි සමරු වෘක්ෂයක ආරක්ෂාවට ජනතාවගේ දැනුවත් භාවය හා ඉදිරිපත් වීම ඉතා අත්‍යවශ්‍ය හා වැදගත් සාධකයක් වනමුත්, එපමණකින් එවැනි වෘක්ෂ රැකගැනීමට ප්‍රමාණවත් නොවන අවස්ථා ද උද්ගතවීමට ඉඩ තිබේ. මේ නිසා සමරු වෘක්ෂ රැකගැනීම පිණිස නීතියේ පිහිට පැතීමට ද සිදුවිය හැක. ආගමික වටිනාකමකින් යුත් වෘක්ෂයකට එරෙහි ක්‍රියාවන් සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 15 වැනි පරිච්ඡේදයේ 290 සහ 291 යන වගන්තිවල පවත්නා ප්‍රතිපාදන උපයෝගී කරගත හැක. දැනට ශ්‍රී ලංකාවේ ජනතාව වැඳුම් පිදුම් කරන සියළු බෝධීන් සඳහා යම්කිසි ආරක්ෂාවක් මෙම ප්‍රතිපාදන මගින් පිරිනමා ඇත.

ශ්‍රී ලංකාවේ හමුවන සුවිශේෂී වෘක්ෂයන් සඳහා විශේෂ නීතිමය ආරක්ෂාවක් වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 43 වන වගන්තියේ ඇති ප්‍රතිපාදන උපයෝගි කරගත යුතුවේ. ඒ අනුව පනතේ VI වන උප-ලේඛනයට ඇතුළත් ගස් (හෙවත් ආරක්ෂිත ගස්) උදුරා දැමීම, වෙනත් ආකාරයකින් විනාශ කිරීම, හානි කිරීම හෝ අනතුරක් සිදු කිරීම වරදක් වේ. මෙම උප ලේඛනයට දැනට ඇතුළත්ව ඇත්තේ වෘක්ෂ පහක් පමණි. මෙම උප ලේඛනයේ මුලදී තිබූ උඟ්ගල් කල්තොට මල් මදාරා ශාකය විනාශ වී යාම මත 1970 දී ලේඛනයෙන් ඉවත් කරන ලදී. යම් ගසක් ආරක්ෂිත ගසක් ලෙස නම් කිරීම අමාත්‍යතුමා විසින් මේ පනතේ 44 වගන්තිය යටතේ සිදුකල යුතුය. මෙහිදී සලකා බැලිය යුත්තේ එම වෘක්ෂය විද්‍යාත්මක, ආගමික, ඓතිහාසික හෝ සෞන්දර්යාත්මක හේතු මත ආරක්ෂා කලයුතු ද යන්නයි. ආරක්ෂාව ලැබීමට මින් කුමන හෝ අවශ්‍යතාවයක් සපුරා තිබීම ප්‍රමාණවත් වේ. තවද පනතේ 43 හා 44 වගන්ති දෙකම සඳහන් කරන පරිදි එම ගස යම් පොදු ස්ථානයක පැවතීම අත්‍යවශ්‍ය ය. මේ නිසා යම් පුද්ගලික ඉඩමක වැඩෙන්නා වූ සමරු ශාකයකට මෙම ප්‍රතිපාදන යටතේ ආරක්ෂාව සැලස්විය නොහැකි වේ.

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත මගින් සමරු ශාකවලට තවත් අංග දෙකක් ඇතුළත් කර ඇත. එනම් කිසියම් වෘක්ෂයක

ඓතිහාසික වැදගත්කමක් හෝ ඒ හා බැඳුණු සිද්ධියක් නොමැතිමුත්, විද්‍යාත්මක මෙන්ම සෞන්දර්යාත්මක හේතු මත වුවද ආරක්ෂිත ගසක් ප්‍රකාශයට පත්කල හැකි වීමයි. මාතර පොල්අතුමෝදර පිහිටි මුට්ටි කඩොල් ශාකය මෙම විශේෂයට අයත් අප දන්නා විශාලතම ශාකයයි. තවද පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති මුට්ටි කඩොල්වල ඵල හටගැනුන ද මෙහි ඵල හට නොගන්නා බව දක්නට ඇත. මේ ශාකය ආරක්ෂා කිරීම ප්‍රධාන වශයෙන් විද්‍යාත්මකව වැදගත් වනු ඇත. දැනට මාලඹේ නගර මධ්‍යයේ පිහිටි කළුවර ගස ද ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයක පිහිටි විශාලතම කළුවර ගස, දුර්ලභ මෙන්ම, 2007 වඳ වී යන ජීවීන් ඇතුළත් රතු දත්ත ලේඛනයට අනුව වඳවීමේ තර්ජනයට ලක්වූ ශාක විශේෂයකි. එම ගස රැකගැනීම ද ප්‍රධාන වශයෙන් විද්‍යාත්මකව වැදගත් වේ. සෞන්දර්යාත්මක හේතු මත රැක ගැනීම ප්‍රධාන වශයෙන් වැදගත් ගසක් ලෙස මාතලේ ඇති නිල් වෙරළු වෘක්ෂය නම් කළ හැක.

මෙම කරුණු සැලකිල්ලට ගැනීමේ දී මෙම සමරු ශාක ග්‍රන්ථය ඉටුකරන වැදගත්ම කරුණක් ඉස්මතු වේ. එනම්, මෙම සමරු වෘක්ෂ අතුරෙන් නීතිමය රැකවරණය ලැබිය යුතු වෘක්ෂ මොනවාද යන්නත්, ඒවාට ආරක්ෂක ගසක තත්ත්වය ලබාදීමට පාදක වන හේතු සාධක මොනවාද යන්නත් එහි තොරතුරුවල අන්තර්ගත වීමයි. එබැවින් එහි ඇතුළත් කරුණු සලකා බලා ආරක්ෂිත ගස් ලෙස ආරක්ෂා කළ යුතු වෘක්ෂ කඩිනමින් හඳුනාගෙන ඒවා වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ VI වන උප ලේඛනයට ඇතුළත් කිරීමට ද හැකි වනු ඇත. එය මෙම ග්‍රන්ථය මගින් ඉටුකරනු ලබන වැදගත්ම ජාතික මෙහෙවර බවට පත්වනු නිසැක ය.

**නීතිඥ ජගත් ගුණවර්ධන**

# පිවිසුම

අතීතය බොහෝ දෑ අපට ඉතිරිකර ගොස් ඇත. එයින් සමහරක් මතකයන් පමණකි. තවත් සමහරක් නෂ්ඨාවශේෂයන් පමණකි. එහෙත් මේ සියල්ලම සොබාදහමේ නීතියට අනුව තව කලෙකින් අපෙන් සමුගන්නවා ඇත. අදටත් යන්තමින් අපට හමුවන සහ අසන දකින අතීත සැමරුම් නවීන විද්‍යාව පෙලහරපාන ඉදිරි යුගයේ දී අසන්නටවත් නොලැබීමට බොහෝ ඉඩකඩ ඇත.

අප සතු සැමරුම් සුළුපටු නැත. ඒවා අප අතීතයට දෙස් දෙයි. රාජාවලියේ සැඟවුණු තතු මෙන්ම නැවත ආශ්වාදනය කළහැකි අවස්ථාවන් සනිටුහන් කරයි. ජාතියක් වශයෙන් පැවැත්වූ රාජ තාන්ත්‍රික සබඳතාවන් නිරූපණය කරයි. සමස්තයක් වශයෙන් අතීතයේ පැවති සමාජ ආර්ථික දේශපාලනික තොරතුරු පිළිබඳ විවරණය කරයි.

ආගමික පරිසරයත් ඉතිහාසයත් විමර්ශනය කරන විට බොහෝ තොරතුරු අපට සොයාගත හැක. එසේම ඒ ඒ තොරතුරු හා සම්බන්ධ ස්ථානයන් සොයාගත හැක. ඒ සියල්ලටම අමතරව අප සතු වැදගත් සංස්කෘතිකමය සමරු පිළිබඳව මෙම ග්‍රන්ථය තොරතුරු සපයයි.

සමරු ශාක ලෙස මෙහිදී අප හඳුනාගෙන ඇත්තේ යම් ඓතිහාසික කරුණක් හෝ අවස්ථාවන් හා සම්බන්ධ හෝ යම් ඓතිහාසික සංචාරයක් සිහිපත් කරනු වස් අදාළ පුද්ගලයා විසින් රෝපණය කළ ශාකයන් ය. ලිඛිත ඉතිහාසයක් සහිත ලොව පැරණිම වෘක්ෂය වන ජය ශ්‍රී මහ බෝ සමිඳුන් ප්‍රමුඛත්වයේ ලා සලකමින් ආගමික වශයෙන් වැදගත් ශාක, රාජාවලිය හා සම්බන්ධ ශාක, විවිධ පුද්ගලයන් විසින් එක් එක් අවස්ථාවන්හි දී රෝපණය කළ ශාක මෙන්ම අප රට තුළ දුර්ලභව හමුවන ශාක කිහිපයක් පිළිබඳව ද තොරතුරු මෙමගින් ඔබ අතට පත්කර ඇත.

එක් එක් ශාක පවතින ස්ථානයන්, පිවිසුම් මාර්ගයන් හා ඓතිහාසික තොරතුරු හෝ වැදගත්කම සරලව මෙම ග්‍රන්ථයෙන් ඉදිරිපත් කරයි. මෙම සමරු ශාක බොහොමයක් පහසුවෙන් ප්‍රවේශ වියහැකි ස්ථානවල පැවතීම නිසා ඒවා ජනතාවට හෙළිදරව් කිරීම පරිසර සංචාරයේ යෙදෙන්නන්ට නවතම අද්දැකීමක් ලබන්නට හේතු කාරණා වනවා නොඅනුමානයි.

උපග්‍රන්ථය මගින් ශාක පිළිබඳ වෙනත් ආරක තොරතුරු ඔබවෙත ගෙන ඒමට උත්සාහ දරන අතරම, මෙම ග්‍රන්ථය සඳහා තොරතුරු ලබාගත් පුද්ගලයන් පිළිබඳව හා මූලාශ්‍රයන් පිළිබඳව විස්තර සපයයි.

තොරතුරු සම්පිණ්ඩනය කිරීමේදී එක් පුද්ගලයකු විසින් විවිධ ශාක කිහිපයක් විවිධ ස්ථානයන්හි රෝපණය කර ඇති අවස්ථා ද, එකම ශාක විශේෂයක් විවිධ පුද්ගලයන් විසින් විවිධ ස්ථානයන්හි රෝපණය කර ඇති අවස්ථා ද වාර්තා වේ. මෙම තොරතුරු සාරාංශ ගතකිරීමක් සුචි මගින් සිදුකර ඇත.

ඓතිහාසික තොරතුරු එකිනෙකට පරස්පර වු අවස්ථා ද මෙහි දී වාර්තා වූවත් ඒ තොරතුරු සියල්ලම මෙහි අඩංගුකර ඇත්තේ අදාළ ශාකය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ සහ ඔවුන් සමරු ශාක සංරක්ෂණයට උත්සුක කිරීමේ පවිත්‍ර චේතනාවෙනි.

ඔබ අතට පත්වන මෙය නොනිමි වියමනක් ලෙස හඳුන්වනු කැමැත්තෙමි. මෙම ග්‍රන්ථයට ඇතුළත් නොවුණු සමරු ශාක පිළිබඳවත්, ඓතිහාසිකව වැදගත් ශාක පිළිබඳවත් එමෙන්ම දුර්ලභ ශාක පිළිබඳවත් බොහෝ තොරතුරු ඔබ සතු වියහැක.

එවැනි තොරතුරු අප වෙත ලබා දෙන්නේනම් එය මෙහි ඉදිරි වෙළුමක් එළිදැක්වීමට ඔබ දක්වන දායකත්වයක් ලෙස සලකමු.

# පටුන


1. ශ්‍රී මහා බෝධීන් වහන්සේ .......... 1
2. කළුතර බෝධීන් වහන්සේ .......... 3
3. ගම්පහ මාකේවිට සුදු බෝධිය .......... 5
4. නිට්ඨා බෝධිය .......... 7
5. වීදියවත්ත සතර දේවාලයේ බෝධීන් වහන්සේ .......... 9
6. මහනුවර පත්තිනි දේවාලයේ වැල් බෝධිය .......... 11
7. සපුමල් කුමරු සිහිගන්වන කෝට්ටේ රජමහා විහාරයේ නා බෝධිය .......... 13
8. සිරි රහල් හිමියන්ට සෙවන සැදූ කෝට්ටේ නා ගස .......... 15
9. පරකඩුවේ නා ගස .......... 17
10. දළදා සපුව .......... 19
11. පත්තිනි සලඹ සැඟවූ නවගමුවේ නා ගස .......... 21
12. සැමදා එල දරන නිදහස් සමරු අඹ ගස .......... 23
13. මඩුවන්වෙල වලව්වේ ඒජන්ත මාර ගස .......... 25
14. දෙණිපිටිය නුග රුක .......... 27
15. පෙතංගොඩ කටු උණ පඳුර .......... 29
16. ශ්‍රී ලංකාවේ රෝපණය කළ පළමු රටදෙල් ගස .......... 31
17. ඔරු බැඳි සියඹලාව .......... 33
18. රජෙකුගේ අවසානය කියාපාන සියඹලා ගස .......... 35
19. සීතාවක පැණි වරකාව .......... 37
20. තිස්සමහරාමයේ කොහොඹ ගස .......... 39
21. මහවැව මාදං ගස .......... 41
22. පරමාඋල්ල ගැට කුඹුක් ගස .......... 43
23. එදිරිල්ලේ රජුට සෙවන දුන් උඩුවර මහ ගස .......... 45
24. පිලවල සියඹලා ගස .......... 47
25. අන්දරේගේ පැණි වරකාව .......... 49
26. රොබට් නොක්ස් හා සම්බන්ධ ශාක .......... 51
27. රවීන්ද්‍රනාත් තාගෝර්තුමන් රෝපණය කළ සියඹලා ගස .......... 54
28. අර්නොස්ටෝ චේගුවේරා රෝපණය කළ මැහෝගනී ගස .......... 56
29. ලෙනාඩ් වුල්ෆ්ට සෙවන සැලසූ මීගහපඳුර සියඹලාව .......... 59

30. හංවැල්ල තානායමේ කොස් ගස ........................................ 61
31. එඩ්වඩ් රජු රෝපණය කළ සල්ගස ........................................ 63
32. නාවින්න ආයුර්වේද පර්යේෂණ ආයතනයේ සමරු ශාක ........................ 65
33. ජවහල්ලාල් නේරු තුමන් රෝපණය කල ගම්මාලු ගස ........................66
34. රුවන්සල වැල්ලෙදේවාලයේ කොන්තාලම් ගස ........................ 68
35. හබ්බේගමුව විහාරයේ මදාරා ගස ........................................ 70
36. යෝධ වල් බිලිං ගස ........................................ 72
37. මාතලේ නිල් වෙරළු ගස ........................................ 73
38. මුට්ටි ගස හෙවත් පෙට්ටි ගස ........................................ 75
39. ගැහැණුවෙල රුක්අත්තන ගස ........................................ 77
40. සල්ගල වනඅරණේ යෝධ ගස ........................................ 79
41. ඕපනායක යෝධ පුස් වැල් ........................................ 81
42. කුරුලු කැලේ පුස් වැල් ........................................ 83
43. මාලඹේ නගරයේ කරුවල ගස ........................................ 85
44. මන්නාරමේ බැවොබාබ් ගස ........................................ 87
45. මඩුගස් වලව්වේ මඩුගස් එකතුව ........................................ 89
46. ඩේවිගේ ගස ........................................ 91
47. නාගදීපයේ සාමි ගස ........................................ 93
48. නරේන්ද්‍රසිංහ රජුට වාරකා සැපයූ කුණ්ඩසාලේ වරකා ගස ........................ 95

**උද්භිද උද්‍යාන ආශ්‍රිත සමරු ශාක** ........................................ **96**

49. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය ........................................ 97
50. උද්භිද උද්‍යාන බිහිවීම ........................................ 98
51. ඩී. එස්. සේනානායක මැතිතුමා රෝපණය කළ සියඹලා ගස ........................ 100
52. ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා රෝපණය කළ සුදු සඳුන් ගස ........................ 101
53. හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ බෝ ගස ........................................ 103
54. චව් එන් ලායි මැතිතුමා රෝපණය කළ ටැබුබියා ගස ........................ 105
55. ජෙනරල් සියා උල් හක් මැතිතුමා රෝපණය කළ අම්හර්ස්ටියා ගස ........... 107
56. යූරි ගගාරින් මහතා රෝපණය කළ Yellow Saraca ගස ........................ 109
57. දෙවන එළිසෙබත් රැජිණ රෝපණය කළ ගොටු නුග ගස ........................ 111
58. ඉන්දිරා ගාන්ධි මැතිණිය රෝපණය කළ ගස ........................................ 113

59. අකිහිතෝ කුමරු රෝපණය කළ ගස ........................................ 115
60. මවුන් බැටන් සාමි රෝපණය කළ අම්හර්ස්ටියා ගස .............................. 117
61. සාර් රජු රෝපණය කළ නා ගස ........................................ 119
62. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ රෝපණයකර ඇති සමරු ශාක... 120
63. හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය ........................................124
64. ලංකාවේ රෝපනය කල පළමු රබර් ගස ........................................ 125
65. හග්ගල උද්භිද උද්‍යානය ........................................ 126
66. හග්ගල උද්භිද උද්‍යානයේ පවතින පළමු සිංකෝනා වගාව .............................. 127
67. නුවරඑළිය වික්ටෝරියා උයනේ රෝපණය කරන ලද සමරු ශාක .............................. 128
68. පුංචි එංගලන්තයේ ඉපැරණි සොහොන් බිමේ සමරු ශාක .............................. 130

උප ග්‍රන්ථ ........................................ 132
69. අටවිසි බුදුවරයන් වහන්සේලා පිට දුන් වෘක්ෂ .............................. 133
70. සුචිය I ........................................ 138
පුද්ගලයන් අනුව ........................................ 138
71. සුචිය II ........................................ 139
ශාක විශේෂ අනුව ........................................ 139
72. තොරතුරු සැපයීමට සම්මාදම් වූවන් ........................................ 141
73. තොරතුරු මූලාශ්‍ර ........................................ 142

# ශ්‍රී මහා බෝධීන්වහන්සේ

## සකල ලෝකවාසී බෞද්ධයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ ලිඛිත ඉතිහාසයක් ඇති ලොව පැරණිම වෘක්ෂය



**ශාකයේ නම** : බෝ

**උද්භිත විද්‍යාත්මක නාමය** : *Ficus religiosa*

**ශාකයේ පිහිටීම** : අනුරාධපුර මහමෙව්නා උයන

සිදුහත් තව්සාණන්ට බුදු බව ලබන්නට සෙවන දුන් දඹදිව ඇසතු බෝ වෘක්ෂයේ දකුණු ශාඛාව වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලිඛිත ඉතිහාසයක් ඇති ලොව ඉපැරණිම වෘක්ෂය ලෙස හඳුන්වයි. සංඝමිත්තා තෙරණිය විසින් මෙරටට වැඩම කරවා, දෙවන පෑතිස් රජුගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර මහමෙවුනා උයනෙහි රෝපිත ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ බොදු බැතිමතුන්ගේ මුදුන් මල් කඩකි.

අතීතයේදී ජය ශ්‍රී මහා බෝධිය හිමි තැනැත්තා රටේ රජු ලෙස සැලකූ බව සඳහන් වන අතර උන් වහන්සේ දිවි හිමියෙන් ආරක්ෂා කිරීමට එකල සිටි පාලකයන් ක්‍රියා කළහ.

වංශකතා වල සඳහන් පරිදි ජය ශ්‍රී මහා බෝ පැළයේ ආරක්ෂාවට එය රෝපණය කරන අවස්ථාවේ ගල් පතුරු වලින් එය වටකර ආරක්ෂාව සැලසූ බව සඳහන් වේ .

පරසතුරු ආක්‍රමණ සිදුවූ කාල පරිච්ඡේදය තුළ සඝමිත් තෙරණිය සමඟ මෙරටට පැමිණි දහ අට කුලයක පිරිස ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැක ගත් බවත්, පසුව කීර්ති ශ්‍රී රාජ සිංහ (1747 - 1781) යුගයේදී බෝපත් කෑමට එන වල් අලින්ගෙන් එය ආරක්ෂා කරගැනීමට උසින් අඩි සොලොසක් වන, පළල අඩි දෙසිය හැත්තෑවක් ද, දිග අඩි තුන්සිය හැටකින් හා පහන් කවුලු හත්සිය පනහකින්ද යුතු සුවිසල් ගල් ප්‍රාකාරයක් තනවන ලදී. එය අදටත් දැකිය හැක.

එලෙසම දෙවන පෑතිස් රජතුමා විසින් මළු තුනකින් සමන්විත ගොඩනැගිල්ලක් කරවා එහි ඉහළ මාලයේ බෝධීන් වහන්සේ තැම්පත් කරවූ බවද සඳහන්ය.

සිංහල රාජ වංශයේ බොහෝ රජවරු ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට විවිධ පියවර ගෙන ඇති බව සඳහන් වේ.

දැඩි නියං සමයේ සැරිසරන වල් අලින්ගෙන් බෝධිය ආරක්ෂා කර ගැනීමට ගැමියන් ගිනි·මැල දල්වා අලින් එලවා එය රැක ගත් බවත් නිකිණි පෝය ඒ නිසාම දරමිටි පෝය ලෙස හැඳින්වූ බවත් පැවසේ.

සමස්ථ ලෝක වාසීන්ටම ආශීර්වාදයක්ව ඇති ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් කටුවාවල ජේම්ස් නමැති සිහිවිකල පුද්ගලයෙකු විසින් කපා දැමීමක් 1929 ජූලි මස 30 වන දින වාර්තා වී ඇති අතර එම සිද්ධියෙන් පසුව උඩ මළුවත් පහත මළුවත් අතර යකඩ වැටකින් ආවරණය කරන ලදී. ඉන් අනතුරුව වර්තමානයේ දැකිය හැකි රන් වැට ඉදිකරන ලද අතර, ඉතා මෑතක දෙවන රන්වැටද ජය ශ්‍රී මහා බෝධියේ ආරක්ෂාව උදෙසා ඉදිවිය.

ලිඛිත ඉතිහාසයක් පවතින ලොව ඉපැරණිම වෘක්ෂය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන අතර රන් වැටකින් ආරක්ෂාව ලබන එකම වෘක්ෂය ද එය වනු ඇත.

ජය ශ්‍රී මහා බෝ සමිඳු පිහිටයි.

# කළුතර බෝධීන්වහන්සේ





**ශාකයේ නම** : බෝ

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Ficus religiosa*

**ශාකයේ පිහිටීම**

කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ කළුතර පාලම පසුකර ගාල්ල දෙසට යත්ම පාලම අසලම මෙම බෝධීන් වහන්සේ පිහිටා ඇත.

**ශාකයේ ස්වභාවය**

බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට ආරක්ෂිත පවුරු ඉදිකර ඇති අතර මනාව අතුපතර විහිදීගිය ශාකයකි. ශාඛා කිහිපයක් ප්‍රධාන මාවතට ඉහළින් මාවතේ අනික් පස දක්වාද පැතිරී ඇත.

**ඉතිහාසය**

කළුතර බෝධීන් වහන්සේ අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන්ගේ දෙතිස්පලරු බෝධීන් වහන්සේලාගෙන් එක් බෝධියකි. ඉතා අතීතයේ මෙය රෝපණය කර ඇති අතර, එදා පටන්ම කළු ගඟ තරණය කර ගමන්

කරන්නන්ගේද ප්‍රදේශයේ ජනතාවගේද ගෞරවයට ලක්වී ඇත.

අධිරාජ්‍යවාදී පාලන සමයේ එනම් වර්ෂ 1877දී කළුතර පාලම තනා නිම කර ඇත. එම කාලයේදී සෙන්දනායක නම් සිංහල උපාසක මහතකු මෙම බෝධියට ආවතේව කරමින් පුද පූජා පවත්වා ඇති අතර, ඒ වන විට කළුතර දුම්රිය පාලමද ඉදිකිරීම ආරම්භ කර ඇත. එම කාල වකවානුවේ කළුතර ප්‍රදේශයේ ඒජන්තවරයා ලෙස කටයුතු කල බ්‍රොඩිහාස්ර්ට් මහතා දිනක් මෙම බෝ මලුවට පැමිණ එහි සිට සෙන්දනායක උපාසක තැන අමතා අලුතින් ඉදිකරන දුම්රිය මාර්ගය සඳහා මෙම බෝධිය කපා දැමිය යුතු බැවින් මෙහි ඇති පූජා භාණ්ඩ ඉවත් කරන ලෙස දන්වා ඇත.

රජයට හොර රහසින් බෞද්ධ පිරිස් සංවිධානය කරවාගත් සෙන්දනායක උපාසක මහතා බෝධිය කැපීමට විරුද්ධව විශාල උද්ඝෝෂණයක් කර අවසානයේ බෝධීන් වහන්සේ රැකගෙන ඇත. මෙම බෝධිය රැකගැනීමේ අරගලය පිළිබඳ පුවතක් 1897 සැප්තැම්බර් 22 දින ' දිනපතා ප්‍රවෘත්ති ' නැමති පුවත්පතේ පළවු බවද කියැවේ.

එදා සිට කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ ගමන් කරන මහජනතාවට අනුහස් සහිත ස්ථානයක් ලෙස කළුතර බෝ සමිඳුන්ට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි.

# ගම්පහ මාකේවිට සුදු බෝධිය



**ශාකයේ නම** : බෝ

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Ficus religiosa*

**ශාකයේ පිහිටීම** : ගම්පහ දිස්ත්‍රික්කයේ මාකේවිට ග්‍රාමයේ

**පිවිසුම් මාර්ගය**

ගම්පහ ජාඇල මාර්ගයේ මා බිම පසු කළවිට හමුවන මාකෙවිට හන්දියෙන් හැරී ගල්ගේ පන්සල පසුකර මඳ දුරක් ගමන් කළ විට මෙම සුදු බෝධීය දැකගත හැක.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 60 ක් පමණය. මුල සිට අඩි 10 කින් පමණ අතු බෙදීම ආරම්භ වී ඇත. ශාකයේ කඳ තරමක් ඇඹරුනු ස්වරූපයක් පෙන්වයි. ශාක කඳේ එක් පසක සුදු පැහැති බෝ පත් රාශියක් දැකගත හැකිය. ශාකයේ මුල් බොහොමයක් පොළව මතුපිට ඇති අතර, ස්ථානයේ පස සෝදාගෙන යන තත්ත්වයක් ඇත.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

සිංහල රාජාවලියේ නොමැකෙන නාමයක් වූ කැළණි තිස්ස රජුගේ බෑනා කෙනෙකු වූ සකලකලා වල්ලභ රජතුමා, උඩුගම්පල ප්‍රදේශය සිය රාජධානිය කරගැනීමට ප්‍රථම, මෙම මාකෙව්ට ප්‍රදේශයේ නිතර සංචාරය කර ඇති බව පැවසේ. එම රජ සමයේ දිව්රුම් බෝධියක් ලෙස මෙම බෝධිය භාවිතා වී ඇති බවට විශ්වාසයක් ඇත.

මෙම බෝධියෙන් සුදු පැහැති බෝපත් පීත්ත පටි ආකාරයකට හටගන්නා නිසා සුදු බෝධිය ලෙස හඳුන්වනු ලැබේ.

අතීතයේ මෙම ප්‍රදේශයේ බෝවන රෝගයක් ඉතා භයානක අයුරින් පැතිරයන විට මෙම බෝධිය අසල සිදුකළ වත් පිළිවෙත් මඟින් එම රෝගය නතරවූ බවද ජනප්‍රවාදයේ එයි.

# නිට්ටඹා බෝධිය



**ශාකයේ නම** : බෝ

**වෙනත් නම්** : නිට්ටඹා බෝධිය

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Ficus religiosa*

**ශාකයේ පිහිටීම**

ගම්පහ දිස්ත්‍රික්කයේ නිට්ටඹුව විද්‍යානන්ද පිරිවෙන් විහාරයේ මෙම සුවිශේෂීය බෝධිය පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

නිට්ටඹුව නගරයේ සිට වේයන්ගොඩ දක්වා දිවෙන මාර්ගයේ නිට්ටඹුවේ සිට කි.මි.01ක් පමණ වේයන්ගොඩ දෙසට යනවිට විද්‍යානන්ද පිරිවෙනට ළඟා විය හැක.

## ශාකයේ ස්වභාවය

ශාකයේ උස අඩි 60 ක් පමණය. මුල සිට අඩි 5 කින් පමණ අතු බෙදීම ආරම්භ වී ඇත. ශාකයේ අතු තරමක් ඇඹරුනු ස්වරූපයක් පෙන්වයි. ශාකයේ අතු කැඩී වෙන්වුනු ස්ථාන කීපයක් දැකගත හැක. බෝධි ප්‍රාකාරයකින් ආරක්ෂා වී ඇත.

## ශාකයේ ඓතිහාසික පසුබිම

ගෝඨාභය රජ දවස (බු.ව.797 දී පමණ) මෙම බෝධිය රෝපණය කළ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ.

සිරිසඟබෝ රජු සත්‍ය වශයෙන්ම මියගියේද යන්න දැනගැනීම සඳහා ගෝඨාභය රජු අනුරාධපුර සිය රාජධානියේ සිට අත්තනගලු ප්‍රදේශයට පැමිණ ඇත. එම ගමනේදී රජු විසින් බෝ පැළ රාශියක් රැගෙන විත් අතර මගදී එක් එක් ස්ථානවලදී ඒවා රෝපණය කර ඇත. එසේ අවසාන වශයෙන් (නිට්ඨාවට) රෝපණය කළ බෝධිය මෙය වන අතර එය එදා සිට නිට්ඨා බෝධිය යන නමින් හඳුන්වා ඇත. 'නිට්ටඹුව' යන ග්‍රාම නාමය නිර්මාණය වී ඇත්තේද මෙම නිට්ඨා බෝධිය නිසා බව කියැවේ.

# වීදියවත්ත සතර දේවාලයේ බෝධීන්වහන්සේ



**ශාකයේ නම** : බෝ

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Ficus religiosa*

**ශාකයේ පිහිටීම**

ගම්පහ දිස්ත්‍රික්කයේ යක්කල වීදියවත්ත සතර දේවාලයේ මෙම බෝධිය පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ කොළඹ සිට පැමිණෙන විට යක්කල නගරය පසුකර නුවර දෙසට කි.මී.01ක් පමණ පැමිණෙන විට වීදියවත්ත දේවාලය ලෙස හඳුන්වන මෙම ස්ථානය දැකගත හැක.

**ශාකයේ ස්වභාවය**

ඉපැරණි බෝධියක් වන මෙහි දැනට එක් ශාඛාවක් පමණ පවතී. එය දේවාලයට ඉහළින් පැතිර පවතී. ශාකයේ ප්‍රධාන කඳ ඉහළටම වර්ධනය වී තිබී ඇති අතර එය කලකට ඉහත කඩාවැටී ඇති බවට සාක්ෂි ඇත. බෝධිය වටා බෝධි ප්‍රාකාරයක්ද පවතී.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

මෙම බෝධි වෘක්ෂයේ ඉතිහාසය වලගම්බා රජු සමය තෙක් දිවයන්නෙකි. වලගම්බා රජු විසින් අතීතයේ මෙම බෝධිය අසල දේවාලයක් ඉදිකර ඇත. කාලයාගේ ඇවෑමෙන් එම දෙවොල වල් බිහිවී විනාශ වී ඇත. පසුව කෝට්ටේ 06 වන පරාක්‍රමබාහු රජු මෙම බෝධිය අසල සැඟව සිටි ඇති අතර රජවීමෙන් අනතුරුව මෙහි ගල්කණු 04 ක් මත නැවත දේවාලයක් ඉදිකර ඇත. එනිසා මෙය සතර දේවාලය ලෙස ප්‍රදේශයේ ජනතාව හඳුන්වා ඇත.

දේවාලයේ වාර්ෂිකව පෙරහැර කරවා ඇති අතර පෙරහැර ගමන් කිරීම සඳහා දේවාලය ආසන්නව වීදී 02 ක්ද සකස්කර ඇත. ඉහළ වීදීය හා පහළ වීදීය ලෙස මේවා හඳුන්වා ඇති අතර, වර්තමානයේ ඉහළ වීදීයවත්ත හා පහළ වීදියවත්ත ලෙස හඳුන්වන්නේ එම වීදි පිහිටි ප්‍රදේශ අනුවය.

# මහනුවර පත්තිනි දේවාලයේ වැල් බෝධිය



**ශාකයේ නම** : බෝ

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Ficus religiosa*

**භාවිතා වන නම** : වැල් බෝධිය

**ශාකයේ පිහිටීම**

මහනුවර ශ්‍රී දළදා මාළිගා භූමියේ පත්තිනි දේවාලය ඉදිරිපිට.

**ශාකයේ ස්වභාවය**

මැනවින් අතුපතර විහිදීගිය ශාකයක් ලෙසින් මෙම බෝධීන් වහන්සේ වර්ධනයවී ඇති අතර ප්‍රධාන මළු තුනක ආකාරයෙන් බෝධිය වටා වේදිකා සකස්කර ඇත. එහි ඉහළින්ම බෝධීන් වහන්සේ රෝපණය කර ඇත.

**ඓතිහාසික පසුබිම**

මෙහි සඳහන් පරිදි මෙම බෝධිය රෝපණය කර ඇත්තේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින්ය. ඒ ශ්‍රී බුද්ධ වර්ෂ 2495 පොසොන් මස 12 වන දිනය. මෙම

බෝධියේ අතුපතර වැලක ස්වභාවයෙන් පැතිරී වර්ධනය වන නිසා එයට වැල් බෝධිය ලෙස බැතිමතුන් ව්‍යවහාර කර ඇත. මෙම ඓතිහාසික ශාකය පිළිබඳ විස්තර සොයා යෑමේදී අනාවරණයවූ තවත් ජනප්‍රවාදයකි. එනම්, වරෙක නරේන්ද්‍රසිංහ රජුගේ මෑණියන්ට අනුරාධපුර අටමස්ථානය වන්දනා කිරීමට ආශාවක් ඇතිවී ඇත. මේ වන විට එම මෑණියන්ගේ දෙනෙත් අන්ධව පැවති ඇති අතර, එම තත්ත්වය යටතේ සහ පැවති ආරක්ෂක තත්ත්වය මත තම මෑණියන් මෙතරම් දුර බැහැරක දින ගණනක් තැබීමට නරේන්ද්‍රසිංහ රජු අකමැති විය. නමුත් මවගේ සිත සනසාලීම සඳහා රජු උපායක් යෙදවීය. එනම්, තම මව දෝලාවක හිඳුවා දින 7 ක් නුවර අවට ගමන් කිරීමට සළස්වා අනුරාධපුරයට යන බව ඇයට අඟවා ඇත. එහිදී එක් අවස්ථාවක එම මෑණියන්ට මෙම බෝධිය ආසන්නයේදී පෙනීම ලැබුණු බව කියැවේ. එවක් පටන් මෙය නෙත් බෝධිය ලෙසද හඳුන්වනු ලබන බව පැවසේ.

# සපුමල් කුමරු සිහිගන්වන
# කෝට්ටේ රජමහා විහාරයේ නා බෝධිය



**ශාකයේ නම** : නා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Mesua ferrea*

**ශාකයේ පිහිටීම**

කෝට්ටේ රජමහා විහාර භූමියේ

**පිවිසුම් මාර්ගය**

රාජගිරිය, බත්තරමුල්ල මාර්ගයේ ඇතුල්කෝට්ටේ මංසන්ධියෙන් ඇතුල්කෝට්ටේ දෙසට කි.මී. 3 ක් පමණ ගමන්කර කෝට්ටේ දේවස්ථානය අසලින් වම් පසට ඇති මාවතේ ගමන් කළවිට මෙම පූජනීය භූමියට ළඟාවිය හැක.

**ශාකයේ ස්වභාවය**

ඉතා ඝනව අතුපතර විහිදීගිය ශාකයකි. ශාකයේ උස දළ වශයෙන් අඩි 100ක් පමණ විය හැක. බැලූ බැල්මටම ඉතා පැරණි ශාකයක් බව විද්‍යාමාන

වේ. ශාකයේ ආරක්ෂාවට රන්වැටක් ඉදිකර ඇති අතර, එය ආසන්නව දේවාලයක් පවතී. ඉතාමත් අනුහස් ඇති නා බෝධියක් ලෙස හඳුන්වන මෙහි කොඩිවැල් විශාල සංඛ්‍යාවක් ළෙලදෙන අයුරු සුලභ දසුනකි. සෑම රාජ්‍ය නායකයකුම පාහේ වන්දනාමාන සඳහා මෙහි පැමිණෙන බව පවසන විහාරාධිපති හිමියන් මෙය ආශීර්වාද නා බෝධියක් ලෙසත් දිව්‍යය විමානයක් ලෙසත් හඳුන්වයි.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

ක්‍රි. ව. 1415 හයවන පරාක්‍රම රජු කෝට්ටේ රාජධානිය පාලනය කරන සමයේ යාපනය ප්‍රදේශයේ කැරැල්ලක් හටගෙන ඇත. මෙය මැඩ පැවැත්වීම සඳහා කෝට්ටේ රාජධානියෙන් සපුමල් කුමරු සේනාංකයක් සමඟ පිටත් කර ඇත. සටන සඳහා පිටත්වීමට පළමුව සපුමල් කුමරු මෙම නා බෝධිය අසළ එදා පැවති දැඩිමුණ්ඩ දෙවියන්ගේ දේවාලයට භාරහාර වී ගමන ආරම්භ කර ඇත. සපුමල් කුමරු විසින් යාපනය ප්‍රදේශයේ හටගත් කැරැල්ල සාර්ථකව මැඩපවත්වා නැවත ජයවර්ධනපුරයට පැමිණ ඇති අතර ඔහු විසින් යුද්ධයට ගෙන ගිය රන් අසිපත තමන් භාරවූ දෙවොල අසල තැන්පත් කර දේවාලය අංග සම්පූර්ණව ඉදිකර ඇත. එතැන් පටන් මෙය සපුමල් බණ්ඩාර දැඩිමුණ්ඩ දේවාලය ලෙස හඳුන්වා ඇත. එසේම ජය සංකේතයක් බඳු වූ ජයවර්ධනපුරයද බිහිවී ඇත.

# සිරි රහල් හිමියන්ට සෙවන සැදූ
# කෝට්ටේ නා ගස



**ශාකයේ නම** : නා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Mesua ferrea*

**ශාකයේ පිහිටීම**

කෝට්ටේ මහා විද්‍යාල භූමියේ

**පිවිසුම් මාර්ගය**

රාජගිරිය බත්තරමුල්ල මාර්ගයේ ඇතුල් කෝට්ටේ මංසන්ධියෙන් ඇතුල් කෝට්ටේ දෙසට කි.මී. 1 1/2ක් පමණ ගමන්කර දකුණු පස ඇති මිෂන් පාරේ ගමන් කළවිට මෙම විද්‍යාල භූමියට පැමිණිය හැක.

**ශාකයේ ස්වාභාවය**

හොඳින් අතුපතර විහිදීගිය ශාකයකි. ශාකයේ කඳේ වට ප්‍රමාණය අඩි 08 ක්

පමණාය. ශාකයේ ආරක්ෂාව සඳහා වැටක් ඉදිකර ඇති අතර ශාකයේ අතු පවත්වා ගැනීම සඳහා අධාරකයක්ද සවිකර ඇත.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ග්‍රන්ථකරණාය සඳහා මෙම ශාකයේ සෙවනට පැමිණි බවට ප්‍රකට විශ්වාසයකි. සැළලිහිණි සංදේශය මෙම ශාකයේ සිසිලස ලබමින් සිදුකල කෘතියක් ලෙස සලකයි. එසේම ශාකයේ වයස දළ වශයෙන් වසර 500ක් තරම් වන බවද කියැවේ.

මෙම ශාකය පිහිටි ජයවර්ධනපුර මහා විද්‍යාලයද සුවිශේෂීය ස්ථානයකි. මෙරට පළමු පාසැල ලෙස හඳුන්වන මෙය දැනට වසර 180ක් තරම් පැරණිය. හෙළයේ කීර්තිමත් විරුවන් රැසකට නැණ නුවන් සැපයු ස්ථානයකි. මොණරවිල කැප්පෙටිපොළ දිසාවගේ පුතකුගේ සොහොනද මෙම සුවිශේෂීය ශාකය අසළ පිහිටා ඇත.

# පරකඩුවේ නා ගස



**ශාකයේ නම** : නා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Mesua ferrea*

**ශාකයේ පිහිටීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ එල්ලාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තලාවිටිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

අවිස්සාවේල්ල රත්නපුර ප්‍රධාන මාර්ගයේ අවිස්සාවේල්ල සිට කි.මී.08 ක් පමණ රත්නපුර දෙසට ගමන්කරන විට හමුවන පරකඩුව බෝධිමලුව විහාරය දක්වා පැමිණි විට මෙම ශාකය දැකගත හැක.

**ශාකයේ ස්වභාවය**

මහා මාර්ගයට ආසන්නව විහාරස්ථාන භූමියේ පිහිටි මෙම ශාකය ශ්‍රී ලංකා රජය මගින් 1937 අංක 2 දරණ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත

යටතේ ආරක්ෂිත වෘක්ෂයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

ශාකය අඩි 100ක් තරම් උසට වර්ධනය වී ඇත. මේ වනවිට ශාකයේ කඳේ පහළ අතු බොහොමයක්ම කපා ඉවත්කර ඇති අතර ඉහළම අතු පමණක්ම ඉතිරිව ඇත. ශාකයේ මුල සිටම බෙනයක් පවතින අතර එය කඳ ඔස්සේ ශාකයේ ඉහළට විහිදී ඇත.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

කුරුවිට සිට මහනුවර දක්වා ශ්‍රී දන්තධාතූන් වහන්සේ වැඩම වනවිට මෙම ස්ථානයේ ගිමන් හැරීම සඳහා නැන්පත් කර ඇත. ඒ සඳහා යොදාගන්නා ලද වෘත්තාකාර ගල් පතුරු 02ක් මෙම සුවිශේෂීය ශාකය අසළ විහාර මලුවේ ඇත. ඒ ආසන්නයේම ශ්‍රී විශ්ණු දේවාලයක්ද ඉදිකර ඇත. භාස්කම් සහිත ස්ථානයක් ලෙස මෙය ඉතා ප්‍රචලිතය.



පසුකාලීන ආධාරක යොදා සංරක්ෂණය කර ඇති නා වෘක්ෂය

# දළදා සපුව



**ශාකයේ නම** : සපු

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Michelia champaca*

**භාවිතා වන නම** : දළදා සපුව

**ශාකයේ පිහිටීම**

මහනුවර දිස්ත්‍රික්කයේ හිඳගල රජමහා විහාර භූමියේ පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

පේරාදෙණිය ගලහ හංදියෙන් හැරී ගලහ පාරේ ගමන් කර හිඳගල රජමහා විහාරයට පැමිණීමෙන් මෙම ශාකය දැක බලා ගත හැකිය.

**ශාකයේ ස්වාභාවය**

හොඳින් අතුපතර විහිදී ගිය ශාකයකි. කඳ සෑහෙන ඉහළින් අතු බෙදීම ආරම්භ වී ඇති අතර මෙහි බෙනයක ස්වරූපය දැක ගත හැක. ශාකයේ කඳේ අපිශාක වර්ධනය වී ඇත.

**ඓතිහාසික පසුබිම**

කන්ද උඩරට රාජධානියේ පැවති අනාරක්ෂිත තත්ත්වයත් සමඟම 1814 වසරේ දී එවකට වැඩිහිටි මහනාහිමිවරුන්ගේ උපදෙස් පරිදි දළදා වහන්සේ ආරක්ෂාව සඳහා මහනුවරින් බැහැර කර ඇත. 1814 වසරේ අවසාන භාගයේදි රඹුක්වැල්ලේ ලෙස හඳුන්වන ලද හිමිනමක් විසින් දළදා වහන්සේ මහනුවරින් බැහැරට වඩමවා ගෙන ගොස් ඇති අතර එහිදි උන් වහන්සේ දළදාව රැගෙන බඹරගලටද, එතැනින් තලගුණේ විහාරයටද පසුව මැදිවක විහාරයටද, ගෙන ගොස් ඇත. පසුව බින්තැන්න ප්‍රදේශයේ මහ වනයේත් පසු කාලිනව අටබාගේ ප්‍රදේශයේත් දළදා වහන්සේ රහසිගතව තැම්පත් කර ඇත.

1815 වසරේ මාර්තු 27 දින ඩොයිලි ආණ්ඩුකාර වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදි නැවත දළදා වහන්සේ මහනුවර දළදා මාලිගාවට වැඩම කෙරෙන ලෙස අදිකාරම් වරුන්ගෙන් සහ නාහිමිවරුන්ගෙන් ඉල්ලා ඇත.

එසේම ඒ සමඟම දළදා වහන්සේ සතු දේපළ වල සුරක්ෂිත භාවය ඇති කිරීමටත් සෙසු විහාරස්ථාන වලට පූජා කරතිබූ දේපළ නැවත එම විහාර වලටම පවරා දීමටත් ඩොයිලි පියවර ගෙන ඇත.

1815 අප්‍රේල් මස 24 වන දින පෙරවරුවේ මහනාහිමි වහන්සේලා හිඳගල රජමහ විහාරයට නොදුරු පැරණි සපු ගසක් අසළින් දළදා වහන්සේ වඩම්මවාගෙන චාරිත්‍රානුකූලව ඇතකුපිට තබා වෙඩිමුර සහිතව පෙරහරින් දළදා මාලිගයට ශ්‍රී දන්තධාතූන් වහන්සේ වඩමවා ඇත. එදා දළදා වහන්සේ සුරක්ෂිතව තැන්පත් කර ඇත්තේ හිඳගල විහාරය අසළ පිහිටි සපු ගසේ බෙනයක නිසාවෙන් මෙම ශාකය දළදා සපුව ලෙස තවදුරටත් හඳුන්වයි.

## ශාකයේ ඓතිහාසික පසුබිම

ගජබා රජු විසින් පත්තිනි සළඹ ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් පසු කැළණි ගඟ අසබඩ නා ගොමුවක දේවාලයක් ඉදිකර ඇතිබව ඉතිහාසයේ සඳහන් වේ. නවගමුව දේවාලය හා සම්බන්ධ වනුයේ එම කතා පුවතයි. ගජබා රජු විසින් පත්තිනි සළඹ ශ්‍රී ලංකාවට ගෙන ඒමේදී කැළණි ගඟ අසබඩ නා ගොමුවක එක් රාත්‍රියක් ගතකර ඇත. අසල පිහිටි නා වෘක්ෂයක් මත පත්තිනි සළඹ තැන්පත් කර රජු ඇතුලු පිරිස නිදාගෙන ඇත. පසුදා උදෑසන නැවත ගමන ආරම්භ කිරීමට සැරසී පත්තිනි සළඹ ගැනීමට ගියවිට එය වසාගෙන නාගයන් රාශියක් සිට ඇත. නැවත පත්තිනි සළඹ ලබාගැනීමට  අපහසු වූ පසු රජු විසින් සත්‍ය ක්‍රියාවක් කර එමගින් නාගයන් ඉවත්කර සළඹ ලබාගෙන ඇත. පසුව එතැන දේවාලයක් කර ඇත. අද දකින්නට ඇත්තේ එම දේවාලයත් එම නා වෘක්ෂයත් බව කියැවේ.

මෙම නා වෘක්ෂයේ පාමුල ඇති විශේෂ ගැට 03 ක් පිළිබඳවද විශ්වාස පැවත එයි. එයින් එක් ගැටයක් නයිපෙන කීපයක හැඩය ගැනීම මගින් ඒ අතීත සිදුවීම කියාපාන බව කියැවේ.

තවත් ගැටයක් සිංහ රූපයක හැඩය ගනී. එය පත්තිනි මෑණියන්ගේ ආවතේව කළ කාලි මෑණියන්ගේ වාහනය ලෙස හඳුන්වයි. අනෙක් ගැටය ඇත් මුහුණක ආකාරය ගන්නා නිසා එය ගණදෙවි රූපයක් ලෙස හඳුන්වයි.

නවගමුව දේවාලයේ ප්‍රධාන කපු මහතා පවසන පරිදි දේව යාදින්නේ මෙම පුරාවෘත්තය සඳහන් බව පැවසේ. එසේම ඉතිහාසය අනුව මෙම වෘක්ෂය වසර 2200 ක් තරම් පැරණිය.

# පත්තිනි සළඹ සැඟවූ
# නවගමුවේ නා ගස



**ශාකයේ නම** : නා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Mesua ferrea*

**ශාකයේ පිහිටීම**

නවගමුව දේවාල භූමියේ

**පිවිසුම් මාර්ගය**

කඩුවෙල සිට හංවැල්ල මාර්ගයේ කි.මි.02 ක් පමණ හංවැල්ල දෙසට ගමන්කරන විට මෙම ඓතිහාසික පුද බිමට ළඟාවිය හැක.

**ශාකයේ ස්වභාවය**

ඓතිහාසික පුරාවෘත්තය හා සම්බන්ධ නා වෘක්ෂය උසින් අඩි 100 ක් පමණ වන හොඳින් අතුපතර බෙදී ගිය ශාකයකි. එහි වට ප්‍රමාණය අඩි 6 අඟල් 4කි. මෙම ශාකයේ ආරක්ෂාවට වැටක් ඉදිකර ඇත. ශාකයේ මුල ආශ්‍රිතව සුවිශේෂිය ව්‍යුහයන් කීපයක් (ගැට) දැකිය හැක. මේවා සම්බන්ධවද විශ්වාස ගොඩනැගී ඇත. නවගමුව දේවාලයේ නා ගස් 43 ක් දැකිය හැක. විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු මෙම සෑම වෘක්ෂයක්ම බැතිමතුන්ගේ ගෞරවයට ලක්ව ඇත.

# සැමදා එල දරන
# නිදහස් සමරු අඹ ගස



**ශාකයේ නම** : අඹ

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Mangifera indica*

**ශාකයේ පිහිටීම**

කොල්ලුපිටිය, පොල්වත්ත, ධර්මකීර්තියාරාම විහාර භූමියේ

**පිවිසුම් මාර්ගය**

ගාලු පාර ඔස්සේ කොල්ලුපිටිය, පොල්වත්තට පැමිණ ධර්මකීර්තියාරාම විහාරයට පැමිණිය හැක.

**ශාකයේ ස්වභාවය**

ශාකය අඩි 35 ක් පමණ උසය. ශාක මුලින්ම ප්‍රධාන ශාඛා දෙකකට බෙදේ. සෙසු අතු බෙදීම්ද ශාකයේ තරමක් පහළින් සිදුවී ඇත. මෙහි එල දරන අඹ ප්‍රමාණයෙන් තරමක් විශාල අතර, ඉතා රසවත් බව පැවසේ. එසේම වසර පුරාම මෙම ශාකයේ එලදාව දැකගත හැකි බවද පැවසේ.

ශාකය වටා ආරක්ෂිත බැම්මක් ඉදිකර ඇති අතර, ඒ අසලම මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමන් ගේ පිළිරුවක්ද පිහිටුවා ඇත.

**ඓතිහාසික පසුබිම**

බ්‍රිතාන්‍ය කිරීටයෙන් ශ්‍රී ලංකාවට නිදහස ලැබීම සමරනුවස් නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමන් විසින් මෙම ශාකය 1948 පෙබරවාරි මස 04 වන දින මෙම විහාරස්ථානයේදී රෝපණයකර ඇත. එවකට මෙම විහාරස්ථානයේ අධිපතීත්වය දැරූ අතිපූජ්‍ය හඟ්දවාපොල ශ්‍රී විමලවංසාභිධාන හිමිගේ ප්‍රධානත්වයෙන් නිදහස් දින ආගමික වැඩසටහන මෙම විහාර භූමියේ පවත්වා ඇති අතර, එහිදී මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමන් විසින් මෙම ශාකය රෝපණය කර ඇත.

අඹ පැළය රෝපණය කළ අවස්ථාවේ ලබාගත් ඡායාරූපයක් විහාරස්ථානයේදී දැකගත හැකි අතර, එහි රෝපිත අඹ පැලය දෙපස පූජ්‍ය හඟ්දවාපොල ශ්‍රී විමලවංසාභිධාන හිමි සහ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමන් දැක්වේ.

අතීතයේ පටන් අද දක්වාම කීර්තිමත් ධර්මධර විනයධර බුද්ධ පුත්‍රයානන් වහන්සේලාට සෙවන සලසන කොල්ලුපිටිය, පොල්වත්ත ධර්මකීර්තියාරාම විහාර භූමියේ ඇති සැමදා එල දරන අඹ ගස, අප නිදහස් සටනේ අභිමානය නිහඬව කියාපායි.

# මඩුවන්වෙල වලව්වේ ඒජන්ත මාර ගස



**ශාකයේ නම** : මාර

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Samanea saman.*

**භාවිතා වන නම** : ඒජන්ත මාර ගස

**ශාකයේ පිහිටීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න නගරය පසුකර මඩුවන්වෙල ග්‍රාමයේ මඩුවන්වෙල වලව්ව භූමියේ මෙම ශාකය දැකගත හැක.

**පිවිසුම් මාර්ගය**

ඇඹිලිපිටිය සිට දෙණියාය මාර්ගයේ ගමන්කර කොලොන්න නගරය පසුකර මඩුවන්වෙල ග්‍රාමයට පැමිණීමෙන් පහසුවෙන් මඩුවන්වෙල වලව්වට පැමිණිය හැක.

**ශාකයේ ස්වභාවය**

ඉතා විශාලව වර්ධනය වූ මාර ගසක් වන මෙය දැනට කලකට පෙර බිම පතිත වී ඇත. ශාකයේ මුල සම්පූර්ණයෙන්ම පොලවෙන් ඉදිරී නැති නිසා ශාකය තාමත් සජීවී තත්ත්වයේ ඇත. මෙහි දිග අඩි 60ක් පමණ වන අතර කඳේ වට ප්‍රමාණය අඩි 15 ක් පමණ වේ.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

මඩුවන්වෙල ග්‍රාමය ලක් ඉතිහාසයට එක් වීමට බලපෑ ප්‍රධානතම සාධකය එහි විසූ 'මඩුවන්වෙල මහ දිසාවයි'. ප්‍රතාපවත් ජන නායකයකු ලෙස හෙල වංශ කතාවේ සඳහන් වන මඩුවන්වෙල දිසාව වාසය කළ වලව්වද සිංහල ගෘහ නිර්මාණ ශිල්පයේ දක්ෂතා පිළිබිඹු කරන නිර්මාණයකි. මෙයට අතීතයේ කාමර 121 හා ඒ හා සම්බන්ධව මැද මිදුල් 21 ක්ද තිබී ඇත. වලව්වේ තරප්පුපෙල සවිකිරීම සඳහා ඇත් දළ කැබලි යොදාගෙන ඇති බවත් බිම සැරසීම සඳහා රන් හා රිදී කාසි යොදාගත් බවත් සඳහන් වේ.

ඉංග්‍රීසි ජාතිකයන් මෙරට පාලනය කරන කාලයේ වුවද ඔවුන් අවතක්සේරුවට ලක් කරමින් නිර්භයව කටයුතු කල මහා දිසාව කිසිදු භේදයකින් තොරව වැරදිකරුවන්ට දඬුවම් දීමටද පසුබට වී නැත. එවැනි එක් අවස්ථාවක තමාගේ අවසරයක් නොමැතිව දිසාව මුලසුනගත් රැස්වීමකට පැමිණි ඉංග්‍රීසි ජාතික ඒජන්තවරයකු වලව්වේ මිදුලේ පිහිටි මාර ගසක බැඳදමා දඬුවම් දී ඇත. එදා පටන් එය 'ඒජන්ත මාර ගස' ලෙස හඳුන්වයි. වලව්ව භූමියේ පසෙක අද දක්නට ඇත්තේ එම මාරගස යි.

එසේම තවත් අවස්ථාවක සිංහල ආරච්චි කෙනෙකුට දඬුවම් දීම සඳහා ඔහු වලව්ව භූමියේ පිහිටි කිතුල් ගසක බැඳ දැමූ බව කියවෙන අතර එය ආරච්චි කිතුල ලෙස පසුකලෙක හඳුන්වා ඇත. එම ශාකය දැනට විනාශ වී ගොස් ඇති අතර තිබුණු ස්ථානය පිළිබඳව ද නිශ්චිත සාක්ෂි නැත.



ඒජන්ත මාර ගස ඉපැරණි ගෘහ නිර්මාණ ශිල්පයේ අසිරියත්,
මඩුවන්වෙල මහ දිසාවගේ කීර්තියත් කියාපාන මඩුවන්වෙල වලව්ව.

# දෙනිපිටියේ නුග රුක



**ශාකයේ නම** : නුග

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Ficus benghalensis*

**ශාකයේ පිහිටීම**

මාතර දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙනිපිටිය ග්‍රාමයේ පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

ගාල්ල මාතර මාර්ගයේ පොල්අතු මෝදර නගරයෙන් වමට හැරී කි.මී.04 ක් පමණ ගමන්කර දෙනිපිටය හන්දිය අසලදී මෙම ඓතිහාසික වෘක්ෂය දැකගත හැක.

**ශාකයේ ස්වභාවය**

වර්තමානයේ මෙම ස්ථානයේ අතීතයේ සිට පැවති වෘක්ෂය දැකගත නොහැක. එය කඩාවැටී පසට දිරා පත්වෙමින් පවතී. ඒ අසලම නව නුග ශාකයක් වැඩී ඇත. අතීතයේ ශාකය ආරක්ෂාවට පැවති කුඩා ප්‍රාකාරය දැකගත හැක. ශාකය බිමට පතිත වනවිට එයද තැනින් තැන විනාශ වී ඇත.

මෙම ඓතිහාසික නුගරුක මුල්වරට කඩාවැටුණේ 1925 අප්‍රේල් මස 15 වන දින බව පසුව සොයාගත් අතර, ඉන් පසුව ඇතිවූ අංකුරයකින් ආරම්භවූ

වෘක්ෂය පසුව පැවති බව කියැවේ.

**ඓතිහාසික පසුබිම**

ශ්‍රී ලාංකීය සාහිත්‍ය කලාවේ සදා අනුස්මරණ චරිතයක් ලෙස ගජමන් නෝනා කිවිඳිය හැඳින්විය හැක. ඇයගේ රචනාවන් අතර වන 'දෙනිපිටියේ නුගරුක වැනුම' නිසාම මෙම සුවිශේෂීය වෘක්ෂය ජනතාව අතර ප්‍රචලිත වී ඇත.

අතීතයේ දෙනිපිටිය ග්‍රාමය දේශීය වෛද්‍යවරුන් සඳහා ප්‍රකටව පැවති බවත් ගජමන් නෝනා සිය අසනීප තත්ත්වය සඳහා ප්‍රතිකාර ලබාගැනීමට දෙනිපිටිය ග්‍රාමයට පැමිණ ඇති බවත් කියැවේ.

එසේ ප්‍රතිකාර සඳහා දෙනිපිටියට පැමිණි අවස්ථාවලදී ගජමන් නෝනා වෙහෙස නිවා ගැනීම සඳහා දෙනිපිටිය නුගරුක සෙවනේ රැඳී සිටිය බව කියැවේ. එහිදී පබැඳුණු පද්‍යයන් ලෙස මෙම දෙනිපිටිය නුගරුක වැනුම සලකනු ලබයි. මෙම කවි පබැඳුම වර්ෂ 1785 දී පමණ සිදුවූ බවද කියැවේ.

අතීතයේ පැවති මෙම දැවැන්ත නුගරුකේ අත්තක් හා මුලක් අසලින් ගලා බසින පොල් අතු ගඟ තරණය කලේ මෙසේ ගඟ හරහා විහිදුනු බවත්, එම නුග අත්ත හා මුලේ ආධාරයෙන් ජනතාව ගඟ තරණය කළ බවත් පැවසේ.

**දෙනිපිටිය නුගේ වර්ණනාව - ගජමන් නෝනා**

| | | | |
|---|---|---|---|
| 1. පිනවන දුටු දන | සැම | 5. සැම වර දන මන | නන්ද |
| ගඟ ළඟ පිහිටි | කදිම | පල බර පලල | උයන්ද |
| තුරු පෙළ අවට | සැදීම | නෙක වතු කුඹුරු | වලින්ද |
| යුත් සෙවනැල් | | සැදු දෙපසේ | |
| 2. ගණ දෙව් කුලෙව් | දිලීම | 6. පෙම කරවන | නිතියෙන්ද |
| විහඟුන් මත රැව් | දීම | සල්පිල් සහ | ගෙවලින්ද |
| සුළඟින් පත් ලෙල | දීම | එහි සරනා මැති | සෙන්ද |
| ඇති හැම කල් | | සැණකෙළිසේ | |
| 3. යන එන අය | සැපසේම | 7. කිවියර වඩු | සිතියම්ද |
| එහි ඉඳ ගිම් | සැනසීම | දැන ගත් සිහි | ඇතිරන්ද |
| දස දිග අතු | විහිදීම | සැදි දෙනිපිටිය | නමින්ද |
| ගිමෙන විසල් | | යුත් පියසේ | |
| 4. දෙනිපිටියට | ම | 8. නුගතුර තුනු | රුසිරෙන්ද |
| ඉතාම වටිනා මහ නුග | දුම | පලකර සක් | දෙවියන්ද |
| බලසකි එහි සිත් | සේම | පරසතු රුක | විලසින්ද |
| නිලඹර දුල් | | නිබඳ දිසේ | |

කටුව අග බෙදී කටු පොකුරක ආකාරයට සැකසී ඇත. ආරක්ෂක වැටක ඉදිකර ඇති බැවින් ශාකය බාහිර උපද්‍රව වලින් ආරක්ෂාවී ඇත.

**ඓතිහාසික පසුබිම**

| | |
|---|---|
| රුසිරු පෙතන්ගොඩ උයනට | වැඩියාය |
| නපුරු උණ කටුව පතුළේ | ඇනුණාය |
| එක්ව සිටි සැවොම වටවී | මතුලාය |
| රාජසිංහ දෙවි නාමෙන් | මැකුණාය |

සිංහලයේ තවත් එක් ඛේදාත්මක සිද්ධියකට පසුබිම සැකසූ ස්ථානයකි, පෙතන්ගොඩ උයන. සීතාවක රාජසිංහ රජු සිංහල රාජාවලියේ සුවිශේෂීය භූමිකාවකට හිමිකම් කියන නිරිඳකු ලෙස හඳුන්වයි. රාජසිංහ රජ සමයෙහි මෙම පෙතන්ගොඩ උයන අක්කර 400 ක් පමණ විශාල උයනක් ලෙස පැවති බවත් එය රාජසිංහ රජුගේ නැගනියකවූ මත්තමගොඩ කුමාරිහාමිට අයත්ව පැවති බවත් ජනප්‍රවාදයේ පවතී. රජු විටින් විට විවේක ගැනීම සඳහා මෙම උයනට පැමිණ ඇති බවටද විශ්වාස කරනු ලැබේ.

මෙම උයනට නුදුරින් කැළණි ගඟේ අතු ගංගාවක් වන ගුරුගොඩ ඔය ගලා බසියි. එම ඔය ඔස්සේ යාත්‍රා කළවිට කැළණි ගඟටද එතැනින් සීතාවක රාජධානියට හෝ රජ මාළිගාවට පහසුවෙන් ළඟාවීමට අවස්ථාව රාජසිංහ රජුට තිබී ඇත. එසේම මෙය ආරක්ෂිත මාර්ගයක් ලෙසද රජු විසින් උපයෝගී කරගන්නට ඇත.

මහනුවර විමලධර්මසූරිය රජු සමඟ සටනට පිවිසි රාජසිංහ රජු බලන ගිරිදුර්ගයේ පැවති සටනින් පරාජය වීමෙන් පසු බසින ගමනේ පෙතන්ගොඩ උයනට පැමිණ ඇති බවත් එහි විවේක ගනිමින් සිටින විට විෂ උණකටුවක් යටිපතුලේ ඇනී ඇති බවත් ජනප්‍රවාදයේ පැවසේ.

රජුගේ මියයෑම සම්බන්ධව විවිධ අදහස් ජනප්‍රවාදයේ පැවතියත් වඩා ප්‍රචලිත ආකාරය වන්නේ එම විෂකටුවේ උග්‍ර විෂෙන් රජතුමා මිය ගිය බවයි. එසේම බරණ ගණිතයා නම් අයකු මැතිරීම මගින් රජුගේ විෂ වැඩීවී එයින් රජු මියගිය බව තවත් මතයකි. එසේම රජුට ලබාදුන් ඖෂධ අතර අමු ගොම රහසේ අඩංගු කර තිබූ බවත් එමගින් රජුගේ තුවාලය ඔඩුදුවන ලද බව තවත් තැනක කියවේ.

පෙතන්ගොඩ උයනේ පවතින මෙම විශේෂ උණ පඳුරේ රිකිලි වල කටු පවතී. සමහරක් කටු අඟල් 2-2 1/2 තරම් දිගු වන අතර එම කටු අග තවත් කටු නිර්මාණය වී කටු පොකුරක ආකාරයට වර්ධනය වී ඇත. මෙය කටුවල ප්‍රභලත්වය වටහා ගැනීමට යොදාගත හැකි සරලම සාධකයක් ලෙස හැඳින්විය හැක.

ඉතිහාසයේ එක් වැදගත් සිද්ධියක් සනිටුහන් කරන මෙම ඓතිහාසික උණ පඳුර අනාගත පරම්පරා සඳහා සංරක්ෂණය කිරීම අප සතු යුතුකමක් වන්නේය.

# පෙතන්ගොඩ කටු උණ පඳුර



**ශාකයේ නම** : උණ (කටු උණ)

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Bambusa arundinacea* (Retz.) Willd.

**භාවිතා වන නම** : පෙතන්ගොඩ කටු උණ පඳුර

**ශාකයේ පිහිටීම**

ගුරුගොඩ ඔය අසල පෙතන්ගොඩ ග්‍රාමයේ, ඓතිහාසික පෙතන්ගොඩ උයන.

**පිවිසුම් මාර්ගය**

අවිස්සාවේල්ල කෑගල්ල මාර්ගයේ ගමන්කර අඟුරුවැල්ලෙන් සල්ගල මාර්ගයට හැරී මඳ දුරක් ගමන්කර එහිදී පෙතන්ගොඩ උණ පදුර දක්වා දිවෙන අතුරු මාර්ගයට හැරී ගමන් කිරීමෙන් මෙම ඓතිහාසික වෘක්ෂය දැකගත හැක.

**ශාකයේ ස්වාභාවය**

ආසන්නයේ පිහිටි උණ පදුරු දෙකක් වශයෙන් පිහිටා ඇත. තොරතුරු රැස්කරන සමයේ පත්‍ර නොතිබුනි. ශාකයේ කටු ඉතාමත් තියුණු වන අතර,

# ශ්‍රී ලංකාවේ රෝපණය කළ පළමු රට දෙල් ගස



**ශාකයේ නම** : රට දෙල්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Artocarpus incisus*

**ශාකයේ පිහිටීම**

ගාල්ල දිස්ත්‍රික්කයේ ගාලු කොටුව තුළ පිහිටි පැරණි අධ්‍යාපන අමාත්‍යාංශ සංචාරක නිවාස භූමියේ කොටු පවුර ආසන්නයේ.

**පිවිසුම් මාර්ගය**

ගාල්ල නගරයේ කොටු පවුර තුළින් ඇතුල් වී වමට හැරී ගමන්කර ගාල්ල උසාවි භූමිය පසුකළ විට මෙම ඓතිහාසික වෘක්ෂය සහිත ස්ථානයට පැමිණිය හැක.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 40 ක් පමණය. මුල සිට අතු බෙදීම ආරම්භ වී ඇත. ප්‍රධාන ශාඛා තුනකට අතු බෙදීම සිදු වී ඇත. ශාකය වටා බැම්මක් ඉදිකර ඇත.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

ගාල්ල නගරය අප සතු තවත් එක් ලෝක උරුමයකි. පළමුව පෘතුග්‍රීසි පාලනයට නතුවූ ගාල්ල පසුව ලන්දේසි ජාතිකයන්ගේ පාලනයට යටත් වී ඇත. ඒ වර්ෂ 1640 දීය. එතැන් සිට ලන්දේසීන් ඉතා ක්‍රමවත් එමෙන්ම විධිමත් බලකොටුවක් එහි ඉදිකර ඇත. ඕලන්ද ගෘහ නිර්මාණ ශිල්පයේ දස්කම් මෙන්ම අපූර්වත්වය විදහාපාන මෙම කොටු පවුර සහිත බලකොටුව හෙක්ටයාර 36 ක භූමියක පැතිර ඇත. තමන්ගේ බලකොටුවේ ශක්තිය කෙසේ වෙතත් සිංහලයාගේ ශක්තිය මෙන්ම සටන්කාමීත්වය සිය පාලනයට බලවත් තර්ජනයක් බව වටහාගත් ලන්දේසීන් එම බලය දුර්වල කිරීමට ක්‍රම උපායක් අනුගමනය කරන ලදි. එනම් උෂ්ණාධික ආහාරයක් මෙරටට හඳුන්වා දී සිංහල ජාතිය දුර්වල කරලීමයි. ඒ රට දෙල් ය.

රට දෙල් ආහාරයට ගැනීම ජනප්‍රිය කිරීමට ඔවුන් එම ශාක මෙරටට හඳුන්වා දී ඇත. නමුත් ඊට වඩා බුද්ධිමත් වූ සිංහලයා පොල් සමග රට දෙල් ආහාරයට ගැනීමට පුරුදු වූයෙන් ලන්දේසි උපාය ව්‍යර්ත වී ගොස් ඇත. එතැන් පටන් තවත් රසවත් අහරක් සිංහලයාට ලැබිණි.

# ඔරු බැඳි සියඹලාව






**ශාකයේ නම** : සියඹලා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Tamarindus indica*

**භාවිතා වන නම** : ඔරු බැඳි සියඹලාව

**ශාකයේ පිහිටීම**

ඇලහැර යෝධ ඇල ඉවුරේ මෙම ශාකය පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

නාවුල නගරයෙන් බකමුණ ඇලහැර මාර්ගයේ ගමන් කර ඇලහැර යෝධ ඇල ජල පැන්නුම අසළට පැමිණීමෙන් මෙම ඓතිහාසික වෘක්ෂය අසළට ළඟා විය හැක.

**ශාකයේ ස්වාභාවය**

පළමු ශාකය 1978 වසරේ දී සුළි සුළඟින් ඉදිරි වැටී ඇති අතර, එහි දිරා යන කඳ හා අතු පතර දැක ගත හැක. මුල් ශාකයෙන් වර්ධනය වූ ශාඛාවක් දැන් විශාලව වර්ධනය වී ඇත. පළමු ශාකයට යකඩ වැටකින් ආරක්ෂාව සපයා ඇත. අදාළ ස්ථානය පුද පූජා පවත්වන ස්ථානයක් ලෙසත් ජනතාව අතර පිළිගැනීමක් පවතින නිසා මෙම ශාකයට වැඩි සැළකිල්ලක් ලැබී ඇත.

**ඓතිහාසික පසුබිම**

ඇළහැර මින්නේරිය යෝධ ඇළ නමින් හඳුන්වන මෙම වාරිමාර්ගය වසභ රජුගේ කාලයේ ආර්මිභ කර ඇති අතර පසුව මහසෙන් රජුගේ කාල සීමාවේ දී ඉතා දියුණු තත්ත්වයට පත් කර ඇත. මෙහි ඉදිකිරීම් සිදුවන අවධියේ එම කටයුතු භාරව කටයුතු කර ඇත්තේ මහසේන රජුගේ පුත් නාමල් කුමරු බව ඉතිහාසයේ සඳහන් වේ. මහසෙන් රජු වරින් වර අදාළ ඉදිකිරීම් පරීක්ෂාවට ඇළහැර මින්නේරිය යෝධ ඇළට පැමිණ ඇති අතර, ගමන් වලදී රජු භාවිතා කළ ඔරුව මෙම සියඹලා ගසේහි බැඳ දැමූ බව ජනප්‍රවාදයේ එයි. එවක් පටන් මෙය ඔරු බැඳි සියඹලාව ලෙස හඳුන්වා ඇත.

තවත් කථාවක කියවෙන්නේ රජුගේ අන්තඃපුරයක් මෙහි පැවත ඇති අතර රජු අන්තඃපුරයට පිවිසීමට ඔරුවක මාර්ගයෙන් පැමිණ ඔරුව මෙම සියඹලා ගසෙහි බැඳ දමා ඇති බවයි. මේ සියල්ලටම වෙනස් තොරතුරක්ද මෙම ගස පිළිබඳව තොරතුරු සොයා යැමේදී අනාවරණය වී ඇත. එය මෙසේය,

මහසෙන් රජුට අයත්ව විශාල හරක් රංචුවක් සිට ඇත. දෑඩි නියං සමයක දීත් මෙම හරක් රංචුවේ එක් එළදෙනක් පමණක් පෘෂ්ටිමත්ව මනා සෞඛ්‍ය සම්පන්නව සිටින අයුරු රජු දැක ඇත. මෙයට හේතුව මෙම එළදෙන සශ්‍රික ප්‍රදේශයකින් ආහාර ගන්නා නිසාවෙන් යැයි සිතූ රජු එම ප්‍රදේශය සොයා ගැනීමට උපක්‍රමයක් යොදා ඇත. එනම් තල ගෝනියක් එම එළදෙනගේ පිටේ බැඳ එම ගෝනියේ සිදුරක් කර එයින් තල ඇට වැටීමට සළස්වා එළදෙනට නිදහසේ යෑමට ඉඩහැර ඇත.

පසුව වැසි සමය පටන් ගත්තාත් සමගම රජු රාජපුරුෂයින් මගින් පැළ වූ තල ගස් ඇසුරු කරමින් එළදෙන ආහාර ගැනීමට යන ඉසව්ව සොයාගෙන ඇත.

රජු සිතූ ලෙසටම එම ප්‍රාන්තය ඉතාමත් සරු පසකින් හෙබි ප්‍රදේශයක්ව තිබී ඇත. පසුව එහි කෘෂිකාර්මික භෝග වගා කර ප්‍රදේශය සංවර්ධනය කර ඇත. මෙම කටයුත්තට පැමිණ ඇත්තේ යෝධ ඇළ හරහා ඔරුවෙනි. එහිදී රජුගේ ඔරුව බඳින ලද සියඹලා ගස ඔරු බැඳි සියඹලාව ලෙස හඳුන්වයි.

ඉහත පුරාවෘත්තයෙන් කුමක් සත්‍ය වුවත් ඔරු බැඳි සියඹලාව අප සතු උරුමයකි. මෙය 1937 අංක 2 දරණ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනතින් ආරක්ෂිත වෘක්ෂයකි.

# රජකුගේ අවසානය කියාපාන ශාකයක්



රාජසිංහ රජු අත්අඩංගුවට පත් ස්ථානයේ පවතින සියඹලා ගස සහ ඒ වෙනුවෙන් ඉදිකළ ස්මාරකය

**ශාකයේ නම** : සියඹලා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Tamarindus indica*

**ශාකයේ පිහිටීම**

මහනුවර දිස්ත්‍රික්කයේ මැදමහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෝමුරේ ග්‍රාමයේ.

**පිවිසුම් මාර්ගය**

මහනුවර මහියංගන ප්‍රධාන මාර්ගයේ මැද මහනුවර උඩුරුගල වැලමිට වංගුව අසල වුඩ් සයිඩ් පාරේ ආරම්භක ස්ථානයෙන් දෙමටගස්තැන්න හරහා සැතපුම් 1 1/2 පමණ ගමන් කළ විට මෙම ඓතිහාසික ස්ථානයට පැමිණිය හැක.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 40 -50ක් පමණ වන අතර වට ප්‍රමාණය අඩි 12 අගල් 8 කි.

ශාකයේ කඳේ ගැට හා රැලි සහිත ස්වභාවයක් පවතී. මෙම ශාකය වසර 500ක් තරම්වත් පැරණි බව ප්‍රදේශයේ ජනතාව පවසයි. තොරතුරු රැස්කළ 2003 වසරේ නොවැම්බර් මාසයේදී ශාකය ඵල දරා තිබුණි.

මෙම ශාකය අසළම තවත් සියඹලා ගසක් සහ කොස් ගසක් පවතින අතර ඒවාද ඉතාමත් පැරණි ශාක වීමට ඉඩ ඇතිමුත් ඒ පිළිබඳව තොරතුරු සොයා ගත නොහැකි විය.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

වර්ෂ 1815 පෙබරවාරි 15 දින ලක් ඉතිහාසයේ තවත් එක් සුවිශේෂීය දිනයක්, එදා කන්ද උඩරට පැවති අන්තිම සිංහල රාජධානියත් ඉංග්‍රීසි පාලනයට නතු විය. එහිදී ඉංග්‍රීසි හමුදාවෙන් බේරීමට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිය රාජධානිය අතහැර හුන්නස්ගිරිය ආසන්න ආරක්ෂිත ස්ථානයට පලාගොස් ඇත. මෙම ගමනේදී රජු බලාපොරොත්තු වූ පරිදිම ආරක්ෂිත ස්ථානයකට ගමන කිරීමට නොහැකිවූ අතර අතරමග පිහිටි බෝමුරේ උඩුපිටියේ ආරච්චිගේ නිවසේ සැඟව ඇත.

එසේම ජනප්‍රවාදයේ එන තවත් කතාවක් වන්නේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු නියමිත පරිදි හුන්නස්ගිරිය ප්‍රදේශයේ ආරක්ෂිත ස්ථානයට ගොස් සැඟවී දින කීපයත් ගතකළ බවය. එහිදි රජු ඇතුළු පිරිස ස්නානය සඳහා බෝමුරේ ප්‍රදේශයේ දිය පීල්ලකට රහසේ පැමිණෙන බවත් ස්නානයෙන් අනතුරුව ඔවුන් රහසේම නික්මයන බවත්ය. රජු ඇතුළු පිරිස මෙසේ රහසින් ගමන්කරන්නේ දිය පීල්ල අසළ පවතින රහස් උමගකිනි. රජු දිය පහරට තල පතක් ඇල්ලූවිට රහස් උමග වෙනදා විවෘත වී ඇත. එහෙත් එක් දිනක එසේ රහස් උමග විවෘත නොවිණි. එයට හේතුව රාජසිංහ රජු ඇහැලේපොල කුමාරිහාමි ඇතුළු දරුවන් මරාදැමීමේ පාපය ලෙස සලකන අතර ආරක්ෂිත ස්ථානයට යාමට නොහැකිවූ නිසා රජු එදින බෝමුරේ උඩුපිටියේ ආරච්චිගේ නිවසේ ලැගුම් ගෙන ඇත.

කෙසේ වෙතත් කුඩා ළමයකුගෙන් ලද ඔත්තුවක් අනුව එක්නැලිගොඩ මොහොට්ටාල ඇතුලු පිරිසට රජතුමා අත් අඩංගුවට ගැනීමට හැකිවී ඇති අතර වර්ෂ 1815 පෙබරවාරි 18 දින මෙරට අවසාන රජතුමාත් ඉංග්‍රීසින් යටතට පත්විය.

එදා රජු අත් අඩංගුවට ගත් ස්ථානයේ පැවතියැයි කියන දැවැන්ත සියඹලා ගස අදටත් නිහඬව බලා සිටියි. රජු ඇල්ලීමට පැමිණි පිරිස මෙම සියඹලා ගස යට සැඟව සිටි බව කියැවේ. එම අනුවේදනීය සිදුවීම දුටු සියඹලා ගස අදටත් අපට දැකගත හැක.

# සීතාවක පැණි වරකාව



| | | |
|---|---|---|
| **ශාකයේ නම** | : | කොස් |
| **උද්භිද විද්‍යාත්මක නාමය** | : | *Artocarpus heterophyllus* |
| **භාවිතා වන නම** | : | පැණි වරකාව |

**ශාකයේ පිහිටීම**

කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැණි වරකාව ග්‍රාමයේ.

**පිවිසුම් මාර්ගය**

අවිස්සාවේල්ල නගරයේ පොලිස් ස්ථානය අසලින් 'ගැට හැති ඔය' දෙසට දිවෙන මාර්ගයේ කිලෝ මීටරයක් පමණ ගමන් කළවිට පැණි වරකාව නම් ප්‍රදේශය හමුවේ. එහි ගැට හැති ඔයට ආසන්නව පුද්ගලික ඉඩමක මෙම ශාකය පිහිටා ඇත.

**ශාකයේ ස්වාභාවය**

ශාකයේ උස අඩි 50-60 පමණ වේ. වට ප්‍රමාණය අඩි 15 පමණය. අතු බෙදීම මුල සිට අඩි 20ක් පමණ උසකින් සිදුවී ඇත. වසර 400 -500ක් තරම් පැරණි බව ප්‍රදේශයේ ජනතාව විශ්වාස කරයි. ශාකයේ කඳ දිරායාමට ලක්ව ඇති අතර ශාකයේ මුල සිට ඉහළට විශාල බෙනයක් පැතිර ඇත. කඳේ සමහර තැනෙක කඳ හරහා විනිවිද පෙනෙන තරමේ දිරාගිය සිදුරු පවතී.

තොරතරු රැස්කල 2004 වසරේ පෙබරවාරි මස වනවිට ශාකය එල දරා තිබුණි.

**ඓතිහාසික පසුබිම**

සීතාවක සිය රාජධානිය පිහිටුවාගන්නා ලද රාජසිංහ රජුට රාජ භෝජන සැපයීමේදී ඒ සඳහා මෙම ශාකයෙන් පැණි වරකා ලබාගත් බව ජනප්‍රවාදයේ කියවේ. මෙහි පැණි වරකා අතිශය ප්‍රණීත වූ නිසාම සම්පූර්ණ ශාකයම රජුගේ පරිභෝජනයට පමණක් වෙන්කරන ලද බවත් යම් අයකු මෙහි පැණි වරකා රජුගේ අවසරයෙන් තොරව ආහාරයට ගතහොත් ඔහු හෝ ඇය රාජ උදහසට ලක්වූ බවත් කියවේ. මෙම ශාකය පිහිටි ප්‍රදේශය අතීතයේ පටන්ම පැණිවරකාව ලෙස හඳුන්වා ඇති බව තොරතුරු සොයා යාමේදී අනාවරණය විය.

**ශාකයේ ආරක්ෂාව**

මෙම ශාකය පුද්ගලික ඉඩමක පිහිටා ඇති අතර තොරතුරු රැස්කරන අවධිය වනවිට ප්‍රදේශයේ ඉඩම් කැබලි කර විකිණීමේ තත්වයක් පැවතිණි. එහෙයින් ශාකයේ ආරක්ෂාව තහවුරු කිරීම ඉතාමත් අත්‍යවශ්‍ය කරුණකි.

# තිස්සමහාරාමයේ කොහොඹ ගස



**ශාකයේ නම** : කොහොඹ

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Azadirachta indica*

**ශාකයේ පිහිටීම**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම විහාරස්ථානයේ චෛත්‍යයේ ප්‍රධාන වාහල්කඩ අසල වම් පසින් මෙම වෘක්ෂය දැක ගත හැක.

**ශාකයේ ස්වභාවය**

මෙම ශාකයේ වයස දළ වශයෙන් වසර 250-300ක් පමණ වන බව පැවසේ. ශාකයේ උස අඩි 60ක් පමණ වන අතර කඳේ වට ප්‍රමාණය අඩි 14කි. ශාකය හොඳින් අතුපතර බෙදී වර්ධනය වී ඇත.

ශාකයේ කඳ මධ්‍යනයට වන්නට තරමක විශාල ප්‍රමාණයේ බෙනයක් පවතින අතර එය ශාකයේ පැවැත්මට තර්ජනයක් වීමටද ඉඩ ඇත.

**ඉතිහාසය**

පරසතුරු ආක්‍රමණයන්ට පසුව වනයෙන් වැසුණු තිස්ස පුදබිම නැවත සොයාගෙන ඇත්තේ වර්ෂ 1835 දී පමණය. එවකට මෙහි පැමිණි සුමන නම් හිමිනමක් මෙම ගස පාමුල වාඩියක් සාදාගෙන වැඩහිඳිමින් චෛත්‍යයේ සංවර්ධන කටයුතු සිදුකර ඇත.

එතැන් පටන්ම තිස්ස චෛත්‍යය අසළ පිහිටි මෙම කොහොඹ ගසද බැතිමතුන්ගේ මහත් ගෞරවයට පාත්‍ර වී ඇත. මෙහි ඇති තවත් එක් සුවිශේෂීය බවක් වන්නේ මෙම ශාකයේ චෛත්‍ය දෙසට වර්ධනය වන අත්තේ කොහොඹ පත්‍ර තිත්ත නොමැති (තිත්ත අඩු බවයි). එම අත්තේ ශාක පත්‍ර සැපීම මගින් රෝග සුවවන බවත් කොහොඹ ගසට බාරහාර වීමෙන් තම තමන්ගේ බලාපොරොත්තු ඉෂ්ඨ සිද්ධ වන බවත් විශ්වාස කරයි. කෙම්මුර දිනවල රාත්‍රියට මෙම ශාකයෙන් වර්ණවත් එළි තිස්ස චෛත්‍ය වෙත ගමන් කරන බවත් ඒවා දේවතා එළි ලෙසත් ප්‍රදේශයේ ජනතාව විශ්වාස කරයි.

# මහවැව මාදං ගස



| | | |
|---|---|---|
| **ශාකයේ නම** | : | මාදං |
| **උද්භිද විද්‍යාත්මක නාමය** | : | *Syzygium cumini* |
| **භාවිතා වන නම** | : | මහ වැව මාදං ගස |

**ශාකයේ පිහිටීම**

පුත්තලම දිස්ත්‍රික්කයේ මහවැව ඉස්මත්තේ පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

කොළඹ හලාවත මාර්ගයේ මාදම්පේ නගරයට පෙරාතුව හමුවන මහවැව නගරයේ ඉන්ධන පිරවුම් පොළ අසළින් ආරම්භවන ගුරු පාරේ මීටර් 100 ක් පමණ ගමන් කළ විට මෙම ශාකය හමුවේ.

**ශාකයේ ස්වභාවය**

මෙම ශාකය අඩි 50 ක් පමණ උස වන අතර කඳේ වට ප්‍රමාණය අඩි 13 අගල් 7කි. මුල සිට අඩි 15 කින් පමණ ශාකය ප්‍රධාන ශාඛා දෙකකට වෙන්වන

අතර, එයට පහළ කඳ ප්‍රදේශයේ විශාල ගැට හටගෙන ඇත. ශාකයේ අතු පතර විහිදීම මැනවින් සිදුවී ඇත.

**ඓතිහාසික පසුබිම**

වසර 600 තරම් පැරණි බව පැවසේ. මෙම ශාකය අසළ පවතින ජලාශය ක්‍රි.ව.1460 දී රජකමට පත්වූ ජයවීර පරාකමබාහු රජුගේ ඥාතිවරයකු වන තනියවල්ලභ කුමරු විසින් කඩුපිටිය ඔය හරස්කර ඉදිකරන ලද බව ජනප්‍රවාදයේ සඳහන් වේ. ජලාශය ඉදිකරන වකවානුවේදී තනියවල්ලභ කුමරු මෙම මාදං ගස සෙවනේ සිට එම කාර්යයන් නිරීක්ෂණය කල බවට ප්‍රදේශයේ ජනතාව අතර විශ්වාසයක් පවතී. තනියවල්ලභ කුමරුගේ අභාවයෙන් අනතුරුව 'තනිවැල්ලේ දෙවියන්' ලෙස ඔහු නැවත ඉපදුණු බවත් එම දෙවියන් මෙම මාදං ගස වාස භවන කරගෙන වැඩසිටින බවත් ප්‍රදේශයේ ජනතාව විශ්වාස කරයි.

මෙම වෘක්ෂ සෙවනේ දෙවොලක් ඉදිකර එහි 'තනිවැල්ලේ දෙවියන්' නමින් පුද පූජා පැවැත්වීමට ප්‍රදේශයේ ජනතාව කටයුතු කර ඇත. මෙම දෙවොල අද ද දක්නට ඇත.

# පරමාඋල්ල ගැට කුඹුක් ගස



**ශාකයේ නම** : කුඹුක්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Terminalia arjuna*

**භාවිතා වන නම** : පරමාඋල්ල ගැට කුඹුක් ගස

**ශාකයේ පිහිටීම**

අලව්ව සිට ගිරිඋල්ලට දිවෙන මාර්ගයේ අලව්ව නගරයේ සිට ගිරිඋල්ල දෙසට කි.මි.03 ක් පමණ ගමන් කරන විට හමුවන පරමාඋල්ල රජමහා විහාරය ඉදිරිපිට ප්‍රධාන මාර්ගය අසළ.

**පිවිසුම් මාර්ගය**

අලව්ව - ගිරිඋල්ල මාර්ගය ඔස්සේ පරමාඋල්ල රජමහා විහාරය අසළට පැමිණීමෙන් මෙම සුවිශේෂීය වෘක්ෂය දැකගත හැක.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 50-60ක් පමණ වන අතර පොළවේ සිට අඩි 10ක තරම් උසක කඳ ආශ්‍රිතව විශාල ප්‍රමාණයේ ගැට රාශියක් දැකගත හැක. කඳේ වට ප්‍රමාණය අඩි 25කි.

**ඓතිහාසික පසුබිම**

මෙම වෘක්ෂය වසර 500 ක් තරම් පැරණි බව විශ්වාස නෙරේ. එසේම ශාකයේ කඳ ආශ්‍රිතව පවතින විශාල 'ගැට' නිසා මෙය පරමාඋල්ල ගැට කුඹුක් ගස ලෙස ප්‍රකටය.

එසේම මෙම වෘක්ෂය සතුව සුවිශේෂිය ඉතිහාසයක්ද ඇත. එනම් වර්ෂ 1935 දී එවකට කුරුණෑගල ප්‍රදේශය භාරව කටයුතු කළ සුදු ජාතික නිලධාරියකු සිය අශ්ව කරත්තයෙන් මෙම ස්ථානය පසුකර ගමන්කර ඇත. එවිට මෙම ශාකයේ පවතින ගැටවල කරත්ත රෝදය ගැටී එයින් අශ්ව කරත්තය පෙරලී සුදු ජාතික නිලධාරියාට තුවාල සිදුවී අශ්වයාද මියගොස් ඇත.

මෙම හේතුවෙන් ඉතාමත් කුපිතවූ එම නිලධාරියා වහාම මෙම ගස කපාදැමීමට නියෝගකර ඇත. මෙම නියෝගයට එරෙහිවූ ප්‍රදේශයේ ජනතාව ගස කපා දැමීමට විරුද්ධව අරගලයක නිරතවී ඇත. එයින් තව තවත් උරණ වූ සුදු නිලධාරියා එම පිරිස අත්අඩංගුවට ගැනිමට රාජ ආඥාවක් නිකුත්කර ඇත.

මෙම අවස්ථාවේදී ප්‍රදේශයේ ජනතාව ගැට කුඹුක් ගස අසල පුදපූජා පවත්වා දින 07ක් සම්පූර්ණ වන පරිදි දෙවොල් මඩු නටා මෙම උවදුරින් තමන්ව ගලවාගන්නා ලෙස කන්නලව් කර ඇත. ඉන් පසුව එම රාජ නියෝගය ඉවත්වූ බවද ජනප්‍රවාදයේ පැවත එයි.

එසේම සමහර රාත්‍රින්වල මෙම ඓතිහාසික වෘක්ෂයේ සිට වර්ණවත් ආලෝක ධාරාවක් පරමාඋල්ල රජමහා විහාරයේ බෝධීන් වහන්සේ වෙත ගමන්කරන බවද කියැවේ.

මෙම ශාකය ඉතාමත් අනුහස් සහිත ශාකයක් බවත් එයට හානි කිරීමට කිසිවෙකුට නොහැකි බවත් ප්‍රදේශයේ ජනතාව විශ්වාස කරයි. එසේම අතීතයේ මෙම ප්‍රදේශයේ වැවක් පැවති බවත් මෙම ශාකය වැවේ මුල්ලකට වන්නට ඉවුරේ පිහිටි බැවින් ඔරු බැඳ දැමීමට යොදාගත් බවත් වැඩිදුර තොරතුරු සොයා යාමේදී අනාවරණය විය. එසේම එවකට මෙම ප්‍රදේශය ඔරුලෑ මුල්ල ලෙස හැඳින්වූ බවත් පසුව එය පරමාඋල්ල වූ බවත් සඳහන් විය.

# එදිරිල්ලේ රජුට සෙවන දුන් උඩුවර මහ ගස



**ශාකයේ නම** : රිටි

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Antiaris toxicaria*

**භාවිතා වන නම** : උඩුවර මහ ගස

**ශාකයේ පිහිටීම** : අඟුරුවාතොට උඩුවර ග්‍රාමයේ

**පිවිසුම් මාර්ගය**

අඟුරුවාගොඩ නගරය පසුකර ගමන්කරන විට කළු ගඟ හරහා ඉදිකළ නව පාලම හමුවේ. එය අසළින් දකුණු දෙසට දිවෙන මාවතේ කිලෝමීටරයක් පමණ ගමන්කර උඩුවරට පැමිණ මෙම ශාකය අසලට ලඟාවිය හැක.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 100 ක් පමණය. මුල සිට අඩි 20 කින් පමණ අතු බෙදීම ආරම්භ වී ඇත. ශාකයේ කඳ තරමක් ඇඹරුනු ස්වරූපයක් පෙන්වයි. ශාක කඳේ පාමුල දැවැන්ත බෙනයක් ඇත. එය තුළට ගියවිට ශාකයේ කඳ

ඇතුළතින් දිගටම මෙම බෙනය ගමන්කරන බව පෙනේ. අති දැවැන්ත ශාකයකි.

**ඓතිහාසික පසුබිම**

එදිරිල්ලේ රාල යනු පෘතුග්‍රීසි යුගයේ පෘතුගීසීන්ට හා දොන් ජුවන් ධර්මපාල රජුට එරෙහිව කැරලි ගසා එදිරිල්ලේ බණ්ඩාර නමින් රජවූ අයෙකි.

සත්කොරලයේ රජකම තමන් සතුව ප්‍රකාශ කළ එදිරිල්ලේ බණ්ඩාර, රජුට හා පෘතුග්‍රීසීන්ට විරුද්ධ සටන් මෙහෙයවීම ආරම්භ කරන ලදී. මෙහි එක් සටනක් පාදුක්ක ප්‍රදේශයේ සිදුවූ බවත් පැවසේ.

මෙම සටනේ අවසාන අවස්ථාව ලෙස හොරණ උඩුවර ප්‍රදේශයේදී එදිරිල්ලේ රජු සහ පෘතුග්‍රීසි සෙන්පතියකු වූ සමරකෝන් රාල අතර සිදුවූ සටන හඳුන්වයි. එහිදී පැරදුනු එදිරිල්ලේ රජු පලායන්නට විය. පලායන ගමනේදී එදිරිල්ලේ රජු දෙවොල්කන්ද ප්‍රදේශයේ සැඟවී ගත් අතර පසුව ආහාර සොයා යාම සඳහා හාත්පස නිරීක්ෂණය කර ඇත. එවිට ඔහු අතුපතර දැඩිව විහිදුණු මහ ගසක් දැක ඇති අතර එය ආශ්‍රිතව ජනාවාසයක් තිබිය හැකි යැයි සිතා එම වෘක්ෂය දෙසට පැමිණ ඇත. එම දැවැන්ත වෘක්ෂය මෙම උඩුවර මහ ගසකි. ඔහු එහි තම කිරුළ සහ මගුල් කඩුව සඟවා තබා අසළ පිහිටි ජනපදයේ නිවසකට ගොස් ආහාර සඳහා යමක් ඉල්ලා ඇත. ඒ අවස්ථාවේදී එදිරිල්ලේ රජු සමරකෝන් රාලගේ අත් අඩංගුවට පත්වූ බවද ජනවහරයේ පැවසේ.

අසළ ප්‍රදේශවාසීන් පවසන්නේ මෙම ශාකය වසර 1000ක් පමණ පැරණි විය හැකි බවයි. මෙම ශාකයේ ඵල රතු පැහැති වන අතර වවුලන් විසින් ඒවා ආහාරයට ගන්නා බවද ගස මුල පතිත වන බීජ පැළැටි, කුඩා පැළැටි හට ගන්නා අතර ඒවා හරකුන් වැනි සතුන් විසින් ආහාරයට ගන්නා බවත් අඩියක් පමණ උඩට වැඩුණු විට ඉබේම මියයන බවද පැවසේ.

ශාකයේ ලබාගන්නා ලද පත්‍ර බීජ හා පුෂ්පවල සාම්පල හඳුනාගැනීම සඳහා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට යොමුකළ අතර එහිදී මෙම ශාකය 'රිටි' ශාකය ලෙස හඳුනාගන්නා ලදී. ශාකයේ ක්ෂීරය ඉතා විෂ සහිත බවත් අතීතයේ ඊතල විෂ පෙවීම සඳහා රිටි ශාකයේ ක්ෂීරය යොදාගත් බවත් පැවසේ.

# පිලවල සියඹලා ගස



**ශාකයේ නම** : සියඹලා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Tamarindus indica*

**ශාකයේ පිහිටීම**

මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැණික්හින්න පිලවල මාර්ගයේ පිලවල මහා විද්‍යාලය අසළ පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

දිගන නගරයේ සිට මැණික්හින්න දක්වා ඇති මාර්ගයේ ගමන්කර පිලවලට පැමිණීමෙන් මෙම ශාකය අසළට ළඟාවිය හැක.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 50 ක් පමණය. මුල සිට අඩි 10 කින් පමණ අතු රැසක් ආරම්භ වී ඇත. ශාකයේ කඳ ඇඹරුනු ස්වරූපයක් පෙන්වයි. එසේම කඳ පහළ කොටස ප්‍රමාණයෙන් විශාල වී ඇත.

**ඓතිහාසික පසුබිම**

ක්‍රි.ව.1707-1739 කාලය තුළ කන්ද අඩරට රජකළ ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සතුව පැවති අලංකාර මල් උයනට පිවිසෙන මාර්ගය මෙම වෘක්ෂය අසළින් පැවති බව කියැවේ. එසේම රජු ස්නානයට හා ජලක්‍රීඩා සඳහා ලේවැල්ල තොටුපලට යන අතරතුර මෙම වෘක්ෂය යට ගිමන් හැර ඇති බවත් විශ්වාස කෙරේ.

දුම්බර මිටියාවතට අධිගෘහිතව වැඩ විසූ නාථ දෙවියන්ද මෙම සියඹලා ගස ආශ්‍රිතව ගිමන් හැර ඇති බවත්, පසුව මෙම ශාකය පිටියේ දෙවියන්ට කැපවූ බවත් ප්‍රදේශයේ ජනතාව විශ්වාස කරයි.

# අන්දරේගේ පැණි වරකාව



**ශාකයේ නම** : කොස්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Artocarpus heterophyllus*

**ශාකයේ පිහිටීම**

හඟුරන්කෙත පොත්ගුල් විහාර භූමියේ විෂ්ණු දේවාලය අසළ

**පිවිසුම් මාර්ගය**

මහනුවර සිට හඟුරන්කෙතට ඇති මාර්ගයේ ගමන්කර හඟුරන්කෙත නගරයේ ඉපැරණි විෂ්ණු දේවාල භූමියට පැමිණීමෙන් මෙම ශාකය දැකගත හැකිය.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 50 ක් පමණය. මුල සිට අඩි 5 කින් පමණ අතු බෙදීම ආරම්භ වී ඇත. ශාකයේ ආරක්ෂාවට ශාකය වටා බැම්මක් ඉදිකර ඇත.

**ඓතිහාසික පසුබිම**

මෙම ශාකයේ වයස දළ වශයෙන් වසර 400 ක් පමණ වන බව පැවසෙන අතර, ශාකය වටා ගෙතුනු රසවත් ජනප්‍රවාදයකි. එය මෙසේය.

කලක් උඩරට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හඟුරන්කෙත මහවාසලෙහි සැඟව සිටියේය. රාජ්‍ය කුමන්ත්‍රණ හා විවිධ පරසතුරු උවදුරු එයට හේතු වී ඇත. මේ සමයේ රජුට සේවය කිරීම සඳහා ඌව ප්‍රදේශයේ සිට පැමිණි මැද අරාවේ ගම්රාල නම් අයෙකු ද විය. මේ අතර විහාර භූමියේ පැණි වරකා ගසක් රජු වෙනුවෙන් ම වෙන් කර තිබූ අතර, එහි එලදරන පැණි වරකා භුක්ති විඳින්නේ ද රජු පමණි. දිනක් මැද අරාවේ රාළ රජුට වෙන්කර සුදු පිරුවටයකින් වසා තිබුණු ඉදී සුවඳ හමන පැණි වරකා ගෙඩිය දුටුවේය. ඔහු වහා ගසට නැග වරකා ගෙඩියෙන් බෑයක් කපාගෙන එය කා, ගසේ ඉතිරි භාගයට ගලක් තබා නැවත පිරුවටයකින් එය ඔතා පැමිණ ඇත. අරාවේ රාළ පැණි වරකා කෑව බව රජ වාසලට ආරංචි විය. එයින් කුපිත වූ රජු, අරාවේ ගමරාළ ගෙන්වා රජවාසලට අපහාස කිරීම වෙනුවෙන් ඔහු මරා දැමීමට නියෝග කළේය. රාජ පුරුෂයෙක් විසින් හිස ගසා දැමීමට කැඳවාගෙන යන අරාවේ රාල විටක මහ හඬින් හඬන්නට ද, විටෙක මහ හඬින් සිනාසෙන්නට ද පටන් ගෙන ඇත. මේ පිළිබඳව විමසූ රාජ පුරුෂයන්ට ඔහු පවසා ඇත්තේ එයට හේතුව කියන්නේ මහ රජුට පමණක් බවය.

නැවත අරාවේ ගමරාළ මහ රජු ඉදිරියට ගෙනයන ලදුව මහ රජු ඇඬීමට හා සිනාසීමට කරුණු විමසා ඇත. එහි දී මැද අරාවේ රාලඃ මහ රජ, මගේ අඹු දරුවන් සිහිවී මට හැඬුම් ආවේ යැයි පැවසීය. එය සැබෑවක් බව පිළිගත් රජු සිනහවීමට හේතු විමසීය. එසේය මහ රජ, ඔබ වහන්සේ වරකා බෑයටත් මිනිහෙක් මැරූ බව පවසමින් මිනිසුන් ඔබට ගරහනු ලබන බව දැනෙන විට මට සිනහ ගියේ යැයි පැවසීය.

තමා ගත් තීරණයේ බරපතල කම වැටහුණු මහ රජ මැද අරාවේ ගමරාලගේ දඬුවම ඉවත් කර ඔහුට අභය දානය දුන් බවත්, තවද හඟුරන්කෙත සිට ඌව දක්වා මග දෙපස පැවති සියලු කොස් ගස් අරාවේ ගමරාලට පැවරූ බව ද කියැවේ.

මෙම ජනප්‍රවාදය තවත් තැනක අන්දරේ හා සම්බන්ධව කියැවේ. එහි දී අදාළ කාර්යය කරන ලද්දේ අන්දරේ විසින් බව එහි සඳහන් වේ.

# රොබට් නොක්ස් හා සම්බන්ධ ශාක

## මුතූර් හි සියඹලා ගස




**ශාකයේ නම** : සියඹලා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Tamarindus indica*

**භාවිතා වන නම** : නොක්ස් ගස White man's tree

**ශාකයේ පිහිටීම**

මුතූර් මහා විද්‍යාලය ඉදිරිපිට

**පිවිසුම් මාර්ගය**

ත්‍රිකුණාමලය සිට හෝ කන්තලේ සේරුනුවර සිට මුතූර් නගරයට පැමිණ, නගර මධ්‍යයේ පිහිටි මුතූර් මහා විද්‍යාලය ඉදිරිපිටට පැමිණීමෙන් මෙම ඓතිහාසික වෘක්ෂය දැකගත හැක.

### ශාකයේ ස්වභාවය

ශාකය අඩි 40 ක් පමණ උසකින් යුතු අතර මුල සිට අඩි 10 කින් පමණ අතු බෙදීම ආරම්භ වේ. ශාකය වටා ආරක්ෂිත බැම්මක් ඉදිකර ඇත. එහි ඉපැරණි ගල් පුවරුවක් සවිකර ඇත.

ශාකයේ කඳ තරමක් ඇඹරුනු ස්වභාවයක් පෙන්වයි. මෙම ශාකයේ මවු ශාකය ඉතා විශාල වට ප්‍රමාණයකින් යුක්තව පැවති බව තොරතුරු සොයා යෑමේදී අනාවරණය වූ අතර, එම ශාකය 1957 වසරේ මෙම ප්‍රදේශයට බලපාන ලද සුළි සුළඟින් විනාශවී ඇත. මෙය වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනතින් ආරක්ෂා කරන ලද ශාකයකි.

අතීතයේ පැවති නෝක්ස් ගසේ ඡායාරූපයක් සේරුවිල රජමහා විහාරයේ ඇති බවට තොරතුරු ලැබුනත් එය දැකගැනීමේ හැකියාවක් නොවීය.

### ඓතිහාසික පසුබිම

රොබට් නොක්ස් ඉංග්‍රීසි ජාතික නාවිකයෙකි. ඔහු රටින් රට සමුදුර තරණය කර වෙළඳාමෙහි නියුතුවූ අයෙකි. ඔහු සිය පුත්‍රයා සමග. (ඔහුගේ නමද රොබට් නොක්ස්ය. මෙහිදී ඉදිරියේ සඳහන් වන්නේ මේ පුත්‍ර රොබට් නෝක්ස් පිළිබඳවය)

1657 වසරේ ජනවාරි 21 වෙනි දින ඉන්දියාවේ දී වෙළඳ බඩු රැස්කරගෙන එංගලන්තය බලා පිටත්වීම සඳහා 'ඈන්' නෞකාවෙන් ගමන් ආරම්භ කරන ලදී. ගමන අතරමගදී ඇතිවූ චන්ඩ කුණාටුවක් හේතුවෙන් තම නෞකාව විනාශ වීම නිසා එම නෞකාව අලුත්වැඩියා කරගැනීමේ අරමුණෙන් නාවික පිරිස ත්‍රිකුණාමලය ආසන්නයේ කොඩ්ඩියාර් බොක්කෙන් මෙරටට ගොඩ බැස ඇත. දින කීපයක් මෙලෙස සිටි නාවික පිරිස සිංහල හේවායින් මගින් 1660 වසරේ අප්‍රේල් මස 04 වෙනි දින අත්අඩංගුවට ගෙන ඇත. එසේ නාවික පිරිස අත්අඩංගුවට පත්ව ඇත්තේ ඔවුන් දැවැන්ත සියඹලා ගසක් යට සෙවණේ සිටියදී බව ශ්‍රී ලංකාවෙන් පලාගිය රොබට් නොක්ස් තමන් විසින් 1696 වසරේ දී රචනාකරන ලද An historical relation of the Island of Ceylon නැමති ග්‍රන්ථයේ සඳහන් කර ඇත. වර්තමානයේ නොක්ස් ගස ලෙසින් හැඳින්වෙන්නේ එම සියඹලා ගසයි.

ඈන් නැවේ කපිතාන්ව සිටි රොබට් නොක්ස් ශ්‍රී ලංකාවේ දී මියගිය අතර, ඔහුගේ පුත් රොබට් නොක්ස් මෙරට සිරකරුවකු ලෙස වසර 19 කුත් මාස 1 ක් හා දින 14 ක් ගතකර ඇත. අවසානයේ වෙළෙන්දෙකුගේ ස්වරූපයෙන් පෙනී සිටිමින් මෙරටින් පලා යාමට උත්සාහ ගත් රොබට් නොක්ස් ඒ වන විට තමන් රැදී සිටි බණ්ඩාර කොස්වත්ත ප්‍රදේශයේ සිට කළුවිල ග්‍රාමය ඔස්සේ අනුරාධපුරයටත්, එහි සිට මල්වතු ඔය ඔස්සේ මන්නාරමේ අරිප්පු ලන්දේසි බලකොටුවට 1679 වසරේ ඔක්තෝම්බර් 18 දින පැමිණ ඇත.

පසුව මන්නාරමේ සිට කොළඹටත්, එහි සිට බැටේවියාවට සහ එතැනින්

'සීසර්' නැමති නෞකාවකින් සිය මවුබිම වූ එංගලන්තයටත් ගොස් ඇත.

රොබට් නොක්ස් සිරකරුවකු වශයෙන් මෙරට ගතකළ කාලයේ ඔහු අත්විඳි හා එවකට අප රටේ පැවති සමාජ ආර්ථික හා පාරිසරික තත්ත්වයන් පිළිබඳ තොරතුරු අඩංගු An historical relation of the Island of Ceylon නැමැති ග්‍රන්ථය 1696 දී රචනාකර මුද්‍රණය කරන ලදී.

රොබට් නොක්ස් නිදහස සොයා යන ගමනේදී කළුවිල ග්‍රාමයේ නායකයා හමුවන තෙක් රැඳී සිටියායැයි සැලකෙන මී ගසක් *(Madhuca longifolia)* තවමත් කළුවිල වැව අසළ දැකගත හැක. අඩි 80 ක් පමණ උස මෙම ශාකය මුල ගණදෙවියන්ගේ රුවක් තැම්පත්කර ඇත. වාර්ෂික කිරි ඉතිරවීමේ උත්සවයන් මෙම ශාකය අසළ පවත්වනු ලැබේ.

මුතූර්හි පිහිටි නොක්ස් ගස, කාලයක් සාමාන්‍ය ජනතාවගෙන් දුරස්ව පැවතියේ එම ප්‍රදේශයේ පැවති ත්‍රස්තවාදී අරගල නිසාවෙනි. අදාළ ප්‍රදේශය ත්‍රස්ත ග්‍රහනයෙන් මුදා ගැනීම නිසා මෙම ඓතිහාසික වෘක්ෂය දැකගැනීමට අප පින් ලද්දෝ වූයෙමු.

අප මාතෘ භූමිය රුදුරු ත්‍රස්තවාදයෙන් මුදා ගැනීමට දිවි පරදුවට තබා සටනෙහි නියැලෙන රණ විරුවනට අපගේ උත්තමාචාරය.



**පැරණි නොක්ස් ගසේ ඡායාරූපය අන්තර්ජාලයෙන්**



**කළුවල මී ගස**

# රවින්ද්‍රනාත් තාගෝර්තුමන් රෝපණය කළ සියඹලා ගස



**ශාකයේ නම** : සියඹලා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Tamarindus indica*

**ශාකයේ පිහිටීම**

හොරණ ශ්‍රී පාලි විද්‍යාල භූමියේ ප්‍රධාන පිවිසුමෙන් මීටර් 25 ක් පමණ විදුහල දෙසට වන්නට ප්‍රවේශ මාර්ගය අසළ මෙම ශාකය දැක ගත හැක.

**පිවිසුම් මාර්ගය**

හොරණ නගරයට පැමිණ එතැන්හි ශ්‍රී පාලි විද්‍යාල භූමියට පැමිණීමෙන් මෙම ශාකය දැකගත හැක. මේ සඳහා ශ්‍රී පාලි විද්‍යාලයේ විදුහල්පතිතුමන්ගේ පූර්ව අවසරය ලබාගත යුතු බව සැලකිය යුතුය.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ වටප්‍රමාණය අඩි 8 යි අගල් 3 ක් පමණ වන අතර උස දල වශයෙන් අඩි 40-50 ක් පමණය. ප්‍රධාන කඳ මුල සිට අඩි 15 ක් පමණ අතු බෙදීම අරම්භ කරයි. අතු පතර විහිදීම මැනවින් සිදු වී ඇත.

**ශාකයේ ඉතිහාසය**

මෙම ශාකය රෝපණය කළ දිනය බු.ව. 2477 සහ ක්‍රි.ව. 1934 වෙසක් මස 8 ලෙස සටහන් වන සමරු පලකයක් ශාකය පාමුල සවි කර ඇති අතර එය රෝපණය කර ඇත්තේ ගුරුදේව රවින්ද්‍රනාත් තාගෝර් තුමන් විසිනි.

ශ්‍රී පාලි විද්‍යාලය සඳහා මුල් ගල තැබීමේ උත්සවය සඳහා ගුරුදේව රවින්ද්‍රනාත් තාගෝර් තුමන් පැමිණ ඇති අතර එම දිනය සමරනු සඳහා මෙම ශාකය එතුමන් විසින් රෝපණය කර ඇත.

ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රබල නාමයක් සනිටුහන් කරන හොරණ ශ්‍රී පාලි විද්‍යාලය කළා අංශය සඳහා ඉමහත් ප්‍රසිද්ධියක් උසුලයි. තොරතුරු සොයා යැමේදී ශ්‍රී පාලි විද්‍යාලයේ සැලැස්ම ඉන්දියාවේ ශාන්ති නිකේතනයේ බිම් සැළැස්මට බොහෝ දුරට සමානව ඉදි කර ඇති බවද අනාවරණය වේ. ගීතාංජලී නැමැති කාව්‍ය සංග්‍රහය සඳහා නොබෙල් ත්‍යාගය දිනා ගත් ගුරුදේව රවින්ද්‍රනාත් තාගෝර් තුමන් මෙරට රෝපණය කළ එකම ශාකය මෙය වන අතර එය සදා අනුස්මරණීය සිහිවටනයක් බව ස්ථිරය.

එසේම හොරණ ශ්‍රී පාලි විද්‍යාල භූමිය තවත් සමරු ශාක ගණනාවක් සහිත ස්ථානයකි. විටින් විට විද්‍යාලයේ පවත්වන ලද උත්සව සඳහා ඇරයුම් ලද සම්භාවනීය අමුත්තන් මෙහි රෝපණය කළ ශාකයන් අද නිහඬව සාඩම්බරව නැගී සිටියි.

ඒ අතර 1937 වසරේ මාර්තු මස 31 වන දින ශ්‍රීමතී කමලාදේවී චත්තෝපාධ්‍යාය විසින් රෝපණය කළ නා ගස 1938 වසරේ පෙබරවාරි මස 3 දින ශ්‍රී ස්වර්ණපල්ලි රාධකිරනන් රෝපණය කළ ටැබුබියා ශාකය, 1954 වසරේ මාර්තු 14 වන දින ශ්‍රීමති විජයලක්ෂ්මි විසින් රෝපණය කළ ටැබුබියා ගස සහ 1970 වසරේ මාර්තු 23 දින ජේ.ආර්. ජයවර්ධන මැතිතුමන් විසින් රෝපණය කළ ඇසළ ගසද මේ අතර වේ.

අභිමානවත් ජාතියක ශක්තිමත් නාමයට යන පැවැත්මට උරදෙන කලාකාමී පරිසරයක වැජඹෙන මෙම සමරු ශාක මෙරට සමස්ථ සිසු පරපුරටම ආශිර්වාදයක් වනු ඇත.

# අර්නෙස්ටෝ චේගුවේරා රෝපණය කළ මැහෝගනී ගස



**ශාකයේ නම** : මැහෝගනී

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Swietenia macrophylla*

**පිවිසුම් මාර්ගය**

මොරගහහේන මාර්ගයේ කි.මි.1/2 පමණ එතැනින් දකුණු දෙසට ඇති මාවත ඔස්සේ යහලකැලේ බංගලාවට පැමිණිය හැක. (මේ සඳහා යහලකැලේ වතුයායේ වතු අධිකාරි මහතාගේ අනුමැතිය ලබා ගත යුතු බව දන්වමි)

**ශාකයේ ස්වභාවය**

ඉතාමත් හොඳින් වර්ධනය වූ ශාකයකි. කඳ මුලසිට අඩි 10ක් තරම් උසින් අතුබෙදීම ඇරඹී ඇත. ශාකයේ වටප්‍රමාණය අඩි 6 අඟල් 5 පමණ වන අතර උස දල වශයෙන් අඩි 70ක් පමණ වේ.

මෙම ශාකයට බාහිර උපද්‍රවයක් සිදුවී නොමැති අතර ශාකය සමග තවත් වැලක් වර්ධනය වී එයින් නිකුත්වන සිහින් කෙඳිමය මුල් ශාකයේ ඉහළ සිට පහළට විහිදී ඇත. මීට අමතරව ශාකයේ අතු අතර විවිධ අපිශාක වර්ගද වර්ධනය වී ඇත. එසේ ශාකය පිළිබඳ තොරතුරු සඳහන් නාම පුවරුවක්ද ශාකය මුල දැකගත හැක. අර්නොස්ටෝ චේගුවේරා ජගත් විප්ලවීය දේශපාලන කරලියේ සදා නොමැකෙන නාමයකි. මීට වඩා මේ නම ප්‍රකට 'චේ' යන තනි නමෙනි.

වර්ෂ 1928 ජූනි මස 14 වෙනි දින මෙලොව එළිය දුටු අර්නොස්ටෝ චේගුවේරා පසුව වෘත්තියෙන් වෛද්‍යවරයකු විය. ක්‍රමයෙන් වාමාංශික දේශපාලනයට යොමු වූ චේ 1957 මැයි මස සිට කියුබානු විප්ලවීය හමුදාවේ මේජර් තනතුරකට පත්විය. ජයග්‍රාහි කියුබානු විප්ලවයෙන් පසු එනම් 1959 පෙබරවාරි 9 වන දින විශේෂ ආඥාවකින් චේ ට කියුබානු පුරවැසි භාවය හිමිවිය.

කියුබානු විප්ලවයෙන් අනතුරුව කියුබාවේ ඇමතිවරයකුව සිටි මෙම විප්ලවීය නායකයාට සිව් මසක රාජතාන්ත්‍රික සංචාරයක නිරතවීමට සිදුවිය.

එම සංචාරය තුළදී අප්‍රිකා යුරෝපා මෙන්ම ආසියාකරයේ රටවල් සමුහයක් වෙත චේ පැමිණ ඇත. මේ අතුරින් 1959 අගෝස්තු මස 07 වනදින ශ්‍රී ලංකාවටද මෙම අසහාය පුද්ගලයා පැමිණ ඇත.

මෙම රාජතාන්ත්‍රික සංචාරයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ මෙරට තේ, පොල්, රබර් වගාවන් පිළිබඳව සහ මෙරට කම්කරු ජනතාව පිළිබඳ කරුණු සොයා බැලීමටයි.

සිය සංචාරයේදී සදානුස්මරණීය මතක සටහනක් ශ්‍රී ලාංකිකයන්ට මෙන්ම ජගත් ප්‍රජාවටම තිළිණ කිරීමටද චේ අමතක නොකළේය.

1959 අගෝස්තු මස 08 වන දින යහල කැලේ වතුයායට පැමිණි චේ එහිදී මහෝගනී පැළයක් රෝපණය කර ඇත.

''මම ශ්‍රී ලංකාවේ පරිසරයට ආදරෙයි. මගේ ගමන සිහිවෙන්න හොඳම මාර්ගය මෙයයි'' පැවසූ චේ සමරු පොතක සටහන් තබනවා වෙනුවට මෙම මහෝගනී පැළය රෝපණය කල බව කියැවේ.

ඉතා රමණීය ගෙළයනක් සහිත හොරණ යහලකැලේ බංගලා භූමියේ එදා චේ සිටවූ මහෝගනී පැළැටිය අද දසත විහිදී ගිය දැවැන්ත වෘක්ෂයකි.

පාසැල් වියේ සිටම පරිසරයට දේශ සංචාරයට දැඩි කැමැත්තක් දැක්වූ එසේම විප්ලවීය දේශපාලනයේ ගෞරවනීය නායකයකු වූ අර්නොස්ටෝ චේගුවේරා 1969 ඔක්තොම්බර් මස 09වන දින බොලිවියාවේ කඳුකර පෙදෙසකදී සදහටම නෙත් පියා ගත්තත් ඔහුගේ පහස ලද ඒ සමරු ශාකය අදටත් ගාම්භීරව නැගී සිටී.

කියුබානු තානාපති කාර්යාලය මගින් විටින් විට මෙම සුවිශේෂීය ශාකය අසළ චේ සමරු උත්සව පවත්වන අතර චේ විසින් රෝපණය කළ දැනට ලොව පවතින එකම ශාකය මෙය ලෙසටද සැලකේ.

චේගුවේරා මෙන්ම අතීතයේ සිට විවිධ ප්‍රභූ පිරිස් එක්රැස්වූ භූමියක් ලෙස යහලකැලේ බංගලාව හැඳින්විය හැක. ධනවත් වැවිලිකරුවකු වූ ජී.එල්.ඩී. පිරිස් මහතා සතුවූ මෙම බංගලාවට නිතරම විවිධ ජන නායකයින් ඇතුලු දෙස් විදෙස් ප්‍රභූ පිරිස් පැමිණ ඇත. එසේම මම අලංකාර උද්‍යානය සැලසුම් කර ඇත්තේ සුප්‍රකට උද්‍යාන නිර්මාණකරුවකු වූ බේවිස් බාවා විසින් බව කියැවේ.

විවිධ අවස්ථාවලදී මෙම ගෙළයනට පැමිණි රාජ්‍ය නායකයන් මෙම උයනේ පැළයක් රෝපණය කිරීමටද අමතකකර නැත. ඒවා අද දැවැන්ත වෘක්ෂයන් වී නිහඬව ඒ අතීතය කියාපායි.

# ලෙනාඩ් වුල්ෆ් ට සෙවන සැලසූ මීගහජඳුර සියඹලාව



**ශාකයේ නම** : සියඹලා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Tamarindus indica*

**භාවිතා වන නම** : මීගහජඳුර සියඹලාව

**ශාකයේ පිහිටීම** : මීගහජඳුර ග්‍රාමයේ

**පිවිසුම් මාර්ගය**

සූරියවැව හම්බේගමුව ප්‍රධාන මාර්ගයේ පැමිණ මීගහජඳුරට පැමිණිය හැකිය.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 50 ක් පමණ වන අතර, කඳේ වට ප්‍රමාණය අඩි 24 ක් පමණ වේ. ශාක කඳ දැඩි ලෙස ඇඹරුනු ස්වභාවයක් පෙන්වයි. අතුපතර මැනවින් විහිදී ඇත.

**ශාකයේ ඉතිහාසය**

ශ්‍රී ලංකා සිවිල් සේවයේ ආධුනික නිලධාරියකු වශයෙන් පත්වූ ලෙනාඩ් වුල්ෆ් මහතා 1904 ඔක්තෝම්බර් මස පී. ඇන්ඩ් ඕ. සිරියා නෞකාවෙන් ශ්‍රී ලංකාව බලා පිටත් වුයේ එහි සිවිල් නිලධාරියකු වශයෙන් සේවය කිරීමේ අදිටනිනි. ශ්‍රී ලංකාවට පැමිණීමෙන් අනතුරුව 1904 සිට 1907 දක්වා වසර 03 ක් කාර්යාල සහයක නිලධාරියකු වශයෙන් යාපනයේ සේවය කළ වුල්ෆ් මහාතා 1907 සිට 1908 දක්වා මහනුවර කච්චේරියේ කාර්යාල සහයක වශයෙන් කටයුතු කරන ලදී.

1908 දි හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහකාර ඒජන්ත පදවියට පත්වු ලෙනාඩ් වුල්ෆ් මහතා තම ලේඛන කලාවේ ස්වර්ණමය නිර්මාණයන් රැසක් හම්බන්තොට ජන ජිවිතයත්, පරිසරයත් අලලා රචනා කරන ලදී. ස්වකීය නිර්මාණයන් තුළ කටුක ජන ජිවිතයේ ඇතුලාන්තය විදහා දැක්විමට සමත් වු මේ අසහාය පුද්ගලයා වරෙක දරුඬු වු පරිපාලන නිලධාරියකු ලෙසද, විනිශ්චයකරුවකු ලෙසද ජනතාව හඳුන්වන ලදී. එසේම වරෙක ඔහු මෘදු මොලොක් හදවතක් ඇති නිලධාරියකුද විය. ඒ හැමටම වඩා ඔහු පරිසරයේ චමත්කාරය වඩා විචිත්‍රවත් ලෙස පෑන් තුඩට හසු කරගත් නිර්මාණ ශිල්පියකු ලෙස හැඳින්විය හැක. වසර 07 ක ශ්‍රී ලංකා සේවයෙන් පසු 1911 මැයි 24 ලන්ඩනය බලා ශ්‍රී ලංකාවෙන් නික්ම ගියේය. හම්බන්තොට සිය සේවා කාලය තුළ නිතර පරිසර සංචාරයේ තමන් යෙදුණු බව ලෙනාඩ් වුල්ෆ් මහතාගේ දින සටහන්හි සඳහන් ව ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මීගහජඳුර ප්‍රදේශයේ පවතින යෝධ සියඹලා ගස යට, ප්‍රදේශයේ නඩු විසදීම ලෙනාඩ් වුල්ෆ් මහතා විසින් සිදුකළ බව ප්‍රදේශයේ ජනතාව පවසන අතර පරම්පරා ගණනක් තිස්සේ තවමත් මේ සියඹලා ගස නිසොල්මනේ ඇත.

මෙම අද්විතීය පුද්ගලයාගේ දින සටහන් ආශ්‍රයෙන් ලක්බිමේ සත් වසක් නැමැති කෘතිය රචනා කළ සුවිශේෂීය ශ්‍රී ලාංකික පරිවර්ථකයෙකු වු ප්‍රේමචන්ද්‍ර අල්විස් මහතා ඉහත කෘතියේ ලෙනාඩ් වුල්ෆ් වෙනුවෙන් තැබු සටහන් අවසන් වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

''අධිරාජ්‍ය වාදියෙකු වශයෙන් ලංකාවට පැමිණ අධිරාජ්‍යවාදයට ම සේවය කළ නමුත් මේ රටේ ජනතාව කෙරෙහි මේ වියතා හෙළු දෘෂ්ටිය අධිරාජ්‍යවාදි එකක් නොවිම ඇතැම් විට කෙනෙකුගේ විශ්මයටද හේතුවනු ඇත.''

# හංවැල්ල තානායමේ කොස් ගස



**ශාකයේ නම** : කොස්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Artocarpus heterophyllus*

**ශාකයේ පිහිටීම**

හංවැල්ල නගරයේ පිහිටි හංවැල්ල තානායම් භූමියේ කැළණි ගඟ අසබඩ මෙම ශාකය පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

කොළඹ සිට කඩුවෙල හරහා හෝ රත්නපුර දෙසින් නම් අවිස්සාවේල්ල හරහා පහසුවෙන් හංවැල්ල තානායමට ළඟා විය හැක.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 60 - 70 ක් පමණ වේ. වටප්‍රමාණය අඩි 15 අඟල් 05 කි. ශාකයේ මුල සිට අඩි 10 කින් පමණ අතු බෙදී ඇත. 2004 වසරේ පෙබරවාරි මස තොරතුරු රැස් කරන විට ඵල දරා තිබුණි. ශාකයේ අතු පතර විහිදීම මැනවින් සිදුවී ඇති අතර ඒ මත අපිශාක වර්ධනය වී ඇත. ශාකයේ මුල

සමරු ඵලකයක් සවි කර ඇති අතර එහි This Jack Tree was planted by Edward VII Prince of Wales of Commemorate his visit to Ceylon in December 1875 ලෙස සඳහන් වේ. එඩ්වඩ් රජු තම ගමනේදී මෙම බලකොටුව නැරඹීමට පැමිණියාද විය හැකිය. වර්තමානයේ හංවැල්ල පාලම අසළ හංවැල්ල තානායම දෙසට වන්නට දැක ගත හැකි දැවැන්ත සියඹලා ගසද එඩ්වඩ් රජු විසින්ම රෝපණය කළ ශාකයක් බවට විශ්වාසයක් ඇතත් එය පිළිබඳ වැඩිදුර විස්තර සොයා ගැනීමට අපොහොසත් විය. එසේම අතීතයේදී මේ අසළම නා ගසක් පැවති බවත් පසුකාලයේදී පාලම ඉදිකරන විට එම ශාකය කපා දමන ලද බවත් ප්‍රදේශයේ වයෝවෘද්ධ පුද්ගලයෙකුගෙන් තොරතුරු විමසීමෙන් අනාවරණය විය. ( මෙම තොරතුරු ස්ථිර කරගැනීමට සාක්ෂි නොලැබිණි.)

1875 වසරේ සිදු වු එඩ්වඩ් රජුගේ ලංකා සංචාරයේදි සමරු ශාක කිහිපයක්ම රෝපණය කර ඇති බවට සාක්ෂි ඇත. මෙම ශාකය බෝහෝ විට එඩ්වඩ් රජු එවකට වෑවල ප්‍රදේශයේ පැවති ඇත් ගාලක් නැරඹීමට යන අතරමගදී රෝපණය කරන්නට ඇතැයි සිතිය හැක.

අතීතයේ මෙම තානායම පැවති ගොඩනැගිල්ල ඉංග්‍රීසි බලකොටුවක් (හංවැල්ල බලකොටුව) වූ අතර එහි ආරක්ෂාව සඳහා පැවති දිය අගල අදටත් දැකගත හැක.



හත්වන එඩ්වඩ් රජු රෝපණය කළා යැයි සැලකෙන සියඹලා ගස
(නිත්‍ය වශයෙන් තහවුරු කිරීමට සාධක නැත)

# එඩ්වඩ් රජු රෝපණය කළ සල් ගස



**ශාකයේ නම** : සල්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Couroupita surinmensis*

**ශාකයේ පිහිටීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ උතුරු කරඳන වෑවල රබර් වත්තේ (බළංගොඩ වැවිලි සමාගමට අයත්) ප්‍රධාන පිවිසුමෙන් මීටර් 25 ක් පමණ ඉදිරියට වන්නට මෙම ශාකය පිහිටා ඇත.

**ශාකයේ ස්වභාවය**

මෙම ශාකයේ උස අඩි 50 පමණ වන අතර කඳේ වට ප්‍රමාණය අඩි 9 අගල් 1 කි. ශාකයේ ඉහළින් අතු පතර විහිදී ඇති අතර ශාකයේ කඳේ පුෂ්ප හා ඵල විශාල සංඛ්‍යාවක් පවතී. මෙම ශාකයේ මල් දක්නට නොමැති කාලයක් නැති බවත් සැමදාම එක ලෙස පුෂ්ප දරන බවටත් පැවසේ.

**ඓතිහාසික පසුබිම**

එඩ්වඩ් රජු වර්ෂ 1875 දී ශ්‍රී ලංකාවට සැපත්වී ඇති අතර එම ගමනේ දී එතුමන් විසින් ශාක කිහිපයක්ම රෝපණය කර ඇති බවට සාක්ෂි හමුවේ. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ඔහු විසින් රෝපණය කළ කොස් ශාකයක් ඇති අතර එහි නාම පුවරුවේ රෝපණය කළ වර්ෂය 1875 ලෙස පමණක් සටහන් වේ. හංවැල්ල තානායමේ තවත් කොස් ගසක් එඩ්විඩ් රජු විසින් රෝපණය කර ඇති අතර එහි දිනය 1875 දෙසැම්බර් ලෙස සටහන් වේ.

එඩ්වඩ් රජු ශ්‍රී ලංකා සංචාරයේදි වර්තමාන කලටුවාව ජලාශය පවතින ප්‍රදේශයේ සංචාරය කළ බවත් එවකට එහි පැවති ඇත්ගාලක් නැරඹීමට එම ගමන යොදාගත් බවත් කිය වේ. එම ඇත්ගාල නරඹා දැන් මෙම වතුයාය පවතින ප්‍රදේශය හරහා රජු ගමන් ගත් බවත් එහිදි එම සංචාරය සිහිවීමට මෙම සල් ශාකය සිට වු බවත් පැවසේ.

මෙම සංචාරයට රජු පැමිණියේ හංවැල්ල ප්‍රදේශය හරහා විය යුතු බැවින් මෙහි ඉහත සදහන් එඩ්වඩ් රජු රෝපණය කළ හංවැල්ලේ පවතින කොස් ගසද මෙම ගමන අතර වාරයේදිම රෝපණය කරලිමට බොහෝ දුරට ඉඩ ඇත.

එසේම මෙම සල් ගසට අමතරව තවත් ශාක කිහිපයක් එඩ්වඩ් රජු විසින් වෑවල වත්තේ රෝපණය කර ඇති බව සොයා ගැනීමට හැකි විය.

මෙම ශාක අතර සියඹලා ගසක්, කොස් ගසක් හා අඹ ගසක් තවමත් ජීවමානව දැක ගත හැක.



එඩ්වඩ් රජු රෝපණය කලා යැයි සැලකෙන සියඹලා ගස

# නාවින්න ආයුර්වේද පර්යේෂණ ආයතනයේ සමරු ශාක



**ශාකයේ නම** : සුදු සඳුන්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Santalum album*

**ශාකයේ පිහිටීම**

නාවින්න ආයුර්වේද වෛද්‍යායතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපිට.

**පිවිසුම් මාර්ගය**

මහරගම නගරයෙන් ආරම්භවන පරණ නාවින්න පාරේ මද දුරක් ගමන් කළ විට ආයුර්වේද වෛද්‍යායතනය හමුවේ. එහි ප්‍රධාන පිවිසුමෙන් දිවෙන මාවතේ ප්‍රධාන ගොඩනැගිල්ල දෙසට ගමන්කර මෙම ශාකය වෙත පැමිණිය හැක.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 15 ක් පමණ වන අතර හොඳින් අතුපතර බෙදී ඇත.

**ඉතිහාසය**

වර්ෂ 1962.10.14 වන දින නාවින්න ආයුර්වේද ආයතනය උත්සවාකාරයෙන් විවෘතකර ඇති අතර, එය සිහිගැන්වීම සඳහා එවකට අග්‍රාමාත්‍ය ධූරය දැරූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය විසින් මෙම ශාකය රෝපණය කරන්නට යෙදී ඇත.

# ජවහල්ලාල් නේරු තුමන් විසින් රෝපණය කළ ගම්මාලු ගස



**ශාකයේ නම** : ගම්මාලු

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Pterocarpus marsupium*

**ශාකයේ පිහිටීම**

නාවින්න අයුර්වේද වෛද්‍යායතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපිට

**පිවිසුම් මාර්ගය**

මහරගම නගරයෙන් පරණ නාවින්න පාරේ මඳ දුරක් ගමන් කර නාවල ආයුර්වේද වෛද්‍යායතනයට පිවිස එහි ප්‍රධාන ශාලාව ඉදිරිපිටට පැමිණීමෙන් මෙම ශාකය දැක ගත හැක.

**ශාකයේ ස්වාභාවය**

මෙම ශාකයේ උස අඩි 15-20 ක් පමණ වන අතර, කඳේ වට ප්‍රමාණය අඩි 3 ක
පමණ වේ. ඉතාමත් මැනවින් අතුපතර බෙදෙමින් වර්ධනය වී ඇති මෙම ශාකය තොරතුරු රැස්කරන සමයේ එනම් (සැප්තැම්බර් මස) වනවිට එලදරා තිබුණි.

**ඓතිහාසික වැදගත්කම**

මෙම ශාකය රෝපණය කර ඇත්තේ 1962.10.14 දින හිටපු ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී ජවහල්ලාල් නේරු තුමන් විසිනි. නාවින්න ආයුර්වේද වෛද්‍යායතන උත්සවාකාරයෙන් විවෘත කිරීමේ උළෙලට පැමිණි එතුමන් එම අවස්ථාව සිහිවීම පිණිස මෙම ශාකය රෝපණය කර ඇත.

# රූමස්සල වැල්ලෙදේවාලයේ කොන්තාලම් ගස





**ශාකයේ නම** : කොන්තාලම්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Xylocarpus rumphii*

**ශාකයේ පිහිටීම**

ගාල්ල දිස්ත්‍රික්කයේ උණවටුන වෙරළ තීරයේ කෙළවර පිහිටි වැල්ලේ දේවාල භූමියේ

**පිවිසුම් මාර්ගය**

ගාල්ල මාතර ප්‍රධාන මාර්ගයේ ගාල්ල නගරයේ සිට කි.මී.1 1/2 පමණ මාතර දෙසට ගමන් කළ විට හමුවන උණවටුන වෙරළ තීරයට දිවෙන මාවත ඔස්සේ ගමන්කර උණවටුන වෙරළට පැමිණ එහි කෙලවර පිහිටි වැල්ල දේවාල භූමියට පැමිණීමෙන් මෙම දුර්ලභ ශාක දැකගත හැක.

**ශාකයේ ස්වාභාවය**

මෙම ශාකවල උස අඩි 50 ක් පමණ වන අතර, අඩි 10 කින් පමණ අතුබෙදීම ඇරඹී ඇත. ශාකයේ මුල ආශ්‍රිතව කුහර දැකගත හැකි අතර එය වීදුරු බෝතල් වැනි අපද්‍රව්‍ය වලින් පිරී ඇත. කඳේ වට ප්‍රමාණය අඩි 5ක් පමණ

වේ. ශාකයේ පුෂ්ප ප්‍රමාණයෙන් කුඩා වන අතර පොකුරු ලෙස හට ගනී. සුදු පැහැති කුඩා පෙති 04ක් පුෂ්පයෙහි ඇත.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

මෙම ශාක මෙරට ඉතාමත් දුර්ලභ ශාක විශේෂයක් ලෙස හඳුන්වයි. දැනට වාර්තාවන පරිදි මෙම විශේෂයේ තවත් ශාක ඉතාමත් අතලොස්සක් පමණක් දිවයිනේ පවතී. දේශීය පාරම්පරික වෙදකමේ සුවිශේෂීය ඖෂධයක් වන ගොපලු ගුලිය, විවිධ රෝගාබාධ 12කට ප්‍රත්‍යක්ෂ ඔසුවක් ලෙස ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ භාවිතා වෙයි. මෙම ඖෂධය සමග ගන්නා අනුපාන මගින් මෙසේ විවිධ රෝගාබාධ සඳහා භාවිතා කළ හැකි බව ආයුර්වේදයේ සඳහන් වේ.

පළා පැහැගත් දෙළුම් ගෙඩියක් සිහිපත් කරන කොන්තාලම් ශාකයේ ඵලය හේතුවෙන් එයට මුහුදු දෙළුම් යන අන්වර්ත නාමය පටබැඳී ඇති අතර ආයුර්වේදයේ දී සමුදුරු යන නම භාවිතා වනබව අහංගම සුමනජෝති නාහිමිපාණන් විසින් පද්‍යයට නැගුණු ගොපලු ගුලි වට්ටෝරුවේ මෙම කවියෙන් පැහැදිලි වේ.

තිපල් තිකුළු තිවග ඉවද - අසමොද වදකහ සමඟින
නිමල අබද මේකුළු සහ දෙදුරු ලසුනු කොට්ටම් ගෙන
කලල කෙළිඳ ඇට මෙම සැම සමව වළඟසාල් රැගෙන
සියල් මෙකී බරට කිරෙන් තම්බාගත් ''සමුදුරු'' මැන

# හබ්බේගමුව විහාරයේ මදාරා ගස



| | | |
|---|---|---|
| **ශාකයේ නම** | : | මදාරා |
| **උද්භිද විද්‍යාත්මක නාමය** | : | *Cleistanthus collinus* |
| **භාවිතා වන නම** | : | හබ්බේගමුවේ මදාරා ගස |
| **ශාකයේ පිහිටීම** | : | හබ්බේගමුව විහාර භූමියේ |

**පිවිසුම් මාර්ගය**

තණමල්විල සිට තිබොල්කැටියට ඇති මාර්ගයේ පැමිණ හබ්බේගමුව හංදියෙන් හැරී හම්බේගමුව විහාරයට පැමිණිය හැකිය.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ කඳ මුල සිට අඩි 6 කින් පමණ ශාඛා දෙකකට බෙදේ. ශාකය අඩි 30 ක් පමණ උසකින් යුක්තය. ශාකයේ කඳෙන් පොතු ඉවත්කරගෙන ඇති බව පැහැදිලිව පෙනේ. මිනිස් උසට වඩා වැඩි උසකින් ශාකයේ පොතු ඉතිරිව ඇත.

**වැදගත්කම**

මෙම ගසේ පොතු ළඟ තබාගත්විට අලින්ගෙන් අනතුරුවීම වළකින බවට ප්‍රදේශයේ ජනතාව අතර මතයක් ඇත. මදාරා දුර්ලභ ශාක විශේෂයකි. හස්තීන් මදාරා ශාකයට බියක් දක්වන බවට විශ්වාසයක් ඇත. අතීතයේ විසූ මඩුවන්වල දිසාව සතුව මදාරා ලීයෙන්කල බස්තමක් තිබූ බවත් ඔහු පණාමුරේ ඇත්ගාලට යනවිට එම බස්තම ද රැගෙන ගිය බවත් ජනවහරේ ඇත. එහිදී ඉතාමත් චණ්ඩ හස්තීන් පවා ඔහුට කීකරු වූ බව කියැවේ.

තොරතුරු රැස්කරන අවදියේ හම්බේගමුව විහාරයේ භික්ෂූන් වහන්සේ නමක් වැඩ නොසිටි අතර, විහාර භූමිය පාළුවට ගොසින් තිබුණි.

අප අතරින් වියෝ වූ පරිසරවේදී ශ්‍රී ලාල් නිශාන්ත හෙට්ටිආරච්චි මහතා විසින් රචනාකල අසිරිමත් උඩවලව ග්‍රන්ථයේ මෙම ශාකය පිළිබඳව තොරතුරු සඳහන්ව ඇත.

# යෝධ වල්බිලිං ගස



**ශාකයේ නම** : වල් බිලිං

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Meliosma arnottiana*

**ශාකයේ පිහිටීම**

මාතලේ නගරයේ පිහිටි නානායක්කාර උද්‍යානයේ

**පිවිසුම් මාර්ගය**

මාතලේ නගර මධ්‍යයේ පිහිටි නානායක්කාර උද්‍යානයේ ප්‍රධාන පිවිසුමෙන් ඇතුල් වී මද දුරක් ඉදිරියට ගියවිට මෙම ශාකය දැකගත හැක.

**ශාකයේ ස්වභාවය**

දැවැන්ත ශාකයක ස්වරූපය ගන්නා මෙහි වට ප්‍රමාණය අඩි 17 අඟල් 11 කි. ශාකයේ අතු බෙදීම ඉතා ඉහළින් සිදු වී ඇති අතර අතුපතර විහිදීම මනාව සිදු වී ඇත.

**ඉතිහාසය**

මෙම ශාකය රෝපණය කළ දිනයක් හෝ යම් සුවිශේෂීය හේතුවක් පිළිබඳ තොරතුරු නොමැත. දැවැන්ත ශාකයකි.

# මාතලේ නිල් වෙරළු ගස



**ශාකයේ නම** : නිල් වෙරළු

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Elaeocarpus ganidrus*

**ශාකයේ පිහිටීම**

මාතලේ නගරයේ පිහිටි නානායක්කාර උද්‍යානයේ

**පිවිසුම් මාර්ගය**

මාතලේ නගර මධ්‍යයේ පිහිටි නානායක්කාර උද්‍යානයේ ප්‍රධාන පිවිසුමෙන් ඇතුල් වී මඳ දුරක් ඉදිරියට ගියවිට මෙම ශාකය දැකගත හැක.

**ශාකයේ ස්වභාවය**

මෙම ශාකයේ උස අඩි 50-70ක් පමණ වන අතර කඳේ වට ප්‍රමාණය අඩි 5 අගල් 6ක් පමණ වේ. ශාකයේ අතුබෙදීම තරමක් ඉහළින් සිදුවී ඇති අතර අතු අගිස්සේ පොකුරු ආකාරයට නිල්වෙරළු හටගනී. දත්ත රැස්කිරීම නොවැම්බර් මාසයේ සිදුකරන විට නිල් පැහැති ඵල සුලභව දැකගත හැකි

විය. එල නිල් පැහැයට පත්වන්නේ ඒවා ඉදීමට ආසන්න වන විට බව කියැවේ. ළපටි අවස්ථාවේදී එල කොළ පැහැයක් ගනී.

**ඉතිහාසය**

මෙම ශාකයේ වයස නිශ්චිතව නොදන්නා අතර පේරාදෙණිය උද්භිද උද්‍යානයේ හැරුනු විට නිලිවෙරළු ගසක් ඇත්තේ මෙය පමණක් බව ජනතාවගේ විශ්වාසයයි. සංචාරක පක්ෂියකුගේ මාර්ගයෙන් මෙම ශාකය හටගන්නට ඇතැයි විශ්වාස කෙරේ.

මෙම ශාකයට ආසන්නව පැරණි මාතලේ බලකොටුවේ පවුරේ නටබුන් අදටත් දැකගත හැක.

# මුට්ටි ගස හෙවත් පෙට්ටි ගස



**ශාකයේ නම** : මුට්ටි ගස හෙවත් පෙට්ටි ගස

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Xylocarpus granatum*

**ශාකයේ පිහිටීම**

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොල්අතුමෝදර දුම්රිය ස්ථානය ඉදිරිපිට.

**පිවිසුම් මාර්ගය**

ගාල්ල මාතර ප්‍රධාන මාර්ගයේ පොල්අතුමෝදර පාලම අසළින් වමට හැරී කි.මි.1/2 පමණ ගමන්කර පොල්අතුමෝදර දුම්රිය ස්ථානය ඉදිරිපිටට පැමිණීමෙන් මෙම ශාකය දැකගත හැකිය.

**ශාකයේ ස්වභාවය**

ප්‍රදේශවාසීන් පවසන අන්දමට දැනට ශ්‍රී ලංකාවේ මෙම වර්ගයේ වෙනත් ශාකයක් නොමැති අතර මීට සමාන ශාකයක් කල්පිටියේ පවතින බව කියැවේ.

**ශාකයේ ඓතිහාසික පසුබිම**

ශාකය පුෂ්ප හටගන්නා නමුත් එයින් ඵල ඇති නොවන බවත් එසේම ශාකයේ පත්‍ර හා පොතු දේශීය වෛද්‍ය ක්‍රමයට භාවිතා කරන බවත් පැවසේ. ශාකය පිළිබඳ යම් අධ්‍යයනයන් රුහුණු විශ්ව විද්‍යාලය මගින් සිදුකරන අතර ශාකය හඳුනාගැනීමට පුවරුවක්ද සවිකර ඇත.

# ගැහැණුවෙල රුක්අත්තන ගස



**ශාකයේ නම** : රුක්අත්තන ශාකය

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Alstonia scholaris*

**පිවිසුම් මාර්ගය**

පාදුක්ක පරණ මීගොඩ පාරෙන් ගැහැණුවෙල ප්‍රදේශයට පැමිණිවිට මෙම සුවිශේෂිය වෘක්ෂය දැකගත හැක. පුද්ගලික ඉඩමක පවතින මෙම ශාකය ප්‍රදේශයේ ජනතාවගේ විශේෂිත ගෞරවයට පාත්‍රවූ වස්තුවක් ලෙස හැඳින්විය හැක.

**ශාකයේ ස්වභාවය**

ප්‍රදේශවාසීන් පවසන්නේ දැනට මෙම ශාකයට වසර 300 ක් තරම් වයස වියහැකි බවයි. ඉතා දැවැන්ත ශාකයක් වන මෙය අඩි 70 ක් පමණ යනතුරු අතුබෙදී නැත.

ගසමුල විශාල ප්‍රදේශයක ශාකයේ මුල් පැතිර පවතින අතර භූමියට ආසන්නව ශාකයේ කඳ ප්‍රදේශයේ විශාල තුඹසකි.

අතීතයේ දේව දාන සඳහා රෝපණය කරනලද කිරි ගසක් ලෙස මෙම රුක්අත්තන ගස හඳුන්වන අතර මෙම ශාකයට යම් හානියක් කළහොත් එම තැනැත්තාට විවිධ දුක් කම්කටොලු වලට මුහුණ දීමට සිදුවන බව ප්‍රදේශවාසීන් සලකයි.

ආසන්නයේ පවතින විහාරයේ සිට මෙම ශාකයට දේවතාඑළි පැමිණෙන බව දුටු පුද්ගලයන් කීපදෙනෙකු තොරතුරු සමීක්ෂණයේදී හමුවිය. නිතරම මෙම ශාකයේ දෙබර වද දැකගත හැකි අතර තොරතුරු රැස්කිරීමට මාස 2කට පෙර මෙම ශාකයේ දෙබර වද 21ක් තිබුණ බව කියැවිනි.

අතීතයේ මෙම ගස මුල දේවාලයක් තිබු බවද, පසුව එය එතනින් ඉවත්කර ඇති අතර වර්තමානයේ සෑම දිනකම මෙම ශාකය පාමුල පහනක් දැල්වීම සිදුකරයි. ප්‍රදේශවාසීන් සිදුකරන ආරම්භ කරන ඕනෑම කටයුත්තකදී මෙම ශාකයට බාරකරවීමද අදටත් දැකිය හැක.

# සල්ගල වන අරණේ යෝධ ගස



**ශාකයේ නම** : මහ මුගුන්න

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Tetrameles nudiflora*

**ශාකයේ පිහිටීම**

සල්ගල ආරණ්‍ය සේනාසන භූමියේ ප්‍රධාන පිවිසුමින් ඇතුලුවී මීටර් 50ක් පමණ ඉදිරියට ගමන්කරන විට වම්පසට විහිදෙන මංපෙතක් හමුවේ. එහි මීටර් 100ක් පමණ දුරින් ශාකය පිහිටා ඇත.

**පිවිසුම් මාර්ගය**

වරකාපොල නගරයේ සිට දිවෙන අගුරුැල්ල පාරේ ගමන්කර ගලපිටමඩ නගරයෙන් සල්ගල ආරණ්‍ය සේනාසනයට පිවිසිය හැක.

## ශාකයේ ස්වභාවය

වන අරණේ ගල් පර්වත සහිත බෑවුම් ප්‍රදේශයක ඇති මෙම ශාකය පිහිටා ඇත. ශාකයේ කඳේ වට ප්‍රමාණය මැනීම ඉතාමත් අපහසු අතර ප්‍රදේශයේ ජනතාව පවසන්නේ එය වට අඩි 50-60ක් තරම් වන බවයි. අඩි 100ක් තරම් උසට විහිදෙන මෙම ශාකයේ අතු බෙදීම ඉතා ඉහළින් සිදුවේ. ශාකයේ මුල ආධාරක මුල් ලෙස ඉතාමත් දුරට පැතිරී ඇති අතර කඳට සම්බන්ධ ස්ථාන ඉතා විශාලය.

## ශාකයේ ඓතිහාසික පසුබිම

සල්ගල පැරණි වනාන්තරයක් බවට ඓතිහාසික සාධක ඇත. මගදයන් සමඟ සටනින් පරාජයට පත්වූ වලගම්බා රජු මෙම වනයේ සැඟවුනු බවට ජනප්‍රවාදයේ පවතී. වර්තමානයේද මෙම දැවැන්ත ශාකය අසලම ගල්ලෙනක ස්වරූපය ගන්නා විවරයක් දැකගත හැක. එය උමගක් බවට විශ්වාස කරන අතර එහි තවත් එක් පිවිසුමක් ආරණ්‍ය සේනාසනයේ වෙනත් පසෙක තිබෙන බව පවසයි. අතීතයේ වලගම්බා රජු මෙම උමග භාවිතා කර සිය ගමන් සිදුකළ බවත් විශ්වාස කරයි. ප්‍රදේශයේ ජනතාව පවසන්නේ මෙම ශාකය හමුවන්නේ සල්ගල ආරණ්‍ය සේනාසනයේදී පමණක් ම බවයි.

# ඕපනායක යෝධ පුස්වැල



**ශාකයේ නම** : පුස්වැල

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Entada pusaetha*

### ශාකයේ පිහිටීම

රත්නපුර දිස්ත්‍රික්කයේ ඕපනායක නගරයේ රත්නපුර බළංගොඩ ප්‍රධාන මාර්ගයේ වේ ගඟ ඉවුරේ මෙම ශාකය පිහිටා ඇත.

### පිවිසුම් මාර්ගය

මෙම ශාකය රත්නපුර බළංගොඩ මාර්ගයට යාබදව ඕපනායක නගරයේ පිහිටා ඇති බැවින් ශාකය නැරඹීම සඳහා පිවිසුම ඉතා පහසුය.

**ශාකයේ ස්වභාවය**

ශාකයේ ප්‍රධාන කඳ පොළවට සම්බන්ධ විම, වේ ගඟ ට ඉතාම සමීපව ගඟ ඉවුරේ පිහිටා ඇත. අඩි 15 කින් පමණ වර්ධනය වී ශාඛා කිහිපයකට බෙදි යයි. ඉතා විශාල ප්‍රදේශයක මෙම ශාකය පැතිරී නොමැති අතර, ප්‍රමාණයෙන් විශාල ශාඛාද නොපවතී. ශාකයේ වයස දළ වශයෙන් වසර 200 - 300 ක් පමණ යැයි ප්‍රදේශයේ ජනතාව විශ්වාස කරනු ලබන අතර අතිතයේ වේ ගඟේ අනෙක් ඉවුරේද මෙම පුස්වැල් පැතිර තිබී ඇත. නමුත් වරින් වර ඇති වු ගං වතුර තත්ත්වයන් මගින් එම ශාක විනාශ වී ඇත. ඒ සමඟම එහි පැතිර තිබු පුස්වැලේ කොටස් විනාශ වු බව කියැවේ.

# කුරුළු කැලේ පුස්වැල



**ශාකයේ නම** : පුස්වැල්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Entada pusaetha*

**ශාකයේ පිහිටීම**

කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුරුළු කැලය රක්ෂිතය තුළ

**ශාකයේ ස්වභාවය**

ආරම්භයේදී ශාකයේ කඳේ වට ප්‍රමාණය අඩි 6ක් පමණ වන අතර වර්ග අඩි 800 ක පමණ ප්‍රමාණයක පැතිර ඇත. ශාකයේ වයස දල වශයෙන් වසර 300 ක් පමණ වන බව පවසන අතර සමහර අතු පතර දිරාපත්ව කඩා වැටී ඇත. ශාකයේ දිරාගිය කොටස්වල වැසි ජලය රැස්වී දිරා යාම ශීඝ්‍ර කර ඇති අතර සමහර ස්ථානවල වේයන් වැනි කෘමින්ගේ හානියද දැකිය හැක.

අදාළ ශාකය වර්තමානය වන විට රක්ෂිත වනයක් තුළ පිහිටි බැවින් යම් ආරක්ෂාවක් සැලසී ඇතත් අදාළ ශාකය සංරක්ෂණයට වැඩිමනත් රාජ්‍ය අනුග්‍රහයක් අවශ්‍ය වන බව තොරතරු සැපයූ ශ්‍රී ලංකා පරිසර ගවේශන සංගමය පවසන ලදි . එසේම අදාළ සංගමය මගින් ප්‍රකාශයට පත්කර ඇති Kurulu Kele Area of the Kegalle Santuray යන ප්‍රකාශනයේ අදාළ ශාකය පිළිබඳවත් කුරුලු කැලේ රක්ෂිතය පිළිබඳවත් තොරතුරු අඩංගු වේ .

# මාලඹේ නගරයේ කරුවල ගස



**ශාකයේ නම** : කරුවල

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Diospyros ebenum*

**ශාකයේ පිහිටීම**

මාලඹේ නගර මධ්‍යයේ

**පිවිසුම් මාර්ගය**

රාජගිරිය බත්තරමුල්ල හරහා හෝ ගම්පහ කඩුවෙල හරහා පහසුවෙන්ම මාලඹේ නගරයට ළඟාවිය හැක. නගර මධ්‍යයේ පිහිටි පදික වේදිකාවේ මෙම වෘක්ෂය දැක ගත හැක.

**ශාකයේ ස්වභාවය**

මෙම ශාකයේ උස දල වශයෙන් අඩි 60 - 70 ක් පමණ වන අතර වට ප්‍රමාණය අඩි 6 අඟල් 3 කි. ශාකයේ බඳ පොළොව මට්ටමින් අඩි 15 කින් පමණ අතු බෙදීම අරඹා ඇත.

මෙම ශාකය සතුව ඓතිහාසික පසුබිමක් වාර්තා නොවන අතර මෙහි දැනට වයස වසර 125 ක් පමණ වන බව ප්‍රකාශ වේ. පුද්ගලික ඉඩමක රෝපණය කර ඇති මෙම ශාකය අදාළ ප්‍රදේශයේ මාවත් පුළුල් කිරීමේ දී මහා මාර්ගයේ පදික තීරුව අසල වර්තමාන තත්ත්වයට පැමිණ ඇත. ප්‍රධාන නගරය අවට පවතින දැනට වාර්තා ගතවන විශාලතම කරුවල ගසවන මෙය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රදේශවාසීන් දක්වන උද්‍යෝගය සඳහන් කළ යුතුම ය.

**පසුවදන**

මෙම ශාකය දැනට වසර කීපයකට පෙර කපා ඉවත්කර ඇත.

# මන්නාරමේ බැවොබාබ් ගස



**ශාකයේ නම** : බැවොබාබ් (අලි ගස් )

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Adansonia digitata* L.

**ශාකයේ පිහිටීම**

මන්නාරම නගර මධ්‍යයේ පිහිටා ඇත.

**ශාකයේ ස්වභාවය**

අති විශාල ලෙස වර්ධනය වන කඳන් මෙම ශාකයේ දැකිය හැක. ලද තොරතුරු අනුව මෙම ශාකයේ වට ප්‍රමාණය මීටර් 19.4 කි. ශාකයේ පුෂ්පය සුදු පැහැතිය.

රාත්‍රියේදී විවෘත වන පුෂ්පයන් ප්‍රධාන වශයෙන් වවුලන් මගින් පරාගනය වෙයි. පත්‍ර තරමක් විශාලය. තද කොළ පැහැතිය. මිනිස් අතක ඇඟිලි පිහිටන පරිදි මෙම පත්‍ර පිහිටා ඇත. ශාකයේ මුල ආශ්‍රිතව පොළව මතුපිටින් පාර්ශ්විකව ගමන් කරන මුල් දැකිය හැක. ඈතට මෙම ශාකය දිස්වන්නේ ගසේ මුල් ඉහලට සිටින ලෙසත්, අතු පොළොව යටට සිටින ලෙසත් පිහිටි ශාකයක් ලෙසය. මේ නිසාම බැවොබාබ් ගස් යකකු සිටවූ ගස් ලෙසද හඳුන්වයි. මන්නාරමේ පවතින ගස වසර 800ක් තරම් පැරණි බව පැවසේ. බැවොබාබ් යන වදන අරාබි භාෂාවෙන් පැමිණ ඇත.

අරාබියේ පවතින බුහිබාබ් (Buhibab)ශාකයේ නමින් එය පැවති බව

විද්‍යාඥයන් පිළිගන්නා අතර ශාකයේ නිජබිම මැඩගස්කරයයි. බැවොබාබ් ශාක මෙරටට පැමිණීම පිළිබඳව නිශ්චිතවම සාක්ෂි සොයාගත නොහැකි වුවත් ඒ පිළිබඳව වන ප්‍රධාන මතය වන්නේ අරාබි වෙළෙඳුන් විසින් මෙම ශාක ශ්‍රී ලංකාවට ගෙනෙන ලද බවයි. මන්නාරම අසළ මුහුදින් මුතු ලබාගැනීම සඳහා පැමිණි වෙළෙඳුන් තමන්ගේ අශ්වයන්ට කෑමට මෙම ගස් සිටවා ඇත.

බැවොබාබ් ශාකයේ ස්වභාවය නිසාම එය පරිසරයේ කැපී පෙනෙන අතර 1890 දී එවකට සිටි සුප්‍රකට උද්භිද විද්‍යාඥයකු වූ හෙන්රි ට්‍රයිමන් මහතාද මේ ගස පිළිබඳව තොරතුරු වාර්තා කර ඇත. වර්තමාන වාර්තා අනුව මන්නාරම් දිස්ත්‍රික්කයේ බැවොබාබ් ශාක 40 ක් පමණ වාර්තා වන අතර එයින් වැඩි සංඛ්‍යාවක් මේ වන විට විනාශ වී ඇත. යාපනය, විල්පත්තුව, පුත්තලම (ගංගේ වාඩිය) වැනි ප්‍රදේශ වලද බැවොබාබ් ශාකය පැතිර ඇති බව වාර්තා වන අතර එයින් බොහොමයක් මේ වන විට විනාශ වී ඇත.

අරාබි වෙළෙඳුන් මෙරටට පැමිණි මාර්ගයක් වන ඉන්දියාවේ රාමේෂ්වරම් හා මන්ඩපම් ප්‍රදේශවලදී ද මෙම ශාක කිහිපයක් කතෘ විසින් නිරීක්ෂණය කරන ලදී. එම ශාක වල පත්‍ර වදුරන් සඳහා ආහාර ලෙස භාවිතා කරන බවද එහිදී අනාවරණය වූ අතර අදාළ ප්‍රදේශය මන්නාරමට ඉතාමත් ආසන්න බැවින් ඉහත පරිදිම බැවොබාබ් ශාකය මෙරටට පැමිනේනට ඇතැයි සිතිය හැක.

# මඩුගස් වලව්වේ මඩුගස් එකතුව



**ශාකයේ නම** : මඩු

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Cycas spp.*

**ශාකයේ පිහිටීම**

මඩුගස් වලව්වට පිවිසෙන මග දෙපස.

**පිවිසුම් මාර්ගය**

යක්කල ගම්පහ මාර්ගයේ මද දුරක් ගමන් කරන විට මෙම ශාක එකතුව දැක ගත හැක.

**ශාකයේ ස්වභාවය**

සාමාන්‍යයෙන් අඩි 8 ක පමණ උසට වැඩුනු මඩු ශාක 28ක් පමණ වලව්වට පිවිසෙන මාර්ගය දෙපස ඇත. මෙම ශාක දල වශයෙන් වසර 150ක් පමණ වයස්ගත බව තොරතුරු සොයා බැලීමේදී අනාවරණය විය.

## ඓතිහාසික තොරතුරු

කීර්තිමත් දේශපාලඥයෙකු වූ විලියම් ඩයස් බණ්ඩාරනායක මැතිඳුන් විසින් මෙම ශාක රෝපණය කර ඇති අතර එම ශාකයන් ලොව විවිධ රටවලින් ලබා ගෙන ඇත.

ලාංකේය දේශපාලන කරලියේ සදා අනුස්මරණීය ස්ථානයක් වන මඩුගස් වලව්වේ පිහිටි මඩු ශාක එකතුව එහි සාඩම්බරත්වය ඔපවත් කරයි.

# සිංහල හමුදාවේ රණ ශූරත්වය කියාපාන ඩේවිගේ ගස




**ශාකයේ නම** : බෝ

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Ficus religio*

**ශාකයේ පිහිටීම**

මහනුවර දිස්ත්‍රික්කයේ වටපුළුව නගරයේ CIS ජ්‍යාතන්තර පාසැල් භූමියේ

**ශාකයේ ස්වභාවය**

ශාකය මුල සිටම හොදින් අතු විහිදි පැතිර ඇත. අඩි 80ක පමණ උසට වර්ධනය වි ඇත. ශාකය අසල ශෛලමය පුවරුවක 1803 SUNDAY June 26 Davies Tree ලෙස සඳහන්ව ඇත. පාසැල් පරිශ්‍රය තුළ පිහිටීම හේතුවෙන් ශාකය සඳහා ආරක්ෂාව සැලසී ඇත.

**සුවිශේෂියතාවය**

සේනාසම්මත වික්‍රමබාහු විසින් 1464 දි ආරම්භවන මහනුවර රාජධානිය අනුරාධපුරය හැරුණුවිට මෙරට පැවති දීර්ඝතම රාජධානියයි. ඉතිහාසයේ විවිධ අවස්ථාවන්හිදී ප්‍රබල ආක්‍රමණයන් මහනුවර රාජධානියට එල්ල වුවත් ඒ සෑම අවස්ථාවකදීම පවා රාජධානිය ආරක්ෂාවිමට බලපෑ ප්‍රධානතම සාධකයක් වන්නේ එයට තිබූ ස්වභාවික ආරක්ෂාවයි. වන දුර්ග,

ජල දුර්ග, කපොලු හා ප්‍රපාතයන්ගෙන් ස්වභාවිකව ආරක්ෂා වූ මහනුවර රාජධානියට පහර දීට පැමිණි සතුරන්ට අත්වූයේ අම්හිරි හා කටුක පරාජයන්ය. 1594 දී පේරෝ ලෝපේස් ද සුසාගේ හමුදාව අන්ත පරාජයකට ලක්කල දන්තුරේ සටනත්, 1602 දී ජෙරනිමෝ අසවේදුව පරාජය කළ බලන සටනත් මේ සඳහා කදිම උදාහරණයන්ය.

අවසන් වරට ඉංග්‍රීසි හමුදාව උඩරට රාජධානියට විරුද්ධව ක්‍රියාත්මක කරන ලද සටන 1803 දී සිදුවූ අතර එම සටනට නායකත්වය දෙන ලද්දේ ඉංග්‍රීසි හමුදාවේ මේජර් ඇඩම් ඩේවි විසිනි. එහිදී ද ඉංග්‍රීසි හමුදාවන්ට අත්වූයේ අන්ත පරාජයකි. යුද්ධයෙන් ඉංග්‍රීසි හමුදාවේ දෙදෙනෙක් හැර අන් සියලු දෙනා මරණයට පත්වූ අතර සිංහල හමුදාවන්ට කිසිදු හානියක් සිදුවී නැත. මෙම බෝ ගස අසල සටන  පැවත ඇති අතර පරාජය දුටු ඉංග්‍රීසි හමුදාවේ මේජර් ඩේවි මෙම ගසේ තිබූ බෙනයක සැඟවුනු බව පැවසේ. එතැන් පටන් මෙම ගස ඩේවිගේ ගස ලෙස හඳුන්වයි.

මේ අසල මාවතක් ඩේවි මාවත ලෙස තවමත් හඳුන්වන අතර අතීතයේ සිදුවූ යුද්ධය සිහිකිරීම පිළිබඳව සමරු ඵලකයක්ද අසල පිහිටුවා ඇත.

# නාගදීපයේ සාමි ගස



**ශාකයේ නම** : සාමි ගස /ශාමි ගස/ ශයාමා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Prosopis cineraria*

**ශාකයේ පිහිටීම**

යාපනය දිස්ත්‍රික්කයේ නයිනතිව් දූපතේ (නාගදිපයේ) නාග පුසානි අම්මාන් කෝවිලේ ප්‍රධාන දොරටුව අසල

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස දළ වශයෙන් අඩි 30ක් පමණය. මුල සිට අඩි 10 න් පමණ අතු බෙදීම ආරම්භ වේ. කඳේ පොත්ත රැලි වැටුනු ස්වභාවයක් ගනී. ශාකයට විවිධ පුද පූජාවන් කරන බවත් පඬුරු ගැටගසන බවත් දැකිය හැක. ප්‍රමාණවත් ආරක්ෂාවක් සැලසී ඇත.

**සුවිශේෂියතාවය**

හින්දු බැතිමතුන් පූජනීයත්වයෙන් සලකන ශාකයකි. දැනට තහවුරු කර ඇති තොරතුරු අනුව මෙය ශ්‍රී ලංකාවේ ඇති එකම සාමි ශාකයයි.

ඉන්දියාවේ කාන්තාර ප්‍රදේශවල මෙම ශාකය වාර්තාවන අතර අතීතයේ

ඉන්දියාවේ ඉතා වියලි කාන්තාරවල පිහිටි ක්ෂේමභූමිවල මෙම ශාකය තිබී ඇත. ඉතා දරුණු දුර්භික්ෂ සමයක ඉන්දියාවේ පූජක පිරිස් මෙම ශාකයේ පොතු මගින් සකස්කල ආහාර ආහාරයට ගෙන ජීවිතය රැකගත් බවත් ඒ නිසාම මෙම ශාකය පූජනීයත්වයට පත්වූ බවත් කියවේ. හින්දු භක්තිකයන් මෙම ශාකයට බාර හාර වීම සිදුකරන අතර ශාකයේ පත්‍ර, මල් හා පොතු ඖෂධීය ගුණයෙන් යුතු බව ද සඳහන් වේ.

# නරේන්ද්‍රසිංහ රජුට වාරකා සැපයූ කුණ්ඩසාලේ වරකා ගස



**ශාකයේ නම** : කොස්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Artocarpus heterophyllus*

**ශාකයේ පිහිටීම**

මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ශ්‍රී නරේන්ද්‍රසිංහාරාම විහාර භූමියේ

**ශාකයේ ස්වභාවය**

උස අඩි 50 ක් පමණ වේ. මුල ආසන්යේ සිටම හොඳින් අතු බෙදී ඇත.

**සුවිශේෂියතාවය**

මහනුවර රාජධානියේ රජකළ නරේන්ද්‍රසිංහ රජුට රාජ බෝජන සඳහා වරකා සැපයීමට වෙන්කර තිබූ ගසක් බව පැවසේ . මෙහි ඉදුනු වරකා ඉතාමත් ප්‍රනීත රසයෙන් යුතු බව කියැවේ. මෙම ගසත් සමග රජවරුන් සඳහා ම වෙන්කරන ලද පැණි වරකා ගස් තුනක් පිළිබඳ තොරතුරු මෙම ග්‍රන්ථයට ඇතුලත් කර ඇත. හඟුරන්කෙත පොත්ගුල් විහාරය ඉදිරිපිට පිහිටි වරකා ගස හා අවිස්සාවේල්ල පැණි වරකාව එම අනෙක් ගස් වේ. මේ අනුව රාජ භෝජන සඳහා සුලභව යොදාගත් පළතුරක් ලෙස පැණි වරකා හැඳින් විය හැක.

# උද්භිද උද්‍යාන ආශ්‍රිත සමරු ශාක

# පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

දෙස් විදෙස් සංචාරකයන් අතරත්, උද්භිද විද්‍යාඥයන් අතරත්, පර්යේෂකයන් අතරත් සුපතල පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වර්තමානයේදී ලොව විශිෂ්ටම උද්භිද උද්‍යාන අතරට අයත්වන්නකි.

සෞන්දර්යාත්මක අගයෙන් ඔබ්බට තුරුලතාවන්ගේ විද්‍යාත්මක තොරතුරු නරඹන්නන්ට සපයමින් අධ්‍යාපනික වශයෙන් සහ නවතම පර්යේෂණ සඳහා මහඟු පිටුවහලක් සපයන අපේ රාජකීය උද්භිද උද්‍යානය සතු ඉතිහාසයද රාජාවලිය දක්වාම විහිදෙන්නෙකි.

වර්ෂ 1271 දී රජකම්කළ තුන්වන වික්‍රමබාහු රජු සිය මාලිගය පේරාදෙණියේ මහවැලි ගඟ අසල ඉදිකරන ලද අතර ඉන් අනතුරුව එනම් 1747 - 1780 කාලයේදී කීර්ති රාජසිංහ රජු එම ප්‍රදේශයේ රාජකීය උද්‍යානයක් නිර්මාණය කරන ලදී. 1780 - 1798 වකවානුවේ රාජ්‍යත්වයට පත්වූ රාජාධි රාජසිංහ රජු එහි තාවකාලික වාසස්ථානයක් ඉදිකර ඇත. ඒ සමයේ මෙම ප්‍රදේශයේ ඉදිවූ විහාරාරාම ස්ථූප ආදිය පසුකාලීන අධිරාජ්‍යවාදී පාලන සමයේදී විනාශවී ඇත.




පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

# උද්භිද උද්‍යාන බිහිවීම

වර්ෂ 1810 පළමු උද්භිද උද්‍යානය සර් ජෝසප් බෑන්ක්ස් මහතාගේ උපදෙස් පරිදි කොළඹ කොම්පඤ්ඤ වීදිය ආශ්‍රිත ප්‍රදේශයක ස්ථාපිත කරන ලද අතර එය 'කිව් උද්‍යානය' ලෙස නම් කරන ලදී. එහි අධිකාරිත්වය උසුලන ලද්දේ විලියම් කීර් මහතා විසිනි. 1813 වසරේදී මෙම උද්‍යානය කළුතරට ගෙනයන ලද අතර එයට හේතුවී ඇත්තේ ආර්ථික වැවිලි බෝග රෝපණයට කළුතර ප්‍රදේශයේ පවතින උචිත දේශගුණික තත්ත්වයයි.

1814 වසරේදී එවකට උද්භිද උද්‍යානයේ අධිකාරිවරයාව සිටි විලියම් කීර් මහතා අභාවයට පත්වූ අතර පසුව ඇලෙක්සැන්ඩර් මූන් මහතා එහි අධිකාරිවරයා විය. 1821දී එතෙක් කළුතර පැවති උද්භිද උද්‍යානය පේරාදෙණියේ වර්තමාන භූමියට ගෙන එන ලදී.

ඇලෙක්සැන්ඩර් මූන් මහතාගේ අධිකාරිත්වය යටතේ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ නිරිතදිග කොටස ජනතාවට විවෘතවූ අතර එහි ප්‍රධාන වශයෙන් කෝපි සහ කුරුඳු ශාක ප්‍රදර්ශනය විය.

ලංකාවේ උද්භිද විද්‍යා ක්ෂේත්‍රයේ දියුණුවට ඉමහත් සේවයක් කළ මූන් මහතා සිය “Catalogue of Ceylon Plants” යන ග්‍රන්ථය එළිදක්වන ලද අතර එමගින් ශාක 1127 පිළිබඳව උද්භිද විද්‍යාත්මක තොරතුරු අනාවරණය කරන ලදී.

1844 වසරේදී ජෝර්ජ් ගාඩ්නර් මහතා රාජකීය උද්භිද උද්‍යානයේ අධිකාරිවරයා ලෙස පත්වූ අතර 1849 වසරේ සිදුවූ ඔහුගේ අභාවයෙන් අනතුරුව ආචාර්ය පී. එම්. කේ. ත්වේට්ස් මහතා එහි අධිකාරිවරයා විය. රාජකීය උද්භිද උද්‍යානයේ වැඩිදියුණුවට සුවිශේෂීය දායකත්වයක් සැපයූ ත්වේට්ස් මහතා වසර 30 ක් එය පාලනය කරන ලදී. මෙම කාලය තුළ උද්‍යානයේ අධ්‍යාපනික සහ පර්යේෂණාත්මක අගය ඉහළ නැංවුනු අතර ජාත්‍යන්තර අවධානයට පාත්‍රවූ උද්භිද උද්‍යානයක් බවට පත් විය.

ත්වේට්ස් මහතාගේ ඇවෑමෙන් අධිකාරීත්වයට පත්වූ තවත් කීර්තිධර උද්භිද විද්‍යාඥයකුවූ ආචාර්ය හෙන්රි ට්‍රයිමන් මහතා තවදුරටත් මෙම උද්‍යානයේ සංවර්ධන කටයුතු සිදුකරන ලද අතර එතුමන් විසින් “Flora of Ceylon” ග්‍රන්ථය ප්‍රකාශයට පත්කිරීම ආරම්භ කරන ලදී.

1896 වසරේ දී ට්‍රයිමන් මහතා අභාවයට පත්වූ අතර අචාර්ය ජේ. සී. විලිස් මහතා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ අධිකාරිවරයා විය.

වර්ෂ 1912 දී රාජකීය උද්භිද උද්‍යානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතට පත්වූ අතර එච්. ඒ. මැක්මිලන් මහතා එහි අධිකාරිත්වය උසුලන ලදී. "A Hand Book of Tropical Plants and Gardening" යන ග්‍රන්ථය එළිදැක්වීම

ඔහු ගේ පාලන සමයේ සිදුවූ සුවිශේෂීය සිදුවීමකි. මැක්මිලන් මහතාගේ විශ්‍රාම යාම 1925 වසරේදී සිදුවූ අතර එවකට කියුරේටර් තනතුරේ කටයුතු කල ටී.එච්. පාර්ශන් මහතා 1945 වනතුරුම අදාළ තනතුරේ කටයුතු කරන ලදී.

1945 වසරේදී ඩී. එම්. ඒ. ජයවීර මහතා පළමු ලාංකික උද්භිද උද්‍යාන අධිකාරිවරයා ලෙස පත්වූ අතර එතුමන් විසින් ඖෂධීය ශාක සහ උඩවැඩියා ශාක පිළිබඳ වටිනා දැනුම් සම්භාරයක් ජාතියට උරුම කරන ලදී. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පේරාදෙණියේ මහවැලි ගඟ අසළ පිහිටි අප රාජකීය උද්භිද උද්‍යානය මුහුදු මට්ටමින් අඩි 1600ක උසින් පිහිටා ඇති අතර අක්කර 147 ක (හෙක්ටයාර් 59) භූමියක පැතිර පවතින මෙහිදී ශාක විශේෂ 4000 ක් පමණ නරඹන්නන්ට දැකගත හැක.

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය තුළදී දැකිය හැකි ශාක අතුරින් සුවිශේෂීයම අංගයක් වන්නේ සමරු ශාක තුරු ගොමුවයි. මෙරටට සැපත්වන සම්භාවනීය අමුත්තන් සිය සංචාරයේදී අනිවාර්යෙන්ම පිවිසෙන ස්ථානයක් ලෙස පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය හැඳින්විය හැකි අතර ඒ සැවොම තම රාජකීය සංචාරය සිහිපත් කිරීම සඳහා මෙහි සමරු ශාකයක් රෝපණය කිරීමට අමතක නොකරන ලදී.

අතීතයේ පටන්ම සිදුවූ මෙහි ප්‍රතිඵලයක් ලෙස සුවිසල් සමරු රුක් ගොමුවක් අද අපට දැකගත හැක. ඒවා රාජකීයත්වයත්, ගාම්භීරත්වයත් කැටුව සාඩම්බරයෙන් හරිතවත්ව ඇත. එහෙත් ඒවා රෝපණය කළ සුවිශේෂීය පුද්ගලයන් බොහොමයක් අප අතර නැත. ඔවුන් ලොවට අහිමිවූවත් ඔවුන් සිහිපත්කරන ජීවමාන සමරු අප රාජකීය උද්භිද උද්‍යානයේ ඔබ එනතුරු බලා සිටී.

# ඩී. එස්. සේනානායක මැතිතුමා රෝපණය කළ සියඹලා ගස



**ශාකයේ නම** : සියඹලා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Tamarindus indica*

**පිවිසුම් මාර්ගය**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 50 ක් පමණය. මුල සිට අඩි 15 කින් පමණ අතු බෙදීම ආරම්භ වී ඇත.

**ඓතිහාසික වැදගත්කම**

ශ්‍රී ලංකාවට නිදහස ලැබීම නිමිත්තෙන් නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමන් විසින් 1948 පෙබරවාරි මස 4 වන දින මෙම ශාකය රෝපණය කර ඇත.

# ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා රෝපණය කළ සුදු සඳුන් ගස



**ශාකයේ නම** : සුදු සඳුන්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Santalum album*

**ශාකයේ පිහිටීම**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 15 ක් පමණය. මුල සිට අඩි 4 කින් පමණ ප්‍රධාන අතු දෙකකට බෙදී වර්ධනය ආරම්භ වී ඇත.

**ඓතිහාසික පසුබිම**

ශ්‍රී ලංකාවෙන් බිහිවූ කෘතහස්ථ දේශපාලඥයෙකු, රාජ්‍ය නායකයෙකු ලෙස ජේ.ආර්, ජයවර්ධන මැතිතුමා හැඳින්විය හැක. 1906 සැප්තැම්බර් මස 17 වන දින උපත ලද එතුමන් සිය මූලික අධ්‍යාපනයෙන් අනතුරුව කොළඹ නීති

විද්‍යාලයෙන් නීතිය හදාරන ලද අතර, පසුව එනම් 1938 වසරේදී දේශපාලන ක්ෂේත්‍රයට එක්විය. ශ්‍රී ලංකාවේ නිදහස් සටනට දායකත්වය සපයමින් නිවහල් දැයක් බිහිකිරීමට කටයුතු කල එතුමන් 1947 වසරේ කැබිනට් මණ්ඩලයේ මුදල් අමාත්‍ය ධූරයට පත්විය .

1947-1956 සහ 1965-1970 වසර වල ආණ්ඩු පක්ෂයේත්, 1956-1965, 1970-1977 වසර වල විපක්ෂයේත් කටයුතු කල ජේ. ආර්. ජයවර්ධන මැතිඳුන් 1977 වසරේදි අග්‍රාමාත්‍ය ධුරයට පත් විය. පසුව 1978 වසරේදි ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති ධූරයට පත් විය.

දෙවන ලෝක යුද සමයේ ජපානයේ ක්‍රියා කාලාපයට එරෙහිව 1947 දී පැවති සැන්ෆැන්සිස්කෝ සමුළුවේදි ඔහු විසින් සිදු කල ප්‍රකාශය අද ද වියත් ප්‍රජාව සිහිපත් කරන්නේ එතුමන්ගේ මතකය අවදි කරමිනි. 1996 නොවැම්බර් 01 වන දින ජේ. ආර්. ජයවර්න මැතිතුමන් මෙලොවින් සමුගත්තත්, ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනපති ලෙස පත් වීමෙන් අනතුරුව එය සිහිපත් කරමින් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ 1978 ජුලි මස 22 වන දින එතුමන් විසින් රෝපණය කල සුදු සඳුන් ගස ගාම්භිරත්වයෙන් වැජඹේ.

# හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ බෝ ගස



**ශාකයේ නම** : බෝ

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Ficus religiosa*

**ශාකයේ පිහිටුම**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 60 ක් පමණය. මුල සිට අඩි 10 කින් පමණ අතු බෙදීම ආරම්භ වී ඇත. ශාකය තරමක් ඇඹරුනු ස්වභාවයක් පෙන්වයි.

**ඓතිහාසික පසුබිම**

1841 නොවැම්බර් මස 9 වන දින උපත ලද ඇල්බට් එඩ්වඩ් කුමරු වික්ටෝරියා මහ රැජිණගේ පුත්‍රයා ය . බ්‍රිතාන්‍ය රාජාවලියේ පාරම්පරික නාමයන්ට අනුව ඔහු සිහසුනට පත්වන තුරු එනම් 1902 අගෝස්තු 9 වන දින දක්වා වේල්ස් හි කුමාරයා ( Prince of wales ) ලෙස හඳුන්වන ලදී .

පස්වන ජෝර්ජ් රජු ගෙන් පසුව සිහසුනට පත්වන මොහු 1910 මැයි 6 දින දක්වාම බ්‍රිතාන්‍යයේත්, එහි යටත් විජිතයන්ගේත් රජු ලෙස කටයුතු කරන ලදී. රුසියාවේ සංචාරය කල ප්‍රථම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයා ලෙසද සැලකෙන හත්වන එඩ්වඩ් රජු බ්‍රිතාන්‍යයේ දියුණුව සඳහා සුවිශේෂීය මෙහෙයක් සිදුකල අයෙකු වශයෙන් ප්‍රකටය. 1875 වසරේ (දෙසැම්බර්) මෙරටට සැපත්වූ එඩ්වඩ් රජු පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේදී බෝ පැළයක් රෝපණය කළ අතර එය අද දැවැන්ත වෘක්ෂයක් බවට පත්වී ඇත. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක අතරින් වයස්ගතම ශාකය මෙයයි.

පසුව හංවැල්ල ප්‍රදේශයේ සහ කරඳන වතුයායේ සංචාරයට පිවිසි හත්වන එඩ්වඩ් රජු විසින් පිළිවෙලින් හංවැල්ලේ කොස් ගසක්, සියඹලා ගසක් සහ තැඹිලි ගසක්ද (මෙය දැන් සොයා ගත නොහැක) කරඳන වතුයායේ දී සල් ගසක්, සියඹලා ගසක්, කොස් ගසක් හා අඹ ගසක් රෝපණය කළ බව ද සඳහන් ය. (අදාළ ගස් පිළිබඳ තොරතුරු මෙම ග්‍රන්ථයේ 61 - 64 පිටුවල සඳහන්ව ඇත.)

# චව් එන් ලායි මැතිතුමා රෝපණය කළ ටැබුබියා ගස



**ශාකයේ නම** : ටැබුබියා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Tabebuia spectabilis*

**ශාකයේ පිහිටුම**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 60 ක් පමණය. මුලසිට අඩි 1 කින් පමණ ප්‍රධාන අතු දෙකකට බෙදී වර්ධනය ආරම්භ වී ඇත.

**ඓතිහාසික පසුබිම**

මාවෝ සේතුං මහතා සමග මහජන චීනය ගොඩනැගීම සඳහා අනුපමේය මෙහෙයක් ඉටුකළ චව් එන් ලායි මහතා එරට ප්‍රථම අග්‍රාමාත්‍ය වරයාය. 1898 මාර්තු 5 වන දා උපත ලද චව් එන් ලායි මහතා ස්වකීය අධ්‍යාපනයෙන්

පසුව චීන කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ ව කටයුතු කළ අතර 1949 ඔක්තෝබර් පලමුවන දින මහජන චීනයේ ප්‍රථම අග්‍රාමාත්‍ය වරයා බවට පත්විය. මාවෝ සේතුං සමග එක්ව ලොව ශක්තිමත් රාජ්‍යයක් බවට මහජන චීනය පත් කිරීමට කැපවීමෙන් කටයුතු කළ එතුමන් වර්ෂ 1957 අප්‍රේල් මස ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නියලුණු අතර එය අතරතුර එනම් 1957 අප්‍රේල් 1 වනදා පේරාදෙනිය රාජකීය උද්භිද උද්‍යානයේදී ටැබුබියා ශාකයක් රෝපණය කලේ සිය ශ්‍රී ලංකා සංචාරය සිහිපත් කිරීම උදෙසාය. රතු ධජය යටතේ මහජන චීනය ලොව ප්‍රබල රාජ්‍යක් කළ චව් එන් ලායි මහතා 1976 ජනවාරි 8 වෙනිදා මෙලොවින් සමුගත්තේය.

# ජෙනරල් සියා උල්හක් රෝපණය කළ අම්හර්ස්ට්යා ගස



**ශාකයේ නම** : අම්හර්ස්ට්යා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Amherstia nobilis*

**ශාකයේ පිහිටුම**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වාභාවය**

ශාකයේ උස අඩි 20 ක් පමණය. මුල සිට අඩි 2 කින් පමණ ප්‍රධාන අතු දෙකට බෙදී වර්ධනය සිදු වී ඇත.

**ඓතිහාසික පසුබිම**

පකිස්ථාන් ජනරජයේ හය වන ජනාධිපති වශයෙන් පත්වූ ජෙනරල් සියා උල්හක් ජගත් ප්‍රජාවගේම අවධානය පකිස්ථානය වෙත කැන්දූ රාජ්‍ය නායකයෙකු ලෙස ප්‍රකටය. 1924 අගෝස්තු මස 12 වන දින උපත ලද සියා උල්හක් 1976 වසරේ දී පකිස්ථානයේ යුධ හමුදා ප්‍රධානියා බවට පත්විය .

1977 ජූලි 5 වන දින හමුදා කුමන්ත්‍රණයක් මගින් එවකට අගමැතිව සිටි සුපිකාර් අලි භූතෝ මහත්මා බලයෙන් පහකර පකිස්ථානයේ බලය සියතට ගත් ජෙනරල් සියා 1978 සැප්තැම්බර් 11 දින පකිස්ථානයේ ජනාධිපති ධුරයට පත්විය.

පකිස්ථානයේ දියුණුවට අසීමිත සේවයක් කළ ජනාධිපති සියා ශ්‍රී ලංකා රජයේද සමීපතම මිතුරෙකු ලෙස කටයුතු කළ අතර 1988 අගෝස්ත17 වන දින පකිස්ථානයේ සිදුවූ ගුවන් අනතුරකින් මෙලොවින් සමුගත්තේය . 1985 වසරේ දෙසැම්බර් මස 11 වන දින සංචාරයක් සඳහා මෙරටට පැමිණි මෙම අභීත නායකයා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ රෝපණය කළ අම්හර්ස්ටියා ශාකය අද ද ඔහු වෙනුවෙන් ජීවත්ව ඇත.

# යුරි ගගාරින් රෝපණය කළ Yellow Saraca ගස



**ශාකයේ නම** : කහ අශෝක

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Sraca thaipingensis*

**ශාකයේ පිහිටීම**

පේරාදෙණිය රාජකීය උද්භිත උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 20 ක් පමණය. මුල සිට අඩි 8 කින් පමණ ප්‍රධාන අතු පතර බෙදීම සිදු වී ඇත.

**ඓතිහාසික පසුබිම**

අනාදිමත් කාලයක් මිනිසාගේ ග්‍රහණයෙන් නිදහස්ව පැවති එමෙන්ම මානව චිත්ත සන්තානය තුළ ගුප්ත බවත් කුතුහලයත් ජනිත කළ අභ්‍යවකාශය වර්ෂ 1961 දී මිනිසෙකු ප්‍රථම වරට තරණය කරන ලදී. ඔහු සෝවියට් ගගනගාමී යුරි ගගාරින්ය. 1934 වසරේ මාර්තු මස 09 වන දින සෝවියට්

දේශයේ උපත ලද යුරි ගගාරින් පසුව සෝවියට් ගුවන් හමුදාවේ ගුවන් නියමුවකු ලෙස සේවය කළ අතර පසුව 1961 අප්‍රේල් මස 21 වන දින වොස්ටොක් 01 යානයෙන් අභ්‍යවකාශ ගතවිය . පැය 1 කුත් මිනිත්තු 48 ක කාලයක් අභ්‍යවකාශයේ රැඳෙමින් අභ්‍යවකාශය තරණය කළ ලොව ප්‍රථම මිනිසා ලෙස කිරුළු පළන් මේ අසහාය අජටාකාශගාමියා එම වසරේම එනම් 1961 දෙසැම්බර් මස ශ්‍රී ලංකාවටද සැපත් විය. එහි දී සිය සංචාරය සිහිපත් කිරීමට පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ දී කහ අශෝක ගසක් රෝපණය කරන ලදි. එය අද සුවිසල් ගසක් වී ඇත. 1968 මාර්තු මස 27 වන දින රුසියාවේදී MIG 15 යානයකින් ගමන් කරමින් සිටියදී අවසනාවන්ත ලෙස සිදු වූ ගුවන් අනතුරකින් මෙම අසහාය පුද්ගලයා අප අතරින් වෙන් වූවත් ඔහු රෝපණය කළ වෘක්ෂය අද අප අතර ඇත.

# දෙවන එළිසබෙත් රැජින රෝපණය කළ ගොටු නුග ගස



**ශාකයේ නම** : ගොටු නුග

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Ficus krishnae*

**ශාකයේ පිහිටීම**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 20 ක් පමණය. මුල සිට අඩි 4 කින් පමණ ප්‍රධාන අතු දෙකකට බෙදී වර්ධනය වී ඇත.

**ඓතිහාසික පසුබිම**

1926 වසරේ අප්‍රේල් 21 වන දින උපත ලද එලිසබත් ඇලෙක්සැන්ඩ්‍රා මේරි වින්සර් කුමරිය සිය පියා වූ හයවන ජෝර්ජ් රජුගේ අභාවයෙන් පසුව එනම් 1952 වසරේ පෙබරවාරි මස 06 වන දින බ්‍රිතාන්‍ය කිරීටයට පත් විය.

හිරු නොබසින රාජ්‍යයේ අසහාය නායිකාව වශයෙන් සුපතල ඇය වර්තමානයේ දී ද රටවල් 16 ක මිලියන 128 ක ජනතාවක නායිකාව වන්නේය.

1953 වසරේ ජුනි 23 වන දින ඔටුනු පළන් දෙවන එලිසබත් රැජින එයින් වසරක් ඉක්මයාමටත් ප්‍රථම ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත විය. එම රාජකීය සංචාරය සිහිපත් කරනු වස් 1954 අප්‍රේල් මස 20 වන දින පේරාදේණියේ රාජකීය උද්භිද උද්‍යානයේදී දුර්ලභ ගොටු නුග ශාකයක් රෝපණය කල අතර එය අදද රාජකීයත්වය කැටුව වැඩුණු ගසක් බවට පත්ව ඇත.

# ඉන්දිරා ගාන්ධි මැතිණිය රෝපණය කළ කොබෝනීල ගස



**ශාකයේ නම** : කොබෝනීල

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Bauhinia variegata*

**ශාකයේ පිහිටීම**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 10 ක් පමණය. මුල සිටම අතු බෙදීම සිදු වී ඇත.

**ඓතිහාසික පසුබිම**

ජවහර්ලාල් නේරු තුමන්ට සහ කමලා කවුල් ට දාව 1917 නොවැම්බර් 19 වන දින මෙලොව එළිය දුටු ඉන්දිරා ප්‍රියදර්ශනී ගාන්ධි භාරතයේ සුප්‍රකට ගාන්ධි පරම්පරාවේ සුවිශේෂීය චරිතයකි. භාරත දේශයේ නිදහස් සටනේ පුරෝගාමීන් වූ මහත්මා ගාන්ධි තුමාගේ මිනිබිරිය වූ ඉන්දිරා ගාන්ධි කුඩා

කල සිටම නිදහස සඳහා වූ භාරත දේශයේ අරගලයේ අත්දැකීම් ලැබීය. දහඅට වියට එලඹුණු තරුණ ඉන්දිරා ඉන්දීය ජාතික කොන්ග්‍රස් පක්ෂයට සම්බන්ධ වී එහි සංවිධාන කටයුතු සඳහාත් නිදහස් අරගලය සඳහාත් දායකත්වය ලබාදෙන ලදි. විශ්ව භාරතී විශ්ව විද්‍යාලය, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය ඔස්සේ අධ්‍යාපනය ලත් ඉන්දිරා 1942 මාර්තු 26 දින ෆෙරෝස් ගාන්ධි තුමා සමඟ විවාහ විය. විවිධ හැලහැප්පීම් ඔස්සේ ගමන් ගත් ඉන්දීය නිදහස් සටන ජයග්‍රහණය කරමින් 1947 අගෝස්තු 14 භාරත දේශය නිදහස ලැබීය. ක්‍රමයෙන් ඉන්දීය දේශපාලනට සම්බන්ධ වූ ඇය 1959 දී ජාතික කොන්ග්‍රස් පක්ෂයේ සභාපතීත්වයට පත්විය. 1964 වර්ෂයේ සිදුවූ නේරු තුමන් ගේ අභාවයෙන් පසු ඉන්දීය අග්‍රාමාත්‍ය ධූරයට පත්වූ ලාල් බහදූර් ශාස්ත්‍රි තුමන් තම කැබිනට් මණ්ඩලයට ඉන්දිරා ගාන්ධි මැතිණිය සම්බන්ධ කර ගන්නා ලදී.

1966 වසරේ සිදුවු ශ්‍රස්ත්‍රි තුමන් ගේ අභාවයෙන් පසු 1966 ජනවාරි 24 දින ඉන්දිරා ගාන්ධි මැතිණිය මැතිවරණයෙන් ඉන්දියාවේ අග්‍රාමාත්‍ය ධූරයට පත්විය. වසර 11 ක් එම ධූරයේ කටයුතු කරමින් භාරත දේශයේ සංවර්ධනයට ඉමහත් කැපවීමක් කළ ඇය 1977 දී මැතිවරණයෙන් පරාජය වී බලයෙන් ඉවත් වූ අතර නැවත 1980 දී බලයට පත්විය. භාරත දේශය පමණක් නොව ලොවම හඬවමින් 1984 ඔක්තෝම්බර් 31 දින ස්වකීය ආරක්ෂක භටයෙකුගේම සාහසික වෙඩිපහරකට ගොදුරුව මෙලොවින් සමුගත් ඉන්දිරා ගාන්ධි මැතිණිය සිය පාලන කාලය තුළ ශ්‍රී ලංකාවේ සමීපතම රාජ්‍ය තාන්ත්‍රිකයෙකු ලෙස කටයුතු කරන ලදී. 1967 සැප්තැම්බර් 20 දින නිල සංචාරයක් සඳහා මෙරටට පැමිණි එතුමිය පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ රෝපණය කළ කොබෝනීල ශාකය අදද අපට ඒ භාරත මාතාව සිහිපත් කරවයි.

# අකිහිතෝ කුමරු රෝපණය කළ ගස



**ශාකයේ නම** : මූනමල්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Mimusops elengi*

**ශාකයේ පිහිටීම**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 20 ක් පමණය. මුල සිට ඍජු කඳකි. අඩි 12 කින් පමණ අතු බෙදීම ආරම්භ වී ඇත.

**ඓතිහාසික පසුබිම**

ජපාන රාජාවලියේ හිරෝහිතෝ අධිරාජ්‍යායට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. අකිහිතෝ කුමරු (වර්තමානයේ අකිහිතෝ අධිරාජ්‍යයා) හිරෝහිතෝ අධිරාජ්‍යාගේ වැඩිමහල් පුත් රුවනයි. අකිහිතෝ අධිරාජ්‍යයා

වර්තමාන ලෝකයේ පාලන තන්ත්‍රයක් මෙහෙයවන එකම අධිරාජ්‍යයා ලෙස හඳුන්වයි. පාරම්පරිකව පැවත එන ජපාන රාජාවලියේ 125 වන අධිරාජ්‍යයා ඔහුය. 1933 දෙසැම්බර් 23 වන දා උපත ලද අකිහිතෝ කුමරු 1951 නොවැම්බර් 10 වන දින ඔටුනු පළන් අතර 1989 සිට වර්තමානය දක්වා ජපාන අධිරාජ්‍යයා ලෙස කටයුතු කරයි. නිල සංචාරයක් සඳහා 1981 වසරේ මාර්තු මස මෙරටට පැමිණි අකිහිතෝ කුමරු 1981 මාර්තු 5 වන දින පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ රෝපණය කළ මූනමල් ගස රාජකීය සමරුවක් ලෙස අපට උරුමවනු ඇත.

# මවුන් බැටන් සාමි රෝපණය කළ අම්හර්ස්ටියා ගස



**ශාකයේ නම** : අම්හර්ස්ටියා නොබිලිස්

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Amherstia nobilis*

**ශාකයේ පිහිටීම**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 20 ක් පමණය. මුල සිට අතු බෙදීම ආරම්භ වී ඇත. මැනවින් අතුපතර විහිදී ඇත.

**ඓතිහාසික පසුබිම**

වර්ෂ 1900 ජූනි මස 25 උපත ලද මවුන් බැටන් කුමරු බ්‍රිතාන්‍ය රාජ පරම්පරාවේ සමීපතම සාමාජිකයෙකි. පළමු ලෝක යුද්ධයේදී බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාවේ සේවය කළ ඔහු වඩාත් ප්‍රසිද්ධියට පත්වූයේ

දෙවන ලෝක යුද්ධ සමයේදී ය. ප්‍රහාරක නාවික කටයුතු රාශියකදී බ්‍රිතාන්‍ය අණදෙන නිලධාරියා වශයෙන් කටයුතු කළ අද්මිරාල් මවුන් බැටන් සාමි පසුව අග්නිදිග ආසියා සංග්‍රාම කලාපයේ සේනාධිනායක වශයෙන් කටයුතු කරන ලදී. දෙවන ලෝක යුද්ධ අවසානයේදී ඔහු විසින් සිදුකළ විශිෂ්ට සේවය අගයමින් බ්‍රිතාන්‍ය කිරීටය මවුන් බැටන් සාමි ඉන්දියාවේ ප්‍රතිරාජයා වශයෙන් පත්කරන ලදී. එවකට ඉන්දීය ජන නායකයන් සහ බ්‍රිතාන්‍ය පාලන අධිකාරිය අතර මනා මිත්‍රත්වයක් ගොඩනැගූ ඔහු වර්ෂ 1947 අගෝස්තු 14 මධ්‍යම රාත්‍රිය ඉක්මවූ අගෝස්තු 15 වන දින උදාවන විට ඉන්දියාව නිදහස් දේශයක් බවට පත්කිරීමට ප්‍රකාශයට පත්කරන ලදී. එසේම එවක පටන් මාස 10 ක කාලසීමාවකට ඔහු නිදහස් ඉන්දියාවේ ප්‍රථම ආණ්ඩුකාර ජෙනරාල් වරයා ලෙස කටයුතු කරන ලදී. 1979 වසරේ අගෝස්තු 27 වන දින අයර්ලන්තයේ නිවාඩුවක් ගතකරමින් සිටියදී ගරිල්ලන් විසින් සිදුකළ බෝම්බ ප්‍රහාරයකින් මවුන් බැටන් සාමිවරයා මෙලොවින් සමුගත්තේය. අග්නිදිග ආසියා සංග්‍රාම කලාපයේ සේනාධිනායක ලෙස කටයුතු කරමින් සිටියදී ශ්‍රී ලංකාවට සැපත්වූ මවුන් බැටන් සාමිවරයා 1945 ජූලි 21 දින රෝපණය කළ අම්හර්ස්ට්යා ශාකය ඔහු ගැන මතකය අවදි කරයි.

# සාර් රජු රෝපණය කළ නා ගස



**ශාකයේ නම** : නා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Mesua ferrea*

**ශාකයේ පිහිටීම**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සමරු ශාක එකතුව

**ශාකයේ ස්වභාවය**

ශාකයේ උස අඩි 20 ක් පමණය. මුල සිට අතු බෙදීම ආරම්භ වී ඇත. මැනවින් අතුපතර විහිදී ඇත. ශාකයේ කඳ ඇඹරුනු ස්වභාවයක් පෙන්වයි.

**ඓතිහාසික පසුබිම**

සෝවියට් දේශය පිළිබඳව සඳහන් කරන සෑම අවස්ථාවකම පාහේ එහි ප්‍රධාන කාලපරිච්ඡේද දෙකක් පිළිබඳව කියැවේ. එනම් 1917 වසරේ ඇතිවූ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට පෙර පැවැති සාර් රජ පෙළපතේ පාලන කාලය හා ඉන් පසුව පැවති සමාජවාදී පාලන ක්‍රමය පිළිබඳවයි.

1868 මැයි මස 19 දින උපත ලද නිකොලස් කුමරු සාර් රජ පෙළපතේ අවසන් රජු වශයෙන් හඳුන්වයි. දෙවන නිකලස් (Nicholas II) වශයෙන් කිරුළු පළඳින හෙතෙම 1894 සිට 1917 දක්වා රුසියාව පාලනය කරන ලදී.

සාර් රජුගේ ලංකා සංචාරය අතරතුර පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ රෝපණය කළ නා ගස සාර් රජ පෙළපතේ ජීවමාන සිහිවටනයකි.

# පේරාදෙණිය රාජකීය උද්භිත උද්‍යානයේ රෝපණය කර ඇති සමරු ශාක

| | |
|---|---|
| 1875 | හත්වන එඩ්වඩ්රජු රෝපණය කළ බෝ *(Ficus religiosa)* ශාකය. |
| 1891 | සාර් රජු රෝපණය කළ නා *(Mesua ferrea)* ශාකය. |
| 1901/04/19 | දින ජෝර්ජ් රජු රෝපණය කළ සල් *(Couroupita guianensis)* ශාකය. |
| 1922/03/21 | දින වේල්ස් කුමරු රෝපණය කළ මුනමල් *(Mimusops elengi)* ශාකය. |
| 1925/10/08 | දින බෙල්ජියමේ රජතුමන් රෝපණය කළ අම්හස්ටියා *(Amherstia nobilis)* ශාකය. |
| 1945/07/21 | දින මවුන් බැටන් සාමිවරයා රෝපණය කළ අම්හස්ටියා *(Amherstia nobilis)* ශාකය. |
| 1948/02/04 | දින මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමන් රෝපණය කළ සියඹලා *(Tamarindus indica)* ශාකය. |
| 1951/03/14 | දින නේපාලයේ රාජෝත්තම මහේන්ද්‍ර බීරක්කම් රජු රෝපණය කළ ඇහැළ *( Cassia fistula)* ශාකය. |
| 1954/04/20 | දින දෙවන එළිසෙබෙත් රැජින රෝපණය කළ ගොටු නුග *(Ficus krishnae)* ශාකය. |
| 1956/08/20 | දින ජපානයේ මිකාසා කුමරු රෝපණය කළ ටැබූබියා *(Tabebuia spectabilis)* ශාකය. |
| 1957/02/01 | දින චීන අග්‍රාමාත්‍ය චව් එන් ලායි මැතිතුමා රෝපණය කළ ටැබූබියා *(Tabebuia spectabilis)* ශාකය. |
| 1957/02/17 | කාම්බෝජයේ සිහනුත් කුමරු රෝපණය කළ *(Cassia moschata)* ශාකය. |
| 1957/05/03 | දින ජපාන අග්‍රාමාත්‍ය නොබොසුකේ කෙකෙෂි මැතිතුමා රෝපණය කළ ටැබූබියා *(Tabebuia rosea)* ශාකය. |
| 1958/01/17 | දින බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය හැරල්ඩ් මැක්මිලන් මැතිතුමන් රෝපණය කළ ටැබූබියා *(Tabebuia guayacan)* ශාකය. |
| 1958/01/31 | දින චෙකොස්ලෝවැකියානු අග්‍රාමාත්‍ය විලියම් සිරෝකේ මැතිතුමන් රෝපණය කළ ටැබූබියා *(Tabebuia guayacan)* ශාකය. |

1958/03/21 දින නවසීලන්ත අග්‍රාමාත්‍ය වෝල්ටර් නැෂ් මැතිතුමා රෝපණය කළ මැයිමල් *(Delonix regia)* ශාකය.

1958/11/25 දින කැනඩා අග්‍රාමාත්‍ය ජෝන් බේකර් මැතිතුමන් රෝපණය කළ *(Cassia renigera)* ශාකය.

1959/01/22 දින යුගෝස්ලෝවියානු අග්‍රාමාත්‍ය මාෂල් ටිටෝ මැතිතුමන් රෝපණය කළ *(Stenocarpus sinvatus)* ශාකය.

1959/06/20 දින ඉන්දිය ජනාධිපති රාජේන්ද්‍ර ප්‍රසාද් මැතිතුමන් රෝපණය කළ සපු *(Michelia champaca)* ශාකය.

1960/09/13 දින පෝලන්ත අග්‍රාමාත්‍ය තුමන් රෝපණය කළ *(Soraca asoca)* ශාකය.

1961/12/09 දින සෝවියට් ගගනගාමී යරි ගගාරින් රෝපණය කළ *(Soraca thaipingensis)* ශාකය.

1963/03/25 දින කිව් උද්භිද උද්‍යානයේ අධ්‍යක්ෂතුමන් රෝපණය කළ මුරුත *( Lagerstroemia speciosa)* ශාකය.

1963/12/10 දින පකිස්ථාන ජනාධිපති මොහොමඩ් අයුබ්කාන් මැතිතුමා රෝපණය කළ *(Monodora myristica)* ශාකය.

1966/02/12 දින බුරුම කවුන්සලයේ සභාපතිතුමන් රෝපණය කළ අම්හස්ටියා *(Amherstia nobilis)* ශාකය.

1966/02/20 දින සිංගප්පූරු අග්‍රාමාත්‍ය ලීක්වාන් යූ මැතිතුමා රෝපණය කළ *(Tabebuia)* ශාකය.

1967/02/13 දින තායිලන්තයේ නායක ස්වාමීන් වහන්සේ රෝපණය කළ අශෝක *(Saraca asoca)* ශාකය.

1967/04/09 දින එ. ජා. සං. මහලේකම් ඌතාන්ට් මැතිතුමා රෝපණය කළ *(Lagerstroemia turbinata)* ශාකය.

1967/04/21 දින මැලේසියානු අග්‍රාමාත්‍යතුමන් රෝපණය කළ නැඳුන් *(Pericopsis mooniana)* ශාකය.

1967/09/20 දින ඉන්දිය අග්‍රාමාත්‍ය ඉන්දිරා ගාන්ධි මැතිණිය රෝපණය කළ කොබෝනීල *(Bauhinia variegate)* ශාකය.

1967/11/25 දින ජර්මානු රජයේ අග්‍රාමාත්‍ය ජෝර්ජ් කින්ග්සර් මැතිතුමා රෝපණය කළ *(Cassia nodosa)* ශාකය.

1970/01/04 ඉන්දිය ජනාධිපති ශ්‍රී වි. වි. ගිරි මැතිතුමා රෝපණය කළ *(Magnolia sphenocarpa)* ශාකය.

1972/05/24 දින සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය රෝපණය කළ කපුරු *(Cinnamomum camphora)* ශාකය.

| | |
|---|---|
| 1973/05/19 | දින චීන ස්ථාවර කමිටුවේ උප සභාපති ෂු පියන් මැතිතුමා රෝපණය කළ *(Lysidice rhodestegia)* ශාකය. |
| 1973/09/28 | දින ඊජිප්තු අරාබි සමූහාන්ඩුවේ ජනාධිපති හුසේන් එල් ෂාපි මැතිතුමා රෝපණය කළ බෙලි *(Aegle mormelos)* ශාකය. |
| 1975/08/06 | දින මාලදිවයින් අගමැති අහමඩ් සාකි මහතා රෝපණය කළ දිවුල් *(Limonia acidissima)* ශාකය. |
| 1975/02/01 | දින චීනයේ විදේශ වෙළඳ අමාත්‍ය ලී චේන් මැතිතුමා රෝපණය කළ රඹුටන් *(Nephelium lappaceum)* ශාකය. |
| 1976/05/26 | දින රුමේනියානු අග්‍රාමාත්‍ය මනේයා මනෙස්කු මැතිතුමා රෝපණය කළ කුරුඳු *(Cinnamomum verum)* ශාකය. |
| 1976/06/11 | ඒ. ඒ. ග්‍රෝමෝ මැතිතුමන් රෝපණය කළ අම්හස්ටියා *(Amherstia nobilis)* ශාකය. |
| 1977/03/19 | කම්පුචියාවේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය ලෙන්ග්සරි මැතිතුමන් රෝපණය කළ අම්හර්ස්ටියා *(Amherstia nobilis)* ශාකය. |
| 1978/03/04 | දින වියට්නාමයේ අග්‍රාමාත්‍ය ෆෑම් වැන් ඩොං මැතිතුමා රෝපණය කළ කලුවර *(Diospyros ebenum)* ශාකය. |
| 1978/07/22 | දින ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා රෝපණය කළ සුදු සඳුන් *(Santalum album)* ශාකය. |
| 1979/11/06 | දින බංගලාදේශයේ හිටපු ජනාධිපති ශ්‍රීමත් සියාවුර් රහමාන් මැතිතුමා රෝපණය කළ *(Monodora myristica)* ශාකය. |
| 1980/02/25 | දින නේපාලයේ බිරේන්ද්‍ර රජු රෝපණය කළ ඉන්දියන් සල් *(Shorea rubusta)* ශාකය. |
| 1981/03/05 | දින ජපානයේ අකිහිතෝ කුමරු රෝපණය කළ ටැබූබියා *(Tabebuia rosea)* ශාකය. |
| 1982/02/05 | ඉන්දියාවේ හිටපු ජනාධිපති ශ්‍රී නීලම් සංජීව රෙඩ්ඩි මැතිතුමා රෝපණය කළ මදාරා *(Cleistanthus collinus)* ශාකය. |
| 1983/04/22 | දින මැලේසියානු අග්‍රාමාත්‍ය මහතීර් මොහොමඩ් මැතිතුමන් රෝපණය කළ ටැබුබියා *(Tabebuia serratifolia)* ශාකය. |
| 1983/02/17 | හිටපු නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ඩී. ටී. ඒකනායක මහතා රෝපණය කළ රුක් *(Horsfieldia iryaghedhi)* ශාකය. |
| 1984/10/03 | දින මාලදිවයිනේ ජනාධිපති අබ්දුල් ගයුම් මැතිතුමා රෝපණය කළ රුක් *(Horsfieldia iryaghedhi)* ශාකය. |
| 1985/12/11 | දින පාකිස්තානයේ හිටපු ජනාධිපති සියා අල් හක් මැතිතුමා රෝපණය කළ අම්හස්ටියා *(Amherstia nobilis)* ශාකය. |

1986/07/25 දින බංගලාදේශයේ හිටපු ජනාධිපති හුසේන් මොහමඩ් එර්ශාඩ් මැතිතුමා රෝපණය කළ නැදුන් *(Pericopsis mooniana)* ශාකය.

1987/10/24 දින එඩ්මිබරෝ ආදිපාද තුමන් රෝපණය කළ අශෝක *(Saraca asoka)* ශාකය.

1989/06/24 දින තායිලන්තයේ සොම්සාවලි රජකුමරිය රෝපණය කළ නා *(Mesua ferrea)* ශාකය.

1992/11/07 ජපානයේ අකිහිතෝ කුමරු රෝපණය කළ මුනමල් *(Mimusops elengi)* ශාකය.

1993/01/21 තායිලන්තයේ ඔටුන්න හිමි මහ වජිර ලොන්කොත් කුමරු රෝපණය කළ බෝ *(Ficus religiosa)* ශාකය.

1995/03/04 එංගලන්තයේ ඇන් කුමරිය රෝපණය කළ අශෝක *(Saraca asoka)* ශාකය.

1999/08/27 දින තායිලන්ත රාජෝත්තම ආචාර්ය චූලාභෝන් කුමරිය රෝපණය කළ සුවඳ *(Mesua stylosa)* ශාකය.

2002/11/17 දින ක්‍රොඒසියානු ජනරජයේ ජනාධිපති ස්ටීවන් මෙසික් මැතිතුමා රෝපණය කළ මදාරා *(Cleistanthus collinus)* ශාකය.

2004/01/14 ආදිවාසී නායක වන්නිලඇත්තන් විසින් රෝපණය කළ අශෝක *(Saraca asoca)* ශාකය.

2005/10/24 දින චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය රෝපණය කළ රුක් *(Horstieldia iryaghedi)* ශාකය.

# හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

ගම්පහ මිනුවන්ගොඩ පාරේ ගම්පහ සිට මීටර් 800 ක් තරම් දුරින් පිහිටි මල්වත්ත හංදියෙන් හැරී තවත් මීටර් 500 ක් පමණ ගමන් කළ විට හමුවන හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථානයකි. මුහුදු මට්ටමින් මීටර් 100 ක උසකින් යුතු මෙම උද්‍යානය හෙක්ටයාර් 14.4 ක වපසරියක පැතිර ඇත.

1876 වසරේදී අගෝස්තු මාසයෙදී එංගලන්තයේ කිව් උද්‍යානයේ සිට ඩියුක් ඔෆ් ඩිවෙන්ෂර් නෞකාවේ මෙරටට එවූ ප්‍රථම රබර් පැළ අතුරින් මුල්ම පැළය රෝපණය කර ඇත්තේ මෙම උද්භිද උද්‍යානයේය. එදා පටන් ශ්‍රී ලංකාවේ මුල්ම රබර් ශාකය සහිත ස්ථානය වශයෙන් හෙනරත්ගොඩ උද්‍යානය ප්‍රචලිතවේ.

මෙරට ප්‍රථම රබර් ශාකය පැවතිම හැරුණු කොට රාජකීයන්ගේ සම්ප්‍රප්තියේ අඩුවක් මෙම උද්‍යානයේ දී නිරික්ෂණය කළ අතර, දැනට එය සතු අනෙක් සමරු ශාකය වන්නේ උගන්ඩාවේ උප ජනාධිපතිතුමන් රෝපණය කළ අම්හර්ස්ටියා ශාකයයි. ඒ සියල්ල හැරුණුකොට අධ්‍යාපනික වශයෙන් සහ ජෛව විද්‍යාත්මකව අතිශය වැදගත් ශාක සමුදායකින් හෙබි ස්ථානයක් ලෙස හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය හැඳින්විය හැක.

# ශ්‍රී ලංකාවේ රෝපණය කළ පළමු රබර් ගස





දේශීය අපනයන ආදායමේ තවත් එක් ප්‍රධාන කොටස් කරුවෙකි රබර්. ලෝක වෙළෙඳපොළේ 4% පමණ රබර් සැපයුමක් අපට හිමි වී ඇත. ශ්‍රී ලංකාවේ රබර් වගාවේ ආරම්භය, රබර් හඳුන්වාදීම ආදිය පිළිබඳව ඇත්තේ ද රසවත් අතීතයකි.

රබර් වගාවක් අප රටට හඳුන්වා දී ඇත්තේ බ්‍රිතාන්‍ය ජාතිකයෙකු වන ශ්‍රීමත් හෙන්රි වික්හැම්ය. ඇමර්සන් ගංගා නිම්නවල ස්වභාවිකව වර්ධනය වන රබර් ශාකයන්ගේ බීජ 1919 ක් වර්ෂ 1876 දී බ්‍රිතාන්‍ය කිව් රාජකීය උද්භිද උද්‍යාන හරහා ශ්‍රී ලංකාවට එවා ඇත. ඒවා මුහන්දිරම් ඒ ද සොයිසා නැමැත්තෙකු යටතේ ගම්පහ සෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ රෝපණය කර ඇත. එය ශ්‍රී ලංකාවේ මුල්ම රබර් පැළය රෝපණය ලෙස හඳුන්වයි. මෙසේ රෝපණය කළ රබර් ශාකයන්ගේ පළමු වරට පුෂ්ප පිපීම වර්ෂ 1881 දී සිදු වූ බවද සඳහන් වේ.

අවාසනාවකට මෙන් අද වන විට ශ්‍රී ලංකාවේ පළමු රබර් ශාකය අපට දක්නට නොමැත. මීට හේතුව 1988 වසරේ හමා ගිය දරුණු සුළි සුළඟින් මෙම ඓතිහාසික වෘක්ෂය විනාශ වී තිබීමයි. නමුදු අද එම ශාකයේ නශ්ඨාවශේෂ එම ස්ථානයේ දැක ගත හැක. එසේම ඒ අවට විනාශ වූ මව් ශාකයෙන් හටගැනුනේයැයි සැළකෙන වෙනත් රබර් ශාක කිහිපයක් දැකගත හැක.

# හග්ගල උද්භිද උද්‍යානය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය බදුල්ල ප්‍රධාන මාර්ගයේ නුවරඑළිය සිට කිලෝමීටර් 9.5 ක් පමණ බදුල්ල දෙසට වන්නට මෙම උද්භිද උද්‍යානය පිහිටා ඇත. 1861 වසරේදී සිංකෝනා වගාව ප්‍රචලිත කිරීමට හා ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම මුල් කරගෙන ඉංග්‍රීසි ජාතිකයන් විසින් ආරම්භ කළ මෙම උද්‍යානය මුහුදු මට්ටමේ සිට මීටර් 1745 ක් උසින් පිහිටා ඇති අතර, අක්කර 6.8 ක වපසරියකින් සමන්විතය. උද්‍යානයට පිටුපසින් හග්ගල කන්ද පිහිටා ඇත.

මෙම උද්‍යානය ආශ්‍රිතව උෂ්ණත්වය සෙල්සියස් අංශක 15 - 23 පමණ වන අතර, වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 2200 ක් පමණය. සාමාන්‍යයෙන් වර්ෂයකට දින 210 ක් පමණ උද්‍යානයට වර්ෂාව ලැබෙන අතර, වසරේ ජුනි, ජූලි හා අගෝස්තු යන මාසවල ඉතා දැඩි සුළං සමඟ වර්ෂාව ලැබෙන අතර, නොවැම්බර් හා දෙසැම්බර් මාසවල උද්‍යානය ඉතා ඝන මීදුමින් වැසී පවතී. හග්ගල උද්භිද උද්‍යානය නැරඹීමට වඩාත් සුදුසු කාලය වන්නේ වසරේ මාර්තු අප්‍රේල් කාලය අතරතුරේදී ය.

උද්භිද විද්‍යාත්මකව ඉතාමත් වැදගත් මෙම උද්‍යානය තුළ පවතින ඉහළ පුෂ්ප කොටස, පහල පුෂ්ප කොටස, මීවන උයන, ගිරි උයන ආදී ඉතා මනරම් ස්ථානයන් පිහිටුවා ඇති අතර, ශ්‍රී ලංකාවේ පළමු සිංකෝනා වගාව මෙම උද්‍යානය ආශ්‍රිතව ආරම්භ කළ නිසා උද්‍යානයට ඓතිහාසික අගයක්ද ලැබී ඇත.

# හග්ගල උද්භිත උද්‍යානයේ පවතින පළමු සිංකෝනා වගාව



**ශාකයේ නම** : සිංකෝනා

**උද්භිද විද්‍යාත්මක නාමය** : *Cinchona succirubra*

**ශාකයේ පිහිටීම**

හග්ගල උද්භිද උද්‍යානයේ

**ශාකයේ වැදගත්කම**

මෙම ශාකය දකුණු ඇමරිකානු රටවලට ආවේණිකය. 1861 වසරේදී ශ්‍රී ලංකාවට හඳුන්වාදී ඇත. එම වසරේදී මෙරට පළමු සිංකෝනා වගාව හග්ගල උද්භිද උද්‍යානයේ ආරම්භ කර ඇති අතර එම වගාවෙන් පැවත එන ශාක අදටත් මෙහිදී දැක ගත හැක. මැලේරියා රෝගය සඳහා භාවිතා කළ 'ක්විනීන්' නැමති ඖෂධය නිපදවීමට මෙම ශාකයේ පොත්ත යොදාගෙන ඇති බැවින් අතීතයේ සිංකෝනා ශාක ඉතා ප්‍රචලිත ආර්ථික වැවිල්ලක් ලෙස ව්‍යාප්තව ඇත.

# නුවරඑළියේ වික්ටෝරියා උයනේ රෝපණය කරන ලද සමරු ශාක

නුවරඑළියේ හෙවත් පුංචි එංගලන්තය පරිසර ලෝලීන්ගේ තවත් එක් මන බඳවන ප්‍රදේශයක්. පරිසර විද්‍යාත්මකව මෙන්ම ජෛව විද්‍යාත්මකව වැදගත් ස්ථාන රාශියකට උරුම කියන ප්‍රදේශයකි. නුවරඑළිය නගර මධ්‍යයේ පිහිටි වික්ටෝරියා උද්‍යානය විවේකය ගතකිරීම සඳහා නුවරඑළිය ප්‍රදේශයට යන කා අතරත් ජනප්‍රිය ස්ථානයකි.

අක්කර 27ක් පුරා පැතිර පවතින මෙම උද්‍යානයේ ආරම්භය 1897 වසරේදී සිදුව ඇත. එවකට ශ්‍රී ලංකාවේ ලකිසුරු සර් ජෝර්ජ් වෙස්ට් රිජ්වේ මහතාගේ දියණිය විසින් බ්‍රිතාන්‍ය වික්ටෝරියා රැජිනගේ වජ්‍ර ජයන්තිය සැමරීම වෙනුවෙන් ඕක් පැළයක් සිටුවීමෙන් මෙම උද්‍යානය උත්සවාකාරයෙන් ආරම්භකර ඇත.

වර්ණවත් මල්ගොමු සහ තුරු වදුලු වලින් සමන්විත මෙම උයන ප්‍රදේශයේ සොබා සිරිය ඔප්නංවන ස්ථානයක් ලෙස හැඳින්විය හැක. උයනෙහි ශාක



හයවන ජෝර් රජුගේ ඔටුනු පැළඳීම
නිමිත්තෙන් ආර්. එම්. ඩේවිස් මැතිණිය,
1937.05.12 වන දින රෝපණය කළ ශාකය



ලොවට සාමය පතා
එම්. එම්. වෙඩබර්න් මැතිණිය,
1919.07.19 වන දින රෝපණය කළ ශාකය



හයවන ජෝර්ජ් රජුගේ රිදී ජුබිලිය නිමිත්තෙන්
ටී. ඩබ්ලිව්. මැක්ලැනබර්බ් මැතිණිය 1937.05.12 වන දින
රෝපණය කළ ශාකය

විවිධත්වය ඉහළ අගයක් ගන්නා අතර සෞම්‍ය දේශගුණික තත්ත්ව යටතේ වැඩෙන ශාක විශේෂ එහි සුලභය. ජෛව විද්‍යාත්මක අගයෙන් ඔබ්බට විහිදෙන ඓතිහාසික වැදගත්කමක් මෙම උයනට ගෙන එන තවත් එක් සුවිශේෂීයතාවක් වන්නේ උයන සතු සමරු ශාක එකතුවයි. රාජකීය අමුත්තන් විසින් සිය සංචාර අරමුණු කරගෙන සිටවූ සමරු ශාක මෙන්ම විවිධ වැදගත් අවස්ථා වෙනුවෙන් රෝපණය කළ ශාකද මේ අතර වේ. ඒ අතුරින්,

1919/07/19 දින ලොවට සාමය ප්‍රාර්ථනා කරමින් එම්. එම්. වෙඩබර් ආර්යාව රෝපණය කළ සයිප්‍රස් ගස, 1935/04/06 දින පස්වන ජෝර්ජ් රජුගේ රිදී ජුබිලි සැමරුම වෙනුවෙන් ටී. ඩබ්ලිව්. මැඩ්ලින් ආර්යාව සිටවූ ඇගතිස් රොඩස්ටා ශාකය, 1937/05/12 දින හයවන ජෝර්ජ් රජුගේ ඔටුනු පැළැඳවීම නිමිත්තෙන් ආර්.එම්. ඩෙවින් මහත්මිය විසින් රෝපණය කළ ලෝස්සුඹුල් ශාකය සහ 1954/04/12 දින දෙවන එළිසෙබෙත් රැජින විසින් රෝපණය කළ ලෝස්සුඹුල් ශාකය වැදගත් තැනක් ගනී. තොරතුරු රැස්කිරීමේදී මෙම සමරු ශාක පිළිබඳ ජනතාව අතර පැවති දැනුවත්භාවය මඳ බව අවබෝධ වූ අතර ඉදිරි පරම්පරා සඳහා මෙම අතීත සැමරුම් පිළිබඳව මතයක අවදි කිරීමත් ඒවා සංරක්ෂණයට වැඩි අවධානයක් යොමුකිරීමත් අත්‍යවශ්‍ය වන බව සඳහන් කරමි.

# පුංචි එංගලන්තයේ
# ඉපැරණි සොහොන් බිමේ සමරු ශාක

ශ්‍රී ලංකාව පාලනය කළ ඉංග්‍රීසි ජාතීන් මෙරට සිය ගම ලෙස යොදා ගත්තේ නුවර එළියයි. බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පයට අනුකූලවන පරිදි ගොඩනැගිලි, අවන්හල්, සමාජශාලා, නිවාඩු නිකේතන මෙන්ම ඔවුන්ගේම අනන්‍යතාවයට ඉදිකළ සොහොන් බිම්ද ඒ අතර වේ.

අධිරාජ්‍යවාදි පාලන සමය තුළ මතක සටහන් කැටිකරගත් නුවරඑළිය නගරය සේම එහි ඉපැරණි සොහොන් බිම ද අතීත මතකයන් රැසක් නිහඬව කියාපාන ස්ථානයකි.

අතීතයේ මෙරට නම රැන්දූ අධිරාජ්‍යවාදී පාලකයන් රැසක් සයනය කරන මෙම සොහොන්බිම වසර 160 කට වඩා පැරණි බව ඒ පිළිබඳ තොරතුරු සොයා යාමේදී අනාවරණය විය. එසේම එම සොහොන් සඳහා සෙවන සලසන දැවැන්ත වනස්පතීන්ද මෙම සොහොන් බිමට අමුතුම නිහඬබවක් කැඳවයි. එම ශාක බොහොමයක් අදාළ පුද්ගලයන් මිහිදන් කිරීම් සිදුවූ දිනවලම ඔවුන් සිහිවීම උදෙසා රෝපිත ඒවා බවත් සඳහන්වේ. නමුත් දැන් එක් එක් ශාකය පිළිබඳව තොරතුරු සොයා ගැනීම අසීරුවුවත් සොඳුරු මතකයක දුක්බර යටගියාව සනිටුහන් කරන මෙම දැවැන්ත වෘක්ෂයන් තවමත් ජීවමාන සමරු අපට ඉතිරිකර ඇත.



මේජර් රොජස් ගේ සොහොන



සිරුරු මිහිදන් කරන අවස්ථාවන්හි රෝපණය කළා යැයි සැලකෙන ශාක

මෙම සොහොන් බිම පිළිබඳව සඳහන් කරනවිට එහි නිහඬව සයනය කරන එක් සුවිශේෂීය අයකු පිළිබඳව සඳහන් නොකරම බැරිය. ඒ සර් විලියම් තෝමස් රොජස් මහතාය. සිය ලාංකේය සේවා කාලය තුළ අප රට අලි ඇතුන් 1500 ක් පමණ ඝාතනය කළ බව පැවසෙන මෙම ඉංග්‍රීසි ජාතික සහකාර ආණ්ඩු ඒජන්තවරයා දෛවෝපගත ලෙස 1938 මැයි මස 19 දින අකුණු සැරයක් වැදී මිය ගොස් ඇත. ඔහුගේ මරණය පිළිබඳ විවිධ අදහස් පලවෙන අතර ප්‍රබල මතයක් වන්නේ ඔහු විසින් සිදුකල අලි ඇතුන් ඝාතනය නිසාවෙන් ඔහුට පලදුන් සාපයක් බවයි. එසේම බදුල්ල ප්‍රදේශයේ හිමි නමක් මෙම අලි ඇතුන් ඝාතනය නවත්වන ලෙස ඔහුට පැවසුවත් එය පිළිබඳව තැකීමක් නොකළ බැවින් එම හිමිනම විසින් වස් කවියක් කියූ බවත් එහි ප්‍රතිඵලයක් නිසාවෙන් රොජස් මහතා අකුණු සැරයකට ගොදුරුවූ බවත් පැවසේ. එසේම සෑම වසරකම මෙම සොහොනට අකුණු සැර පතිතවන බවට ප්‍රදේශයේ ජනතාව අතර මතයක් ඇත. වරෙක එම අකුණු පහරකින් සොහොන් වලෙහි ලෑල්ල පවා ඉරිතලාගිය බවත් වැඩිදුරටත් අනාවරණය විය.

සැබවින්ම සොබාදහම කෙතරම් අපුරුද?

ඔහුගේ සිරුැර මිහිදන් කරන අවස්ථාවේදී ඒ අසල රෝපණය කළායැයි සැලකෙන දැවැන්ත වෘක්ෂ දෙකක් අද ද දැකගත හැකිය. එහෙත් ඒවා කා විසින් රෝපණය කළාදැයි යන්න පිළිබඳව තොරතුරු සොයා ගැනීම අපහසුය.

# උප ග්‍රන්ථ

# අටවිසි බුදුවරයන් වහන්සේලා පිටදුන් වෘක්ෂ

බෞද්ධ දර්ශනය තුළ බෝ ගස නොහොත් බෝධිය සඳහා හිමිවන්නේ සුවිශේෂීය ස්ථානයක්. ගෞතම බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වූයේ දඹදිව ශ්‍රී මහා බෝධි මූලයේ දී බව බෞද්ධයන්ගේ විශ්වාසය යි.

මෙම හේතුව නිසා ආගමික වතාවත් අතුරින් බෝධි වන්දනාව, බෝධි පූජා පැවැත්වීම ප්‍රධාන තැනකට පත්ව ඇති පුණ්‍යය කර්මයන්ය.

බෞද්ධ ධර්මයේ සඳහන්වන පරිදි බුදුවරයන් වහන්සේලා 28 නමකගේ නම් සඳහන් වන අතර එම එක් එක් බුදුවරයන් වහන්සේලා බුද්ධත්වයට පැමිණ ඇත්තේ විවිධ වෘක්ෂ මූලයන් අභියසදීය. මෙම ශාක 'අටවිසි බෝධීන්' ලෙසද බෞද්ධයන් හඳුන්වන අතර, 'අටවිසි බෝධි වන්දනා කවි' මගින් ඉතා සුමදුරව මෙම වෘක්ෂ පිළිබඳ හැඳින්වීමක් සිදු කරයි.

### අටවිසි බෝධීන්

| | | |
|---|---|---|
| 1. | තණ්හංකර බුදුරජාණන් වහන්සේ | රුක් අත්තන |
| 2. | මේධංකර බුදුරජාණන් වහන්සේ | කැල |
| 3. | සරණංකර බුදුරජාණන් වහන්සේ | පළොල් |
| 4. | දීපංකර බුදුරජාණන් වහන්සේ | පළොල් |
| 5. | විපස්සි බුදුරජාණන් වහන්සේ | නෙල්ලි |
| 6. | කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ | සල් |
| 7. | වෙස්සභූ බුදුරජාණන් වහන්සේ | සල් |
| 8. | මංගල බුදුරජාණන් වහන්සේ | නා |
| 9. | සුමන බුදුරජාණන් වහන්සේ | නා |
| 10. | රේවත බුදුරජාණන් වහන්සේ | නා |
| 11. | සෝභිත බුදුරජාණන් වහන්සේ | නා |
| 12. | අනෝමදස්සි බුදුරජාණන් වහන්සේ | කුඹුක් |
| 13. | පියදස්සි බුදුරජාණන් වහන්සේ | රුක් |
| 14. | පදුම බුදුරජාණන් වහන්සේ | මුරුත |
| 15. | නාරද බුදුරජාණන් වහන්සේ | මුරුත |

16. පදුමුත්තර බුදුරජාණන් වහන්සේ හොර

17. සුමේධ බුදුරජාණන් වහන්සේ බක්මී

18. සුජාත බුදුරජාණන් වහන්සේ උණ

19. අත්ථදස්සි බුදුරජාණන් වහන්සේ සපු

20. ධම්මදස්සි බුදුරජාණන් වහන්සේ රත්කරවි

21. සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ කිනිහිරිය

22. තිස්ස බුදුරජාණන් වහන්සේ ගම්මාලු

23. ඵුස්ස බුදුරජාණන් වහන්සේ පළොල්

24. සිඛී බුදුරජාණන් වහන්සේ ඇටඹ

25. කකුසඳ බුදුරජාණන් වහන්සේ කිරිපලු

26. කෝණාගම බුදුරජාණන් වහන්සේ අත්තික්කා

27. කස්සප බුදුරජාණන් වහන්සේ නුග

28. ගෞතම බුදුරජාණන් වහන්සේ ඇසතු

සිඟාලෝවාද සූත්‍රය, බෞද්ධ දර්ශනයේ දිශා පිළිබඳ කරන සුවිශේෂීය විවරණයකි. අප බොහෝ විට සුභ කටයුතු අරඹනුයේ සුභ දිශාවකිනි. ජ්‍යොතිෂ්‍යයේදී එක් එක් දිශාවන් සඳහා සුභ නිමිති වෘක්ෂ මෙන්ම අසුභ නිමිති වන වෘක්ෂයන්ද සඳහන් වේ.

**දිශාවන්ට අයත් සුභ අසුභ වෘක්ෂ**

| දිශාව | සුභ | අසුභ |
|---|---|---|
| උතුර | පුලිල | අත්තික්කා |
| දකුණ | අත්තික්කා | පුලිල |
| නැගෙනහිර | නුග | බෝ |
| බස්නාහිර | බෝ | නුග |

මානව වංශ කතාවේ දුර අතීතයේ සිටම ග්‍රහ වස්තූන් සහ මිනිසා අතර පැවතියේ දැඩි බැඳීමකි. මඟ සොයාගැනීම, නාවික කටයුතු, කාලය මැනීම ආදියේ සිට ඇරඹි මෙම බැඳීම අද වනවිට මානව ක්‍රියාකාරීත්ව පාලනයේ ප්‍රබල හේතු කාරණාවක් බවට පත්ව ඇත. ජ්‍යොතිෂ්‍යයේ නවග්‍රහයන් ලෙස හඳුන්වන මෙම ග්‍රහවස්තු වල බලපෑම මිනිසා තුළ විවිධ ගති පැවතුම් ජනිත කරන බව විශ්වාස කෙරේ. අදාළ එක් එක් ග්‍රහයන් සඳහා ද ජ්‍යොතිෂ්‍යයේ විවිධ වෘක්ෂ වෙන්කර ඇත.

### නවග්‍රහයන්ට අදාළ වෘක්ෂ

| | | | | | |
|---|---|---|---|---|---|
| රවි | - | ඉඹුල් | චන්ද්‍ර | - | දිවුල් |
| කුජ | - | කොලොන් | බුධ | - | කොහොඹ |
| ගුරු | - | බෝ | සිකුරු | - | මඟුල් කරඳ |
| ශනි | - | නුග | රාහු | - | වැටකේ |
| කේතු | - | කෙසෙල් | | | |

තවමත් ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුළ ජ්‍යොතිෂ්‍යය සඳහා හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ජීවිතයේ වැදගත් කාර්යයන් සඳහා තම ග්‍රහචාරය විමසීම උස් පහත් බේදයක් නොමැතිව සමස්ථ සමාජය පුරාම පැතිර පවතින සාධකයකි.

අප සැවොම මෙලොව එළිය දකින වේලාවට අනුව සැකසෙන නැකතකි. මෙවැනි නැකැත් වර්ග 27ක් අපගේ ජ්‍යොතිෂ්‍යයේ සඳහන් වේ. මෙහි සැම නැකැතක් සඳහාම ඊට අදාළ වන වෘක්ෂයන්ද ජ්‍යොතිෂ්‍යයේ සඳහන් වේ.

### සත්විසි නැකැතට අයත් වෘක්ෂ

| | | | | | |
|---|---|---|---|---|---|
| අස්විද | - | ගොඩකඳුරු | බෙරණ | - | නෙල්ලි |
| කැති | - | අත්තික්කා | රෙහෙන | - | මාදන් |
| මුව සිරස | - | කලුවර | අද | - | කිහිර |
| පුනාවස | - | උණ | පුෂ | - | බෝ |
| අස්ලිය | - | දොඹ | මා | - | නුග |
| පුවපල් | - | කෑල | උතුරුපල් | - | ඇටිකෙහෙල් |
| හත | - | දිවුල් | සිත | - | බෙලි |
| සා | - | කුඹුක් | විසා | - | සපු |
| අනුර | - | මුනමල් | දෙට | - | වැටකේ |
| මූල | - | ඉඹුල් | පුවසල | - | හෝපලු |
| උතුරු සල | - | කොස් | සුවණ | - | වරා |
| දෙනට | - | සමදරා | සියාවස | - | කොළොං |
| පුව පුටුප | - | මී අඹ | උත පුටුය | - | කොහොඹ |
| රේවතී | - | මී | | | |

රුක් රෝපණය මෙම ආත්ම භවයේදී මෙන්ම මතු ආත්ම භවවල දී ද සුව විවරණය සඳහා ආදී මුතුන් මිත්තන් විසින් සිදුකරන ලද මහඟු සත් කාර්යයකි. ජ්‍යොතිෂ්‍යයේ මෙන්ම ආගමික පොතපතින්ද විවිධ රුක් වර්ග රෝපණය කිරීම විවිධ වූ ආනිසංස හිමිවන කාර්යයක් ලෙස දැක්වේ.

| | | |
|---|---|---|
| බෝ | - | සැප සම්පත් දියුණු වේ |
| අශෝක | - | දුක් දොම්නස් පහ වේ |
| කොහොඹ | - | දිවිය සැපවත් වේ |
| කෑල | - | ආරක්ෂාව ලැබේ |
| බෙලි | - | පින් රැස් වේ |
| පළොල් | - | සුගතිගාමී වේ |
| ඇට්ටේරිය | - | මතු භවය සැප ලබයි |
| දෑ සමන් | - | දෙව් සැප ලබයි |
| බුළු | - | මෙහෙකරුවන් ලබයි |
| මූනමල් | - | දැසි දසුන් ලබයි |
| වරා | - | සූර්යයාගේ පිහිට ලැබේ |
| දඹ | - | දෙව්ලොව සැප ලබයි |

ශාක සමඟ ඉතා සමීප ජීවිතයක් ගත කල මිනිසා එහි ප්‍රතිඵලයක් ලෙස ම ගස්වැල් සම්බන්ධව විවිධ මත මතාන්තර දැරීය. විවිධ ශාකයන් සම්බන්ධව මානව චින්තසන්තානයේ හටගැනුණු අදහස් පරම්පරා ගණනාවක් ඔස්සේ ප්‍රේරණය වෙමින් අද ද සාම්ප්‍රදායික ආකල්ප ලෙස රැඳී පැවතීම භාග්‍යයකි. මෙයින් ප්‍රධාන ස්ථානයක් දෙවියන් හා ශාක අතරට හිමිවේ.

- ශක්‍රයා සිය ආසනය 'පියනන්දන උයනේ' පිහිටි 'පරිජාත' නම් වෘක්ෂය මුල පිහිටුවාගෙන ඇත.
- සමන් දෙවිඳුන් 'රාජායතන' ගසින් බිහිවී ඇත.
- පත්තිනි දේව මෑණියන් 'අඹ' ගසකින් උපත ලබා ඇත.
- කතරගම දෙවියන් සිය දේවාලය කුඹුක් ගසක් යට පිහිටුවා ගත් බවත් පැවසේ.
- බෙලි ශාකය ශ්‍රියා කාන්තාවගේ ශාකය ලෙස පිළිගැනීමක් පවතින අතර බොහෝ විට නිවෙස් ඉදිරියේ රෝපණය කිරීම සුභ කටයුත්තක් ලෙසද දක්වයි.

- නිවස ඉදිරියේ අඹ ගස් වැවීම බෝවන රෝග තුරන් වීමටත්, අසුභ තත්ත්වයන් මගහැරෙන බවටත් විශ්වාසයක් පවතී.

- අන්කෙන්ද ගසක් ගෙවත්තක තිබේනම් එමගින් නිවැසියන්ට වා, පිත්, සෙම්, රෝග ඇති නොවන බවට විශ්වාසයක් ඇත.

- මයිල ගස් ඇති ස්ථානවල ජල උල්පත් ඇති බවට විශ්වාසයක් පවතී.

- දොඹ ශාකය නිවස අසල තිබීම වාසනාව උදාවන හේතුවක් ලෙස විශ්වාසයක් පවතී.

- රුක් අත්තන ශාක ඇතිවිට එම ප්‍රදේශයෙන් විෂකුරු සතුන් පලායන බවට මතයකි.

ජ්‍යොතිෂ්‍යය සම්බන්ධව ග්‍රන්ථ රැසක් පවතින අතර, ඒවායේ එකිනෙකට වෙනස් තොරතුරු සඳහන් වන බවද සලකනු මැනවි.

# සූචිය I

## පුද්ගලයන් අනුව

**ඩී.එස්. සේනානායක මැතිතුමා**
ඩී. එස්. සේනානායක මැතිතුමා රෝපණය කළ අඹ ගස
ඩී. එස්. සේනානායක මැතිතුමා රෝපණය කළ සියඹලා ගස

**ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා**
ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා රෝපණය කළ ඇහැළ ගස, ශ්‍රී පාලි විද්‍යාලය, හොරණ.
ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා රෝපණය කළ සුදු සඳුන් ගස

**සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය**
සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය රෝපණය කළ සුදු හඳුන් ගස,
නාවින්න ආයුර්වේද පර්යේෂණ ආයතනය.
සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය රෝපණය කළ කපුරු ශාකය

**හත්වන එඩ්වඩ් රජු**
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ කොස් ගස, හංවැල්ල.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ සියඹලා ගස, හංවැල්ල.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ සියඹලා ගස, උතුරු කරඳන.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ අඹ ගස, උතුරු කරඳන.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ කොස් ගස, උතුරු කරඳන.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ සල් ගස, උතුරු කරඳන.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ බෝ ගස, පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

**දෙවන එළිසෙබෙත් රැජින**
දෙවන එළිසෙබෙත් රැජින රෝපණය කළ ගොටු නුග ශාකය, පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය
දෙවන එළිසෙබෙත් රැජින රෝපණය කළ ලොස්සුඹුලු ශාකය, වික්ටෝරියා උද්‍යානය

**රොබට් නොක්ස් හා සම්බන්ධ ශාක**
මුතුර්හි නොක්ස් ගස (සියඹලා ගස)
රොබට් නොක්ස්ට සෙවන සැලසූ මී ගස, කලුවිල, අනුරාධපුර.

# සූචිය II

**ශාක විශේෂ අනුව**

**අඹ** - ඩී.එස්. සේනානායක මැතිතුමා රෝපණය කළ අඹ ගස, බම්බලපිටිය.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ අඹගස, උතුරු කරඳන.

**ඇහැළ** - නේපාලයේ මහේන්ද්‍ර බීරක්කම් රජු රෝපණය කළ ඇහැළ ගස
ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා රෝපණය කළ ඇහැළ ගස, පාලි විද්‍යාලය, හොරණ.

**උණ** - පෙතංගොඩ උණ පඳුර, පෙතංගොඩ, අවිස්සාවේල්ල.

**කොන්තාලම් ගස** - වැල්ලෙ දේවාලය, උනවටුන,ගාල්ල.

**මුට්ටි ගස** - පොල්අතුමෝදර,වැලිගම.

**කොස්** - හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ කොස් ගස, හංවැල්ල.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ කොස් ගස, උතුරු කරඳන.
පැණි වරකාව, අවිස්සාවේල්ල.
හඟුරන්කෙත විහාර භූමියේ කොස් ගස.

**කොහොඹ** - කොහොඹ ගස, තිස්සමහරාමය.

**ගම්මාලු** - ශ්‍රී නේරුතුමන් රෝපණය කළ ගම්මාලු ගස, නාවින්න ආයුර්වේද පර්යේෂණ ආයතනය.

**නා** - සිරි රහල් හිමියන්ට සෙවන සැලසූ නා ගස, කෝට්ටේ.
සපුමල් කුමරු සිහිගන්වන නා බෝධිය, කෝට්ටේ.
පත්තිනි සලඹ සැඟවූ නා ගස, කඩුවෙල.
පරකඩුවේ නා ගස, පරකඩුව, කුරුවිට.
සාර් රජු රෝපණය කළ නා ගස

**නිල් වෙරළු** - නිල් වෙරළු ගස, නාගරික උද්‍යානය, මාතලේ.

**නුග** - දෙණිපිටිය නුගරුක,දෙණිපිටිය, වැලිගම.

**පුස්වැල්** - කුරුළු කැලේ පුස්වැල
ඕපනායක පුස්වැල

**බැවොබාබ්** - බැවොබාබ් ගස, මන්නාරම.

**බෝ** - ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ, මහමෙව්නා උයන, අනුරාධපුර.
කළුතර බෝධීන්වහන්සේ, කළුතර.
නිට්ඨා බෝධිය, නිට්ටඹුව.
වීදියවත්ත සතර දේවාලයේ බෝධීන්වහන්සේ, යක්කල.
සුදු බෝධිය,මාකේව්ට,ගම්පහ.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ බෝගස

**මදාරා** - හබ්බේගමුව මදාරා ගස, සූරිය වැව.

**මාදං** - මහවැව මාදං ගස, මහවැව, මාදම්පේ.

**මාර** - ඒජන්ත මාර ගස, මඩුවන්වෙල, කොළොන්න.

**මහෝගනි** - අර්නස්ටෝ වේගුවේරා රෝපණය කළ මහෝගනී ගස, හොරණ.

**මී ගස** - රොබට් නොක්ස්ට සෙවන සැලසූ මී ගස, නාච්චාදූව, අනුරාධපුර.

**මහ මුගුණ්න** - සල්ගල, වරකාපොල.

**රට දෙල්** - කොටුව, ගාල්ල.

**උඩුවර මහගස** - (රිටි), උඩුවර, අඟුරුවාතොට.

**රුක්අත්තන** - ගැහැණුවෙල, පාදුක්ක.

**වල් බිලිං** - නාගරික උද්‍යානය, මාතලේ.

**දළදා සපුව** - හිදගල, මහනුවර.
ඉන්දීය ජනාධිපති රාජේන්ද්‍ර ප්‍රසාද් මැතිතුමා රෝපණය කළ සපු ගස

**සියඹලා** - ඩී. එස්. සේනානායක මැතිතුමා රෝපණය කළ සියඹලා ගස
නොක්ස් ගස (සියඹලා ගස), මුතූර්, ත්‍රිකුණාමලය.
රාජසිංහ රජු අල්ලාගත් ස්ථානයේ ඇති සියඹලා ගස, මැද මහනුවර.
පිළවල සියඹලා ගස, පිළවල, මැණික්හින්න.
මීගහජඳුර සියඹලා ගස, මීගහජඳුර, හම්බන්තොට.
ඔරුබැඳි සියඹලාව, ඇලහැර.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ සියඹලා ගස, හංවැල්ල.
හත්වන එඩ්වඩ් රජු රෝපණය කළ සියඹලා ගස, උතුරු කරඳන.
මහාකවි තාගෝර්තුමන් රෝපණය කළ සියඹලා ගස, හොරණ.

**සුදු සඳුන්** - ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා රෝපණය කළ සුදු සඳුන් ගස,
පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය.
සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය රෝපණය කළ සුදු සඳුන් ගස,
නාවින්න ආයුර්වේද පර්යේෂණ ආයතනය.

**සල්** - ජෝර්ජ් රජු රෝපණය කළ සල් ගස

**පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ රෝපණය කරන ලද ශාක.**

(පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ රෝපණය කර ඇති සමරු ශාක සියල්ලම පිළිබඳ ලැයිස්තුවක් මෙම ග්‍රන්ථයේ ඇතුලත්කර ඇති බැවින් මෙම සූචියේ දක්වා ඇත්තේ එයට ඇතුළත් කළයුතු ම යැයි හැඟුනු ශාක කීපයක් පමණි).

# තොරතුරු සැපයීමට සම්මාදම් වුවන්...

1. **ආචාර්ය සිරිල් විජේසුන්දර මහතා**
අධ්‍යක්ෂ, රාජකීය උද්භිද උද්‍යානය.
පේරාදෙණිය.

2. **සුනිල් සරත් පෙරේරා මහතා**
ප්‍රවීන ගීත රචක, මායා මාවත, කිරුළපන.

3. **ආචාර්ය පියල් මාරසිංහ මහතා**
කෘෂි විද්‍යාඥ,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

4. **සේනක ඔබේසේකර මහතා**
වතු අධිකාරී, වැවල වත්ත, කලටුවාව.

5. **නිහාල් පෙරේරා මහතා**
අංක 1/288, ආටිගල, හංවැල්ල.

6. **එන්. පී. වෙලගෙදර මහතා**
ගම්පහ බෙහෙත් ශාලාව, දෙල්ගම ලඟ,
ඕපනායක.

7. **පී. ඩබ්. ආරියරත්න මහතා**
නියෝජ්‍ය විදුහල්පති, ශ්‍රී පාලි විද්‍යාලය.
හොරණ.

8. **එන්. විජය කුමාර් මහතා**
කොටුව, ගාල්ල.

9. **ඩබ්. ආර්. කේ. දැලබණ්ඩාර මහතා**
අංක 707, නවගමුව, රනාල.

10. **එන්. සී. පෙරේරා මහතා**
කඩුවෙල පාර, මාලඹේ.

11. **අලුත් නුවර අනුරුද්ධ හිමි**
කෝට්ටේ රාජමහා විහාරාධිපති,
රජමහා විහාරය, කොට්ටේ.

12. **අරුණ ප්‍රදීප් සේනාරත්න මහතා**
ජයවර්ධන බාලිකා විද්‍යාලය, මීෂන් පාර,
කෝට්ටේ.

13. **එම්. එන්. අජිත් මහතා මහතා**
අංක 40, ජා ඇල පාර, මාකේවිට.

14. **ශ්‍රු. විඩින් සිල්වා මහතා**
උඩුවර, අගුරුවාතොට, හොරණ.

15. **එස්. ප්‍රදීප් මනහර මහතා**
වතු අධිකාරී, යහලකැලේ වත්ත, මිල්ලෑව,
හොරණ.

16. **පියසේන අමරතුංග මහතා**
අංක 563, ගැහැණුවෙල, මීගොඩ.

17. **රණතුංග හේරත් මහතා**
කලුවිල, හිදෝගම.

18. **පී. ඒ. ආර්. කේ. ගම්ලත් මිය**
ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී
මධ්‍යම පරිසර අධිකාරිය (පළාත කාර්යාලය)
අනුරාධපුර.

19. **ටී. එම්. ගුණතිලක බංඩා මහතා**
සහකාර ග්‍රන්ථ ප්‍රකාශණ කොමසාරිස්
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

20. **දුමින්ද සංජීව බාලසූරිය මහතා**
මාධ්‍යවේදී
වනජීවී සහ පාරිසරික තොරතුරු
මධ්‍යස්ථානය, කොට්ටාව, පන්නිපිටිය.

21. **ප්‍රියන්තා රෝහිනී කුමාරි මෙනවිය**
කළමනාකාර සේවා සහකාර
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය.

22. **රුචිර ශ්‍යාමන්ත ගුණතිලක මහතා**
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

# තොරතුරු මූලාශ්‍ර


**අසිරිමත් උඩවලව**, ලාල් නිශාන්ත හෙට්ටිආරච්චි
කළුතර බෝධි විහාරය, දිවාකර මොහොට්ටි, කල්පනා, 1984 ඔක්තෝබර් 12-13 පිටු

**මහවැලි පී කලාපය**, ඩබ්ලිව්. ඒ. ජයසිංහ
ඉසුර, 1987 මැයි 26-28 පිටු

**ලක්බිමේ සත් වසක්**, ප්‍රේමචන්ද්‍ර අල්විස්

**පිලවල ඓතිහාසික සියඹලා ගස**, එස්. කේ. ජයවර්ධන
දියදම 2000 නොවැම්බර් 24 පිටු

**ඔසුතුරු විසිතුරු ලිත 2000 - 2001**
ඖෂධ පැළෑටි සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ ව්‍යාපෘතිය

**ආදම්ගේ පාලම දිගේ**, ශාන්ත කුමාර විතාන
ලංකාදීප සැදැල්ල අතිරේකය, 2002 අගෝස්තු 04, 11 පිටුව

**පුංචි එංගලන්තයේ සුද්දන්ගෙ වල්වැදුනු සොහොන් බිම්**, ෂෙල්ටන් හෙට්ටිච්චි
ලංකාදීප සැදැල්ල අතිරේකය, 1999 අප්‍රේල් 18, 20 පිටුව

**ගාලු පුරේ අභාවයට යන ලෝක උරුමය**, ගාමිණී මහදුර සහ ජේ. ජයවර්ධන
ලංකාදීප සැදැල්ල අතිරේකය, 1999 අප්‍රේල් 11, 8-9 පිටුව

**දම් කද පහස ලත් දළදා හාමුදුරුවෝ**, නිව්ටන් ගුණසේකර
දළදා වරුණ, පිටුව 3

**එදිරිල්ලේ කිරුළ සැඟවූ උඩුවර මහ ගස**, ශාන්ත කුමාර විතාන
ඉරිදා ලංකාදීප - විශේෂාංග, 1999 මාර්තු 28, 02 පිටුව

**රන් වැටකින් ආරක්ෂාව ලබන ලෝකයේ ඇති එකම වෘක්ෂය,
ජය ශ්‍රී මහා බෝ හාමුදුරුවෝයි**, මිහිරි ෆොන්සේකා
ලක්බිම 2003 මැයි 11, 32 පිටුව

**රොබට් නොක්ස් ගේ එදා හෙළ දිව**, ඩේවිඩ් කරුණාරත්න
1997, ISBN-955-21-0223-5

**වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පනත**, 1937 අංක 47

**The status of the baobab (Adansonia digitata L) in Mannar Island, Sri Lanka, Rajnish vandercone,** T.M. Saajithran, S.Wijeyamohan and Charles Santiapillai
Current Science, Vol. 87, 12,25 December 2004.

**Wikipedia the free encyclopedia.** (www.wikipedia.com)

# පසු වදන

සුප්‍රකට අය විසින් සුවිශේෂී අවස්ථාවන්හි ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානයන්හි සිටුවන ලද වටිනා ගස් වර්ග පිළිබඳව පොතක් පිළියෙල කිරීමට අදහස් කර ඇති බව ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ අනුරුද්ධ තෙන්නකෝන් මහතා කලකට ඉහතදී පැවසූවිට මා ඉමහත් සතුටකට පත්වූනෙමි. මෙයට එක් ප්‍රධාන හේතුවක් වන්නේ මාගේ දැනීමේ හැටියට මෙවැනි පොතක් මීට කලින් කිසිවෙකු ලියා නැති වීමයි.

මෙවැනි කෘතියක් පරිශීලනය කිරීමෙන් අදාල ගස් සිටවූ කාලය හා සිටුවීමට පාදක වූ සිද්ධීන් ආශ්‍රිත ඓතිහාසික තොරතුරු මෙන්ම විවිධ ශාකයන් ගැන කිසියම් අවබෝධයක් ලබාගැනීමට ද ජනතා පෙළඹවීමක් ඇතිවනු ඇතැයි මා අදහස් කරමි.

ගස් සිටුවීම පිළිබඳව ශ්‍රී ලංකාව තරම් කීර්තිමත් ඉතිහාසයක් ඇති රටක් ලොව තවත් නොමැති තරම්ය. ගස් සිටුවීම කොතෙක් සිදුවූවත් ගස් රැක බලා ගැනීම ගැන නම් අප රටේ එතරම් අවධානයක් නොමැති බව පෙනේ. ඉමහත් ප්‍රසිද්ධියකින් යුක්තව උත්සවාකාරයෙන් සිටුවන බොහෝ ගස් වලට අවසානයේදී සිදුවන්නේ කුමක්ද යන්න ගැන අවධානය යොමුකර ඇත්තේ සුළු දෙනෙකි. එවන් අවධියක වැදගත් අවස්ථාවන් සැමරීම පිණිස විවිධ පුද්ගලයන් විසින් සිටුවා ඇති සංස්කෘතික හෝ ආගමික වටිනාකමකින් යුත් සුවිශේෂී ගස් උවද අනවධානයට පාත්‍ර වීම තුලින් විනාශවී යාමට බොහෝ ඉඩකඩ ඇත. එසේ වී ඇති අවස්ථාද විරල නොවේ. දිවයිනේ විවිධ අප්‍රකට ස්ථානයන්හි ඇති බෝහෝ දෙනෙකු නොදන්නා, මෙවන් වටිනා ශාක මෙම ග්‍රන්ථය හේතු කොට ගෙන ජනතා අවධානයට ලක්වීම තුලින් ආරක්ෂා වනු ඇතැයි ප්‍රාර්ථනය කරමු.

දිවයින පුරා සංචාරය කොට සුවිශේෂීය ගස් සිටුවා ඇති තැන් වලින් හා විවිධ මූලාශ්‍රවලින් වැදගත් තොරතුරු එකතුකර ඉමහත් වෙහෙසක් දරා මෙවන් කෘතියක් පලකිරීම ගැන අනුරුද්ධ තෙන්නකෝන් මහතාට සහ අජිත් සිල්වා මහතාට ගස් වැල්වලට සහ පරිසරයට ආදරය කරන සියලු දෙනාගේම ප්‍රණාමය හිමි වනු ඇත.

ආචාර්ය සිරිල් විජේසුන්දර
අධ්‍යක්ෂ ජෙනරාල්
උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව